# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

# இலங்கை வயம்ப பல்கலைக்கழகம்

# WAYAMBA UNIVERSITY OF SRI LANKA

# වාර්ෂික වාර්තාව හා ගිණුම්

# ஆண்டறிக்கையும் கணக்கும்

# ANNUAL REPORT & ACCOUNTS

**2011**

# පටුන


**පිටු අංකය**

**දැක්ම** **01**

**මෙහෙවර** **01**

1 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ අරමුණු 02

2 විශ්වවිද්‍යාලයේ නිලධාරීන් 03

3 පාලක සභාවේ සාමාජිකයින් 04

4 උපකුලපතිගේ සටහන 05

5 සම්පත් සහ සිසුන් සම්බන්ධ විස්තර - 2011 07

6 අභ්‍යන්තරව බඳවා ගන්නා ලද සිසුන්ගේ විස්තර - 2011 08

7 2011 වසරේ වයඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ විස්තර 09

8 ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර – 2011 14

9 2011 වසරේදී විශ්වවිද්‍යාලය මඟින් පවත්වන ලද බාහිර පාඨමාලා පිළිබඳ විස්තර 15

10 2011.12.31 දින වන විට අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලයේ විස්තර 16

11 2011.12.31 දින වන විට අනධ්‍යයන කාර්යය මණ්ඩල විස්තර 18

12 පුස්තකාලය 20

13 උපාධි අපේක්ෂකයන් සඳහා නේවාසිකාගාර පහසුකම් - 2011 23

14 මහපොළ සහ ශිෂ්‍යාධාර ලාභීන් - 2011 25

15 පර්යේෂණ, නව සොයා ගැනීම් හා ප්‍රකාශන 26

16 2011 වසරේදී අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද පශ්චාත් උපාධි 28

17 ලැබී ඇති ප්‍රදානයන් පිළිබඳ විස්තර 30

18 ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව 31

19 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 35

20 තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය කුලියාපිටිය පරිශ්‍රය 37

21 තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මාකඳුර පරිශ්‍රය 39

22 ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය 41

23 ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය 43

24 වෛද්‍ය මධ්‍යස්ථානය 45

25 පුනරාවර්තන වියදම් විස්තර 46

26 මූලධන වියදම් විස්තර 46

27 මූල්‍ය ප්‍රගතියේ විස්තර (වියදම්) 46

28 මූල්‍ය ප්‍රගතියේ විස්තර (උපයන ලද ආදායම්) 47

29 මූල්‍ය ප්‍රගති සමාලෝචනය – 2011 47

30 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය අරමුදල්) 48

31 ව්‍යාපෘතිවල වියදම් පිළිබඳ විස්තර (දේශීය අරමුදල්) 49

32 2011 වර්ෂයේදී යටිතල පහසුකම් ලැබීම් පිළිබඳ විස්තර 50

**2011 වර්ෂයේ ගිණුම් ප්‍රකාශය 51**

**2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන පිළිබඳ ව්‍යවස්ථාපිත වාර්තාව 59**

## *දැක්ම*

*"ශ්‍රී ලංකා උසස් අධ්‍යාපනයේ*
*විශිෂ්ඨතම මධ්‍යස්ථානය බවට*
*පත්කිරීම"*

## *මෙහෙවර*

"නව්‍යකරණ අධ්‍යාපන පාඨමාලා,
පර්යේෂණ සහ බාහිර ක්‍රියාකාරකම්
මඟින් ජාතික සංවර්ධනයට
ගැලපෙන පරිදි මානව සම්පත්
වැඩිදියුණු කිරීම"

## 1. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ අරමුණු

*1.) උපාධිපාඨමාලාවල ගුණාත්මකභාවය වැඩිකිරීම.*

*2.) රටේ උසස් අධ්‍යාපනයේ වර්ධන වේගයට සරිලන පරිදි ශිෂ්‍ය බඳවා ගැනීම් වැඩිකිරීම.*

*3.) උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය වැඩි කිරීම.*

*4.) සේවාවල සඵලතාවය සහ සම්පත් භාවිතයේ කාර්යාක්ෂමතාවයේ ප්‍රමාණය වැඩි කිරීම තුළින් සමස්ත ඵලදායිතාවය වැඩි කිරීම.*

*5.) උපරිම ලෙස සම්පත් ලබා ගැනීම සහ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ස්ථාවරත්වය පවත්වාගෙනයාම.*

*6.) ඉහළ ගුණත්වයෙන් යුක්ත වැඩ කිරීමේ පරිසරයක් මඟින් ශිෂ්‍ය හා කාර්යය මණ්ඩල අතර ජනවාර්ගික ඒකාබද්ධතාවය වර්ධනය කර විශ්වවිද්‍යාල ප්‍රජාවේ තත්වය තවදුරටත් ගොඩනැගීම.*

# 2. විශ්වවිද්‍යාලයේ නිලධාරීන්

**කුලපති**

මහාචාර්ය සී. එල්. වී. ජයතිලක මහතා

**උපකුලපති**

මහාචාර්ය ඒ. එන්. එෆ්. පෙරේරා මහතා, *බී.එස්.සී (කෘෂිකර්මය) (පේරාදෙණිය), එම්.එස්.සී (ඇ.එ.ජ), පී.එච්.ඩී (ඇ.එ.ජ)*

**පීඨවල පීඨාධිපතිවරු**

**කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨය**

මහාචාර්ය ඩී. පී. එස්. ටී. ජී. අත්තනායක මහතා, *බී.එස්.සී (කෘෂිකර්මය) (පේරදෙණිය), එම්.එස්.සී., පී.එච්.ඩී (බර්මිංහැම්)*

**ව්‍යවහාරික විද්‍යා පීඨය**

ආචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා, *බී.එස්.සී. (කැලණිය), එම්.එස්.සී., ඩී.එස්.සී. (ජපානය)*

**ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

මහාචාර්ය ඊ. එස්. වික්‍රමසිංහ මහතා, *බී.ඒ. (කොළඹ), එම්. කොම්. (කැලණිය),*

*පශ්චාත් උපාධි ඩිප්ලෝමා (කොළඹ)*

**පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

ආචාර්ය කේ. ඩී. ආර්. ආර්. සිල්වා මහතා, *බී.එස්.සී (කෘෂිකර්මය) (පේරදෙණිය), පී.එච්.ඩී (එක්සත් රාජධානිය)*

**ලේඛකාධිකාරී**

ඊ. එම්. ගාමිණී ඒකනායක මහතා, *බී.ඒ.(විශේෂ) (පේරදෙණිය), කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (විවෘත විශ්වවිද්‍යාලය), මානව සම්පත් කළමණාකරන සහතිකය (හසිඩ්‍රාබාද්),එම් බී ඒ (ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය)*

**මූල්‍යාධිකාරී**

ඩී. ඒ. යූ. ධර්මදාස මහතා, *බී.එස්.සී (කැලණිය), ඒ සී ඒ., ඒ එස් සී එම් ඒ*

**පුස්තකාලයාධිපති**

ඩබ්ලිව්. ජී. පී. ගම්ලත් මහතා, *බී.ඒ. (පේරදෙණිය), බී එල් එස් (ඉන්දියාව), එම් එල් එස් (ඉන්දියාව)*

## 3. පාලක සභාවේ සාමාජිකයින්

**උපකුලපති**

මහාචාර්ය ඒ. එන්. එෆ්. පෙරේරා මහතා

**පීඨවල පීඨාධිපතිවරු**

| | |
|---|---|
| කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨය | - මහාචාර්ය ඩී. පී. එස්. ටී. ජී. අත්තනායක මහතා |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | - ආචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | - මහාචාර්ය ඊ. එස්. වික්‍රමසිංහ මහතා |
| පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය | - ආචාර්ය කේ. ඩී. ආර්. ආර්. සිල්වා මහතා |

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් පත් කරන ලද සාමාජිකයෝ**

ආචාර්ය ඩබ්ලිව්. ඒ. අබේසිංහ මහතා

ඒ. ඒ. ජිනදාස මහතා

ජේ. එච්. ආර්. කරුණාරත්න මහතා

එම්. ඒ. බන්දුලසේන මහතා – 2011.08.31 දක්වා

එම්. ආර්. ධර්මසේන බණ්ඩා මහතා – 2011.08.31 දක්වා

ටී. එම්. සී. ටී. මල්විල මහතා – 2011.08.31 දක්වා

ඩබ්ලිව්. සේනානායක මිය – 2011.08.31 දක්වා

ජේ. එම්. ගුණතිලක මහතා - 2011.09.01 සිට

එෆ්. ප්‍රීති පෙරේරා මහතා - 2011.09.01 සිට

ආර්. පී. එල්. වීරසිංහ මහතා - 2011.09.01 සිට

නාරද එදිරිසිංහ මහතා - 2011.09.01 සිට

ආර්. එම්. වන්නිනායක මහතා – 2011.12.02 සිට

**සනාතන සභාව මඟින් පත් කරන ලද සාමාජිකයෝ**

ආචාර්ය කේ. ඩී. ඩී. එන්. දිසානායක මහතා

ආචාර්ය ඩබ්ලිව්. ජේ. එස්. කේ. වීරක්කොඩි මහතා

**ලේඛකාධිකාරී (ලේකම්)**

ඊ. එම්. ගාමිණී ඒකනායක මහතා

# 4. උපකුලපතිගේ සටහන

## 4.1 හැඳින්වීම

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය 1999 වසරේදී 13වන විශ්වවිද්‍යාලය වශයෙන් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ස්ථාපිත වූ අතර යටිතල පහසුකම්, කාර්යය මණ්ඩලය, ඉඩම්, නේවාසික පහසුකම් යන ක්ෂේත්‍රවල සීමාකම්වලට යටත්ව පවත්වාගෙන යනු ලැබේ. කෙසේ වෙතත් වසර 11 සම්පූර්ණවන විට දී කාර්යය මණ්ඩලයට සහ සිසුන්ට තම අවශ්‍යතාවයන් සැහෙන ප්‍රමාණයකට ලබා දීමට හැකියාවක් ලැබී ඇත. එමෙන්ම 2010 වසරේදී ආරම්භ කල ව්‍යාපෘතිවල විශාල ප්‍රමාණයක් 2011 වසරේදී සම්පූර්ණ කර ගැනීමට හැකි වී ඇත.

2010/2011 අධ්‍යයන වර්ෂයේ දී පීඨ හතරක් සඳහා ලියාපදිංචි වූ මුළු නවක සිසුන් සංඛ්‍යාව 707ක් වූ අතර කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය සඳහා සිසුන් 112ක් ද, ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා 137ක් ද, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය සඳහා 348ක් ද සහ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය සඳහා 110ක් ද වශයෙනි. ඒ අනුව කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයේ සිසුන්ගේ මුළු සංඛ්‍යාව 393ක් ද, ව්‍යවහාරික විද්‍යා පීඨයේ මුළු සිසුන් 379ක් ද, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ මුළු සිසුන් සංඛ්‍යාව 1083ක් ද සහ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ 323ක් ද වශයෙනි. එවිට විශ්වවිද්‍යාල සිසුන්ගේ මුළු එකතුව 2178ක් විය.

2011 වසරේ උපාධි ප්‍රදානෝත්සවය 2012 වසරේ මාර්තු මස පැවැත් වූ අතර එහිදී සිසුන් 337ක් සිය ප්‍රථම උපාධිය ලබා ගත් අතර 27 දෙනෙකු සිය පශ්චාත් උපාධිය ලබා ගත්හ. මෙම ප්‍රථම උපාධි ලබා ගත් පිරිස අතර කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය මඟින් පවත්වන ලද වැවිළි කළමනාකරණය පිළිබඳ (බාහිර) උපාධි පාඨමාලාවේ 2වන කණ්ඩායමේ ප්‍රථම උපාධිධාරීන් ද ඇතුලත් වී ඇත.

.

## 4.2 2011 වසරේදී නිම කරන ලද කාර්යයන්

2011 වසරේදී 2010-2015 සංයුක්ත සැලැස්මට 2011-2015 ක්‍රියාකාරී සැලැස්ම ද ඇතුළත් කර සංශෝධනය කරන ලදි.

මෙම වසර ඇතුලත ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ පීඨ සංකීර්ණ ගොඩනැගිල්ලේ පළමු අදියර ආරම්භ කරන ලදි. තට්ටු හතරකින් සමන්විත මෙම ගොඩනැගිල්ල 2012 වසරේදී අවසන් කිරීමට නියමිතය. මෙම ගොඩනැගිල්ල සිසුන් 500 කට පමණ එකවර දේශන පහසුකම් සැලැස්විය හැකි දේශන ශාලා දෙකකින් සමන්විතය. එමෙන්ම කුඩා සිසුන් කණ්ඩායම් සඳහා දේශන ශාලා පහසුකම් සැපයිය හැකි කුඩා කාමර ද අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා කාමර පහසුකම් ද ඇත. ගොඩනැගිල්ලේ පහත මාලයේ වාහන නවතා තැබීම සඳහා ද ආපන ශාලා සඳහා ද පහසුකම් සපයා ඇත.

2011 අගෝස්තු 31 දින උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු එස් බී දිසානායක මැතිතුමා විසින් කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ නව පීඨ සංකීර්ණයේ පළමු අදියර විවෘත කරන ලදි. මෙම ගොඩනැගිල්ල තුළ පීඨාධිපති කාර්යාලය, සහකාර ලේඛකාධිකාරී කාර්යාලය, පීඨ කාර්යාලය, අධ්‍යයන අංශප්‍රධාන

කාර්යාල, මහාචාර්ය සහ අනෙකුත් අධ්‍යයන කාර්යය මණ්ඩල කාමර පහසුකම්, දේශන ශාලා, සම්මන්ත්‍රණ කාමර මෙන්ම විද්‍යාගාර පහසුකම්ද සපයා ඇත.

ගරු උසස් අධ්‍යාපන ඇමති තුමා විසින් 2011 වසරේ මාකඳුර පරිශ්‍රයේ නව වෛද්‍ය මධ්‍යස්ථානය ද විවෘත කළ අතර කුලියාපිටිය හා මාකඳුර අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා නව නේවාසිකාගාර දෙකක් සඳහා ද, මාකඳුර පරිශ්‍රයේ නව ප්‍රවේශ මාර්ගය සඳහා ද මුල් ගල් තබන ලදි.

විශ්වවිද්‍යාල සංවර්ධන ආධාර යෝජනා ක්‍රමය යටතේ ඉදිරිපත් කරන ව්‍යාපෘති යෝජනා සඳහා ආධාර ලබා දීමට 21වන සියවස් උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය එකඟ වූ අතර ඒ අනුව කෘෂිකර්ම හා වැවිළි කළමනාකරන පීඨය මඟින් ඉදිරිපත් කරන ලද බාහිර උපාධි ඒකකය දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 10ක් ලබා දෙන ලදි.

"21 වන සියවස් උසස් අධ්‍යාපන" ව්‍යාපෘතිය යටතේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කරන ලද සමීක්ෂණයේදී 2011 වසරේදී වයඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගේ සේවා නියුක්ත මට්ටමේ සාමාන්‍ය අගය 90% කි. මේ තත්ත්වය වයඹ විශ්වවිද්‍යාලයේ සාර්ථක ජයග්‍රහනයකි. මෙයින් අදහස් වන්නේ වයඹ විශ්වවිද්‍යාලයේ උපාධි පාඨමාලා සේවා යෝජකයින් විසින් පිළිගන්නා බවයි.

මෙම වසරේදී පීඨාධිපතිවරුන් සඳහා වාහන හතරක් ද මිල දී ගෙන ඇත.

2011 වසරේදී කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ නැනෝ තාක්ෂණ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා අක්කර 1.05ක පමණ ඉඩමක් වයික්කාල ප්‍රදේශයෙන් ලබා දී ඇත.

## 4.3 අසමත්වීම් හා ඊට හේතු

විශ්වවිද්‍යාලය මුහුණ පා ඇති දුෂ්කරතාවයවන්නේ විශ්වවිද්‍යාලය ප්‍රසාරණය සඳහා ඉඩම් ලබා ගැනීමයි. මාකඳුර පොල් පර්යේෂණ ආයතනයේ අක්කර 5ක් ලබා දීම සඳහා එකඟතාවය පලකර ඇතත් ඉඩම ලබා දීම සඳහා තවමත් ප්‍රගතිය පෙන්නුම් කර නැති අතර මෙම අවස්ථාව වන විටත් සාකච්ජා මට්ටමේ පවතී.

2011 වසරේදී නව උපාධි පාඨමාලා හෝ වෙනත් පශ්චාත් උපාධි පාඨමාලා හඳුන්වා දීමට නොහැකි විය.

## 4.4 අනාගත සැලසුම්

ව්‍යවහාරික විද්‍යා පීඨයේ විශේෂ උපාධි පාඨමාලා ආරම්භ කිරීම සඳහා සලකා බලමින් පවතී. උපාධි අපේක්ෂකයින්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා අවශ්‍යතන්හි පාඨමාලා සංශෝධනය කිරීමට සියලුම පීඨ වලට යෝජනා කර ඇත. එමෙන්ම විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ක්‍රියාකාරකම්, පර්යේෂණ, සහභාගීත්ව ක්‍රියාකාරකම් සියල්ල ද තවදුරටත් ප්‍රසාරණය කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, මූලික සැලැස්ම (Master Plan) සම්පූර්ණ කර ඇති අතර ඒ අනුව ඉදිරි ක්‍රියාකාරකම් කිරීමට නියමිතය. එමෙන්ම විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය සඳහා සැලසුම් කොට ඇති අතර කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයේ පීඨ සංකීර්ණයේ දෙවන අදියරේ පළමු කොටස ද, ව්‍යවහාරික විද්‍යා සහ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨ සංකීර්ණවල අවසන් අදියර ද, පරිශ්‍ර දෙකෙහි නේවාසිකාගාර දෙකක් ඉදිකිරීම සඳහා ද සැලසුම් කොට ඇත.

## 5. සම්පත් සහ සිසුන් සම්බන්ධ විස්තර - 2011

| පීඨය | පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය | අනධ්‍යයන කාර්යය මණ්ඩලය |
|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 393 | 25 | 34 |
| ව්‍යවහාරික විද්‍යා | විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය/බද්ධ ප්‍රධාන විෂය) | 379 | 34 | 24 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | විද්‍යාවේදී බැංකු හා මූල්‍ය (විශේෂ) උපාධිය | 1083 | 20 | 12 |
| | විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ (විශේෂ) උපාධිය | | | |
| | විද්‍යාවේදී රක්ෂණ හා තක්සේරුකරන (විශේෂ) උපාධිය | | | |
| | විද්‍යාවේදී ගිණුම් හා ව්‍යාපාර මූල්‍ය (විශේෂ) උපාධිය | | | |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 218 | 25 | 30 |
| | ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 105 | | |
| **එකතුව** | | **2178** | **104** | **100** |

2011 වසර තුළ විශ්වවිද්‍යාලයේ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 2178ක් වූ අතර අධ්‍යයන කාර්යය මණ්ඩලය 104කි. පීඨ හතරකින් ප්‍රථම උපාධි 8ක් ප්‍රදානය කරනු ලැබේ. පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය මඟින් නව උපාධි පාඨමාලාවක් හඳුන්වා දී ඇති අතර පසුගිය වසරවලට සාපේක්ෂව බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාවේ වැඩිවීමක් දක්නට ලැබේ.

## 6. අභ්‍යන්තරව බඳවා ගන්නා ලද සිසුන්ගේ විස්තර - 2011

| පීඨය | පාඨමාලාව | මාධ්‍ය | 2011 බඳවා ගැනීම් | පළමු වසර ශිෂ්‍ය සංඛ්‍යාව | දෙවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | තුන්වන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | හතරවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ඉංග්‍රීසි | 110 | 112 | 107 | 91 | 83 | 75 |
| ව්‍යවහාරික විද්‍යා | විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය/බද්ධ ප්‍රධාන විෂය) | ඉංග්‍රීසි | 150 | 137 | 98 | 100 | 44 | 65 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | විද්‍යාවේදී බැංකු හා මූල්‍ය (විශේෂ) උපාධිය | ඉංග්‍රීසි | 350 | 348 | 298 | 220 | 217 | 13 |
| | විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ (විශේෂ) උපාධිය | ඉංග්‍රීසි | | | | | | 41 |
| | විද්‍යාවේදී රක්ෂණ හා තක්සේරුකරන (විශේෂ) උපාධිය | ඉංග්‍රීසි | | | | | | 22 |
| | විද්‍යාවේදී ගිණුම් හා ව්‍යාපාර මූල්‍ය (විශේෂ) උපාධිය | ඉංග්‍රීසි | | | | | | 46 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ඉංග්‍රීසි | 100 | 70 | 53 | 41 | 54 | 54 |
| | ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ඉංග්‍රීසි | 60 | 40 | 34 | 31 | - | - |
| **එකතුව** | | | **770** | **707** | **590** | **483** | **398** | **316** |

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පළමු වසර සිට අවසන් වසර දක්වා සිසුන්ට උපාධි පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. සිසුන් 316ක් 2011 වසරේදී උපාධි පාඨමාලා සම්පූර්ණ කරන ලද අතර ඔවුන් 2012 මාර්තු මස දී පැවැත්වූ උපාධි ප්‍රධානෝත්සවයේදී උපාධි ලබා ගත්හ.

## 7. 2011 වසරේ වයඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ විස්තර

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ බාහිර කටයුතු (External Affairs) ඒකකය මඟින් සිසුන්ට ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීමෙන් පසු පහත තොරතුරු ලබා ගන්නා ලදි. උපාධිධාරීන් 98% ක් එයට ප්‍රතිචාර දක්වා ඇති අතර 2012 පෙබරවාරි මස වන විට ඔවුන්ගේ සේවා නියුක්ති තත්ත්වයන් පහත දක්වා ඇත.
මෙම බාහිර ඒකකයේ එක් අරමුණක් වන්නේ විශ්වවිද්‍යාලයත් බාහිර ප්‍රජාවත් අතර සම්බන්ධතාවය වර්ධනය කිරීමය. මෙම සම්බන්ධතාවය මඟින් මෙම විශ්වවිද්‍යාලයෙන් උපාධි ලබා ඉවත්ව ගිය සිසුන් තම සේවා ස්ථානවල ඔවුන්ගේ කාර්යය සාධනය, ඔවුන්ගේ සේවා තත්ත්වය, ලබාගන්නා වැටුප් මට්ටම්, ඔවුන් ලබා ගත් උපාධි ඔවුන්ගේ සේවාව සමඟ කොතෙක් දුරට සම්බන්ධතාවයක් පවතීද යන්න හා විශ්වවිද්‍යාලයෙන් ඉවත්ව ගිය පසු ලබා ගත් අතිරේක සුදුසුකම් මොනවාද යන්න විස්තර ලබා ගෙන ඇත.

### 7.1 කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨය

| අධ්‍යයන අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත | එකතුව |
|---|---|---|---|---|---|
| වැවිළි කළමනාකරන | 3 | 12 | - | 7 | **22** |
| උද්‍යාන විද්‍යා හා භූමි අලංකරණ | 3 | 3 | 1 | 5 | **12** |
| ජෛව තාක්ෂණ | 7 | 4 | - | 5 | **16** |
| කෘෂිව්‍යාපාර කළමනාකරණ | 6 | 12 | - | 5 | **23** |
| **එකතුව** | **19** | **31** | **1** | **22** | **73** |

| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත |
|---|---|---|---|
| 26.03% | 42.47% | 1.37% | 30.14% |




### 7.2 ව්‍යවහාරික විද්‍යා පීඨය

| අධ්‍යයන අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත | එකතුව |
|---|---|---|---|---|---|
| කර්මාන්ත කළමනාකරණ | 16 | 4 | 2 | - | **22** |
| ගණිතමය විද්‍යා | 7 | 7 | - | 2 | **16** |
| ඉලෙක්ට්‍රොනික විද්‍යා | 6 | 2 | 1 | 2 | **11** |
| පරිගණක හා තොරතුරු පද්ධති | 7 | 4 | 1 | - | **12** |
| **එකතුව** | **36** | **17** | **4** | **4** | **61** |

| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත |
|---|---|---|---|
| 59.02% | 27.87% | 6.56% | 6.56% |




**7.3** ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| අධ්‍යයන අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත | එකතුව |
|---|---|---|---|---|---|
| ව්‍යාපාර කළමනාකරණ | 18 | 9 | 2 | 7 | **36** |
| ගණකාධිකරන | 20 | 14 | 1 | 9 | **44** |
| බැංකු හා මූල්‍ය | 5 | 3 | - | 2 | **10** |
| රක්ෂණ හා තක්සේරුකරන | 15 | - | 1 | 1 | **17** |
| **එකතුව** | **58** | **26** | **4** | **19** | **107** |

| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත |
|---|---|---|---|
| 54.21% | 24.30% | 3.74% | 17.76% |




### 7.4 පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

| අධ්‍යයන අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත | එකතුව |
|---|---|---|---|---|---|
| ජල ජීවීවගා හා මත්ස්‍ය | 7 | 5 | - | - | **12** |
| පශුසම්පත් හා පක්ෂි විද්‍යා | 7 | 3 | 1 | 2 | **13** |
| ආහාර විද්‍යා හා තාක්ෂණ | 6 | 6 | - | 1 | **13** |
| ව්‍යවහාරික පෝෂණ | 5 | 10 | - | - | **15** |
| **එකතුව** | **25** | **24** | **1** | **3** | **53** |

| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත |
|---|---|---|---|
| 47.17% | 45.28% | 1.89% | 5.66% |




HETC ව්‍යාපෘතිය හරහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පසුව කරන ලද වෙනත් සමීක්ෂණයක දී සෑම පීඨයකම උපාධිධාරීන්ගේ ඉහළ සේවා නියුක්තියක් පෙන්නුම් කරන බව පෙනිනි. එම තොරතුරු පහත වගුවේ සාරාංශගත කර ඇත. තවද විශ්වවිද්‍යාලයේ සමස්ථ සේවා නියුක්තිය 90%ක වන අතර සේවා වියුක්තිය 10%ක් වේ.

| පීඨය | සේවානියුක්ත (%) | ඌනසේවානියුක්ත (%) | සේවාවියුක්ත(%) |
|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ (FAPM) | 73.0 | 4.1 | 22.9 |
| ව්‍යවහාරික විද්‍යා (FAS) | 93.8 | 6.2 | 0 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය (FBSF) | 77.0 | 10.6 | 12.4 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ (FLFN) | 88.6 | 6.7 | 4.7 |
| **එකතුව** | **83.1** | **6.9** | **10.0** |




## 8. ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර – 2011

| පීඨය | පාඨමාලාව | මාධ්‍ය | සහතිකපත්‍ර | ඩිප්ලෝමා | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | පරිපාලන පති | දර්ශනපති | දර්ශනසූරි |
|---|---|---|---|---|---|---|---|---|
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | මාළුන්ට ලබා දෙන ආහාර වට්ටෝරුව | සිංහල | 1 | - | - | - | - | - |
| **එකතුව** | | | **1** | - | - | - | - | - |

## 9. 2011 වසරේදී විශ්වවිද්‍යාලය මඟින් පවත්වන ලද බාහිර පාඨමාලා පිළිබඳ විස්තර

### *1.) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය*

- ව්‍යාපාර පරිපාලනපති උපාධිය
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
- රක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව

### *2.) කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය*

- විද්‍යාවේදී (කෘෂිකර්ම කළමනාකරණ) බාහිර උපාධි පාඨමාලාව

### *3.) ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය – කුලියාපිටිය*

- ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව

### *4.) තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – කුලියාපිටිය*

- පරිගණක භාවිතය සහ නිපුණතාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

### *5.) තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – මාකඳුර*

- තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

| පාඨමාලාව | 2011 වසරේදී ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 2011 වසරේදී පාඨමාලාව සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| අ. ව්‍යාපාර පරිපාලනපති උපාධි පාඨමාලාව | 74 | 27 |
| ආ. ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 100 | 05 |
| ඇ. විද්‍යාවේදී (කෘෂිකර්ම කළමනාකරණ) බාහිර උපාධි පාඨමාලාව | 32 | 21 |
| ඈ. රක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 37 | 26 |
| ඉ. ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | 350 | 115 |
| ඊ. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 85 | - |
| උ. තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 57 | 45 |
| ඌ. පරිගණක භාවිතය සහ නිපුණතාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 78 | 65 |

## 10. 2011.12.31 දින වන විට අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලයේ විස්තර

| පීඨය | අධ්‍යයනාංශ | අනුමත සේවක සංඛ්‍යාව | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය / කථිකාචාර්ය (ආධුනික) | උපදේශක | පද්ධති ඉංජිනේරු | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන | කෘෂිව්‍යාපාර කළමනාකරණ | **8** | - | 2 | - | 2 | 2 | - | - | **6** | **2** |
| | ජෛව තාක්ෂණ | **8** | - | - | 1 | 2 | 2 | - | - | **5** | **3** |
| | උද්‍යාන විද්‍යා හා භූමි අලංකරණ | **10** | 1 | 1 | - | 2 | 2 | - | - | **6** | **4** |
| | වැවිලි කළමනාකරණ | **10** | - | 2 | - | 4 | 2 | - | - | **8** | **2** |
| ව්‍යවහාරික විද්‍යා | පරිගණක හා තොරතුරු පද්ධති | **9** | - | - | - | - | 6 | - | - | **6** | **3** |
| | ඉලෙක්ට්‍රොනික විද්‍යා | **8** | - | 1 | - | 5 | 2 | - | - | **8** | **0** |
| | කර්මාන්ත කළමනාකරණ | **15** | - | - | - | 4 | 6 | - | - | **10** | **5** |
| | ගණිතමය විද්‍යා | **14** | - | - | - | 3 | 7 | - | - | **10** | **4** |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | ගණකාධිකරණ | **11** | - | - | - | 2 | 4 | - | - | **6** | **5** |
| | බැංකු හා මූල්‍ය | **7** | - | - | - | 5 | - | - | - | **5** | **2** |
| | ව්‍යාපාර කළමනාකරණ | **11** | - | - | 1 | 3 | 3 | - | - | **7** | **4** |
| | රක්ෂණ හා තක්සේරුකරණ | **7** | - | - | - | 1 | 1 | - | - | **2** | **5** |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | ව්‍යවහාරික පෝෂණ | **9** | - | - | - | 3 | 3 | - | - | **6** | **3** |
| | ජල ජීවීවගා හා මත්ස්‍ය | **8** | 1 | 1 | 1 | 1 | 2 | - | - | **6** | **2** |
| | ආහාර විද්‍යා හා තාක්ෂණ | **10** | 1 | - | - | 5 | 3 | - | - | **9** | **1** |
| | පශුසම්පත් හා පක්ෂි විද්‍යා | **8** | - | | | 3 | 1 | - | - | **4** | **4** |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය – කුලියාපිටිය | **4** | - | - | - | - | 4 | - | - | **4** | **0** |
| | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය – මාකඳුර | **3** | - | - | - | - | - | 1 | - | **1** | **2** |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය | තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – කුලියාපිටිය | **5** | - | - | - | - | 3 | 1 | 1 | **5** | **0** |
| | තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – මාකඳුර | **6** | - | - | - | - | 2 | 1 | 1 | **4** | **2** |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | | **3** | - | - | - | - | - | 2 | - | **2** | **1** |
| **එකතුව** | | **174** | **3** | **7** | **3** | **45** | **55** | **5** | **2** | **120** | **54** |

29%ක් වූ අධ්‍යයන, 2%ක් වූ අධ්‍යයන සහායක, 6%ක් වූ පරිපාලන සහ 63%ක් වූ අනධ්‍යයන කාර්යය මණ්ඩලය, 411ක් වූ සමස්ත කාර්යය මණ්ඩලය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ අරමුණු සාර්ථක කර ගැනීම සඳහා කටයුතු කරන ලදි.




**විශ්වවිද්‍යාලයේ 2011 වර්ෂයේ කාර්යය මණ්ඩලය**

අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ව්‍යාප්තිය අනුපාතිකව පිළිවෙලින් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය 3%ක් ද, මහාචාර්ය 6%ක් ද, සහාය මහාචාර්ය 3%ක් ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 40%ක් ද සහ කථිකාචාර්ය 49%ක් ද වේ.




**2011 වර්ෂයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය**

2011 වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලයේ හිඟය 54කි. මෙම වසරේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අධ්‍යයන තනතුරු 14ක් ලබා දී ඇත. එමනිසා ඉහත හිඟය පසුගිය වසරට වඩා වැඩි වී ඇත. මීළඟ වසරේදී මෙම හිඟය සම්පූර්ණ කිරීම සඳහා දැනටමත් පියවර ගෙන ඇත.

## 11. 2011.12.31 දින වන විට අනධ්‍යයන කාර්යය මණ්ඩල විස්තර

| පීඨය/අංශය | පරිපාලන කාර්යය මණ්ඩලය | කාර්මික නිලධාරීන් | ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | සුළු සේවක |
|---|---|---|---|---|
| උපකුලපති කාර්යාලය | 1 | - | 1 | 1 |
| ලේඛකාධිකාරී කාර්යාලය | 2 | - | 2 | 1 |
| අධ්‍යයන ආයතන අංශය | 1 | - | 4 | 1 |
| අනධ්‍යයන ආයතන අංශය | 1 | - | 4 | 1 |
| සාමාන්‍ය පාලන අංශය | 1 | - | 5 | 4 |
| මූලධන අංශය | 1 | - | 2 | 1 |
| අධ්‍යයන අංශය | 1 | - | 1 | 1 |
| පොදු සේවා ඒකකය - මාකඳුර පරිශ්‍රය | 1 | - | 2 | 1 |
| අභ්‍යන්තර විගණන අංශය | - | - | 3 | 1 |
| වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | - | - | 1 | - |
| බාහිර සම්බන්ධතා අංශය | - | - | 1 | - |
| ගිණුම් අංශය - කුලියාපිටිය පරිශ්‍රය | 5 | - | 8 | 2 |
| ගිණුම් අංශය - මාකඳුර පරිශ්‍රය | 2 | - | 4 | 1 |
| ගබඩා සහ සැපයුම් අංශය | 1 | - | 5 | 2 |
| ආරක්ෂක අංශය | - | - | 3 | 3 |
| ප්‍රවාහන අංශය | - | - | - | 6 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 1 | 5 | 8 | 10 |
| කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය | 1 | 5 | 10 | 18 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 1 | 1 | 6 | 4 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | 1 | 8 | 10 | 11 |
| විභාග අංශය | 1 | - | 6 | 2 |
| පුස්තකාලය - කුලියාපිටිය පරිශ්‍රය | - | - | 5 | 10 |
| පුස්තකාලය - මාකඳුර පරිශ්‍රය | - | - | 4 | 4 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය | - | 1 | 2 | 2 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒකකය - මාකඳුර පරිශ්‍රය | - | - | 2 | 2 |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය | - | - | 1 | 1 |

| පීඨය/අංශය | පරිපාලන කාර්යය මණ්ඩලය | කාර්මික නිලධාරීන් | ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | සුළු සේවක |
|---|---|---|---|---|
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය | - | - | 1 | 1 |
| වෛද්‍ය මධ්‍යස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය | - | 3 | 1 | 2 |
| වෛද්‍ය මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය | - | 3 | - | 1 |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | 1 | - | - | 3 |
| ශිෂ්‍ය සේවා අංශය | 1 | - | 4 | - |
| නඩත්තු අංශය - කුලියාපිටිය පරිශ්‍රය | 1 | - | 4 | 14 |
| නඩත්තු අංශය - මාකඳුර පරිශ්‍රය | - | - | 1 | 6 |
| නේවාසිකාගාර - කුලියාපිටිය පරිශ්‍රය | - | - | 2 | 2 |
| නේවාසිකාගාර - මාකඳුර පරිශ්‍රය | - | - | 2 | - |
| **එකතුව** | **25** | **26** | **115** | **119** |

අනධ්‍යයන කාර්යය මණ්ඩලය අනුපාතිකව කාර්මික 10%ක් ද, ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි 44%ක් ද සහ සුළු සේවක 46% ක් ද වශයෙන් මුළු එකතුව 260කි. අනධ්‍යයන සේවක සංඛ්‍යාව 260කි.




**2011 වර්ෂයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලය**

# 12. පුස්තකාලය

## 12.1 පසුබිම

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාලය කොටස් දෙකකින් සමන් විත වන අතර කුලියාපිටිය පරිශ්‍ර කොටස මඟින් ව්‍යවහාරික විද්‍යා පීඨයට සහ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයට පහසුකම් සපයනු ලැබේ. එමෙන්ම මාකඳුර පරිශ්‍ර කොටස මඟින් කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයට හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයට පහසුකම් සපයනු ලැබේ.

## 12.2 ගොඩනැගිලි

### 12.2.1 *පුස්තකාලය - කුලියාපිටිය*

කුලියාපිටිය පුස්තකාලය පැරණි පරිපාලන ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ වම් කොටසේ පිහිටුවා තිබුණි. පරිපාලන කාර්යාලය වෙනත් ස්ථානයකට මාරු කළ පසු එම කොටස ද පුස්තකාලයට එක් කරමින් පුස්තකාලය ප්‍රසාරණය කරන ලදි. දැනට ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණය දළ වශයෙන් වර්ග අඩි 7326ක් වන අතර 141 දෙනෙකුට ආසන පහසුකම් ඇත.

### 12.2.2 *පුස්තකාලය - මාකඳුර*

මෙම පුස්තකාලය මාකඳුර පරිශ්‍රයේ ප්‍රධාන මාවතට සමීපව අනෙකුත් පීඨ දෙකට අතරමැදිව පිහිටා ඇත. මෙය 2006 ජූලි මස 27 දින විවෘත කළ නව දෙමහල් ගොඩනැගිල්ලක් වන අතර බිම් ප්‍රමාණය වර්ග අඩි 7200කි.

## 12.3 නව ජයග්‍රහණ

පුස්තකාලය සඳහා නව වෙබ් අඩවියක් (libsys.wyb.ac.lk) ප්‍රකාශයට පත් කර ඇත. එමෙන්ම සියළුම සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා පරිගණක විද්‍යාගාරයක පහසුකම් ලබා දී ඇති අතර පුස්තකාලය පරිගණක ගත කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. පුස්තකාල ස්වයංක්‍රීකරණ කටයුතු ආරම්භකර ඇති අතර තීරු සංකේතකරණය ක්‍රියාත්මක කර ඇත.

## 12.4 පුස්තකාලය නව්‍යකරනය

ව්‍යවහාරික විද්‍යා පීඨ සිසුන් සඳහා නව්‍යකරන වැඩ සටහනක් 2011 ඔක්තෝම්බර් මස 25 දින ප්‍රධාන පුස්තකාලයේ දී පවත්වා ඇත. එවැනි වැඩ සටහන් අනෙක් පීඨවල නවක සිසුන් සඳහා අදාල පුස්තකාලවල පවත්වා ඇත.

## 12.5 වැඩමුළු

- 2011 පෙබරවාරි මස 11 දින ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් පවත්වන ලද සේවක සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාවට සහකාර පුස්තකාලයාධිකාරී ඩී ජී ඒ එස් මල්කාන්ති මිය සහභාගී වී ඇත

- 2011 අගෝස්තු මස 22 දින පුස්තකාලය සඳහා ඉලෙක්ට්‍රොනික තොරතුරු සම්පත් භාවිතය සම්බන්ධයෙන් කොළඹ බ්‍රිටිෂ් කවුන්සිලයේ පැවති වැඩ මුළුවට ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී මහීකාන්ති තුසිතා කුමාරි මිය සහභාගී වී ඇත

- "දැනුමට නැඹුරු සමාජයක් සඳහා පුස්තකාලය" යන මැයෙන් 2011 සැප්තැම්බර් මස 16 සහ 17 දින ගලධාරී හෝටලයේදී පැවැත්වූ අන්තර් ජාතික පුස්තකාල වාර්ෂික වැඩමුළුවට පුස්තකාලයාධිපති ඩබ්ලිව් ජී පී ගම්ලත් මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, මහීකාන්ති තුසිතා කුමාරි මිය සහ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ්ලිව් පුන්‍යවර්ධන මහතා සහභාගී වී ඇත.

- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී මහීකාන්ති තුසිතා කුමාරි මිය Rit/INASP/ව්‍යාපෘතිය යටතේ 2011 ඔක්තෝම්බර් මස 18 දින පැවති වැඩ මුළුවකට සහභාගී වී ඇත.

- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී මහීකාන්ති තුසිතා කුමාරි මිය සහ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ්ලිව් පුන්‍යවර්ධන මහතා 2011 ඔක්තෝම්බර් මස 19 දින පවත්වන ලද "Mining Information from e- Resources" වැඩමුළුවට සහභාගී වී ඇත

- පුස්තකාලයාධිපති, ඩබ්ලිව් ජී පී ගම්ලත් මහතා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ HETC ව්‍යාපෘතිය යටතේ 2011 ඔක්තෝම්බර් මස 17 දින පැවති වැඩමුළුවට සහභාගී විය

- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, ඩබ්ලිව් පුන්‍යවර්ධන මහතා ULA මඟින් පවත්වන ලද "පුස්තකාල පර්යේෂණ ක්‍රමවේද" සම්බන්ධයෙන් 2011 නොවැම්බර් මස 03 දින වැඩමුළුවකට සහභාගී විය

## 12.6 පොත් සහ වාර සඟරා සඳහා වැය ශීර්ෂය

*පුස්තකාලය සඳහා වෙන් කිරීම්:*

පොත් සහ වාර සඟරා - මිලියන 4.5

*වියදම:*

අ) පුස්තකාලය – කුලියාපිටිය

| පොත් | වාර සඟරා |
|---|---|
| රු..3,087,812.57 | Rs. 1,189,282.00 |
| පොත් 1001 | වාර සඟරා 10 |

**සම්පූර්ණ වියදම - රු. 4,277,094.57**

ආ) පුස්තකාලය – මාකඳුර

| පොත් | වාර සඟරා |
|---|---|
| රු. 3, 089,174.81 | රු. 707,022.00 |
| පොත් 230 | වාර සඟරා 14 |

**සම්පූර්ණ වියදම - රු. 3,796,196.81**

## 12.7 පොත් ප්‍රමාණයන්

පුස්තකාලයේ පොත් ලබා ගැනීමේ ලේඛනයට අනුව 2011.12.31 දින වන විට සම්පූර්ණ පොත් සංඛ්‍යාව.

පුස්තකාලය කුලියාපිටිය පරිශ්‍රය - 33298

පුස්තකාලය මාකඳුර පරිශ්‍රය - 18595 (මාකඳුර පොත් ලබා ගැනීම් ලේඛන අංක 66430 ට අනුව)

වර්ෂය තුළ කුලියාපිටිය පුස්තකාලය සඳහා පොත් 1774 අතරින් පොත් 773 ක් පරිත්‍යාග වශයෙන් ලැබී ඇත. එමෙන්ම මාකඳුර පුස්තකාලය සඳහා ලබා ගත් පොත් 756න් 526ක් පරිත්‍යාග වශයෙන් ලැබී ඇත.

## 12.8 2011.12.31 දිනට පුස්තකාලයේ කාර්යය මණ්ඩලය (අධ්‍යයන, අධ්‍යයන සහායක සහ පරිපාලන)

| පුස්තකාලය | අනුමත සේවක සංඛ්‍යාව | පුස්තකාලයාධිපති | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති | සහකාර පුස්තකාලයාධිපති | සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවා) | පද්ධති විශ්ලේෂක | එකතුව | පුරප්පාඩු ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| පුස්තකාලය – කුලියාපිටිය පරිශ්‍රය | **5** | 1 | 1 | 1 | 0 | 1 | **4** | **1** |
| පුස්තකාලය – මාකඳුර පරිශ්‍රය | **2** | - | 1 | - | - | - | **2** | **1** |

## 13. උපාධි අපේක්ෂකයන් සඳහා නේවාසිකාගාර පහසුකම් - 2011

| විශ්වවිද්‍යාල නේවාසිකාගාර | නේවාසිකාගාර පහසුකම් ලබාගත් සිසුන් සංඛ්‍යාව | | කුලියට ලබා ගත් නේවාසිකාගාර | නේවාසිකාගාර පහසුකම් ලබාගත් සිසුන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | | පිරිමි | ගැහැණු |
| පණ්ඩුකාභය – කුලියාපිටිය | - | 60 | කාරියවසම් | 150 | - |
| දීඝගාමිණී - කුලියාපිටිය | - | 56 | (1 සහ 2 මහළ) | | |
| ස්වර්ණපාලී - කුලියාපිටිය | 60 | - | අශෝක | - | 40 |
| චිත්‍රාදේවී- කුලියාපිටිය | 60 | - | | | |
| නව කාන්තා නේවාසිකාගාරය - කුලියාපිටිය | - | 100 | | | |
| සපුමල් බණ්ඩාර I සහ II - මාකඳුර | 120 | - | | | |
| බිසෝ බණ්ඩාර I සහ II - මාකඳුර | - | 120 | | | |
| **එකතුව** | **240** | **336** | **එකතුව** | **150** | **40** |

2011 වසරේ දී ශිෂ්‍ය සංඛ්‍යාව පිරිමි 897 සහ ගැහැණු 1281 ක් වූ අතර ඉන් පිරිමි ළමුන් 240ක් සඳහා ද ගැහැණු ළමුන් 336 දෙනෙකු සඳහා ද විශ්වවිද්‍යාල නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇත. සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාලයේ පළමු වසර හා අවසන් වසර සිසුනට නේවාසිකාගාර පහසුකම් ලබා දෙන අතර ඒ සඳහා ඔවුන්ගේ පදිංචි ස්ථානයේ සිට ඇති දුර ප්‍රමාණය සලකා බලනු ලබයි.

මෙම වසර තුලදී ද විශ්වවිද්‍යාලය සතුව ඇති නේවාසිකාගාරය ප්‍රමාණවත් නොවන බැවින් බදු පදනම මත පෞද්ගලික අංශයෙන් නේවාසිකාගාර 2ක් ලබා ගෙන පිරිමි සිසුන් 150ක් සඳහා ද ගැහැණු සිසුන් 40ක් සඳහා ද නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇත.




**2011 නේවාසිකාගාර පහසුකම් – පිරිමි**




**2011 නේවාසිකාගාර පහසුකම් – කාන්තා**

## 13.1 කුලී නේවාසිකාගාර සඳහා වාර්ෂික වියදම

| නේවාසිකාගාර (කුලියාපිටිය පරිශ්‍රය) | වියදම් වූ මුදල රු. |
|---|---|
| කාරියවසම් (1 සහ 2 මහළ) | 2,622,000.00 |
| අශෝක | 540,000.00 |
| එකතුව | **3,162,000.00** |

# 14. මහපොළ සහ ශිෂ්‍යාධාර ලාභීන් - 2011

| පීඨය | මහපොළ | ශිෂ්‍යාධාර |
|---|---|---|
| කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ | 136 | 162 |
| ව්‍යවහාරික විද්‍යා | 78 | 157 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | 379 | 326 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | 146 | 97 |
| **එකතුව** | **739** | **742** |

2011 වසරේදී විශ්වවිද්‍යාලයේ 2178ක් වූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් 739ක් මහපොළ ලාභීන් වූ අතර 742ක් සිසුන් ශිෂ්‍යාධාර ලාභීන් වූහ. එනම් 34% ක් සහ 34%ක් වශයෙනි.




**ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්ව ලැබීම් - 2011**

# 15. පර්යේෂණ, නව සොයා ගැනීම් හා ප්‍රකාශන

## 15.1 කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන පීඨය

| විෂය | ප්‍රකාශිත | වාණිජ මට්ටමට පත් කිරීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 87 | - | 56 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 17 | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | 03 | - | - |
| ඉ. පත්‍රිකා සංඛ්‍යාව | 84 | - | - |
| ඊ. අනෙකුත් | 06 | - | - |
| **එකතුව** | **197** | **-** | **56** |

## 15.2 ව්‍යවහාරික විද්‍යා පීඨය

| විෂය | ප්‍රකාශිත | වාණිජ මට්ටමට පත් කිරීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 32 | - | 32 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 05 | - | 02 |
| ඈ. පොත් සංඛ්‍යාව | 02 | - | - |
| ඉ. පත්‍රිකා සංඛ්‍යාව | - | - | - |
| ඊ. අනෙකුත් | 01 | - | 01 |
| **එකතුව** | **40** | **-** | **35** |

**15.3 පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

| විෂය | ප්‍රකාශිත | වාණිජ මට්ටමට පත් කිරීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 37 | 02 | 51 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | - | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | 08 | 04 | 03 |
| ඉ. පත්‍රිකා සංඛ්‍යාව | 16 | - | 01 |
| ඊ. අනෙකුත් | 08 | - | 05 |
| **එකතුව** | **69** | **06** | **60** |

**15.4 ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

| විෂය | ප්‍රකාශිත | වාණිජ මට්ටමට පත් කිරීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 06 | - | - |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 03 | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | - | - | - |
| ඉ. පත්‍රිකා සංඛ්‍යාව | 02 | - | - |
| ඊ. අනෙකුත් | - | - | - |
| **එකතුව** | **11** | **-** | **-** |

## **16.** 2011 වසරේදී අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද පශ්චාත් උපාධි

**16.1** කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය

| විෂය | 2011.12.31 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | 2011 වර්ෂය තුළ දී පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරී | 17 | - | - |
| දර්ශනපති | 01 | - | - |
| විද්‍යාපති | 04 | - | - |
| ව්‍යාපාර පරිපාලනපති | - | - | - |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| **එකතුව** | **22** | - | - |

**16.2** ව්‍යවහාරික විද්‍යා පීඨය

| විෂය | 2011.12.31 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | 2011 වර්ෂය තුළ දී පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරී | 09 | - | 01 |
| දර්ශනපති | 01 | - | - |
| විද්‍යාපති | 11 | 03 | - |
| ව්‍යාපාර පරිපාලනපති | 05 | - | - |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| **එකතුව** | **26** | **03** | **01** |

**16.3** ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| විෂය | 2011.12.31 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | 2011 වර්ෂය තුළ දී පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරී | 01 | - | 01 |
| දර්ශනපති | - | - | - |
| විද්‍යාපති | 10 | 01 | - |
| ව්‍යාපාර පරිපාලනපති | 06 | 01 | - |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 01 | - | - |
| **එකතුව** | **18** | **02** | **01** |

**16.4** පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

| විෂය | 2011.12.31 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | 2011 වර්ෂය තුළ දී පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරී | 14 | - | 03 |
| දර්ශනපති | 03 | - | - |
| විද්‍යාපති | 04 | - | - |
| ව්‍යාපාර පරිපාලනපති | - | - | - |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| **එකතුව** | **21** | **-** | **03** |

# 17. ලැබී ඇති ප්‍රදානයන් පිළිබඳ විස්තර

## 17.1 කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය

| විෂය | ප්‍රදාන ගණන | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. දේශීය ප්‍රදාන | - | - | - |
| ආ. ජාතික ප්‍රදාන | 01 | 01 | - |
| ඇ. ජාත්‍යන්තර ප්‍රදාන | - | - | - |
| ඈ. වෙනත් | - | - | - |
| **එකතුව** | **01** | **01** | **-** |

කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයට ලැබුණු ජාතික ප්‍රදානයන් මහාචාර්ය ජේ. එම්. යූ. කේ. ජයසිංහ, කෘෂි ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුව තරුණ විද්‍යාඥයින්ගේ සංගමයේ වාර්ෂික සභාව මඟින් පිරිනමන ලද 2010 වසරේ විශිෂ්ඨ විද්‍යාත්මක පර්යේෂණ සඳහා වන YSF ප්‍රදානය.

## 17.2 පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

| විෂය | ප්‍රදාන ගණන | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. දේශීය ප්‍රදාන | - | - | - |
| ආ. ජාතික ප්‍රදාන | - | - | - |
| ඇ. ජාත්‍යන්තර ප්‍රදාන * | 05 | 02 | - |
| ඈ. වෙනත් ** | 01 | 01 | - |
| **එකතුව** | **06** | **03** | **-** |

*** පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයට ලැබුණු ජාත්‍යන්තර ප්‍රදානයන්**

***ආචාර්ය. ජී. ඒ. පී. චන්ද්‍රසේකර මහත්මිය***

1. ආහාර විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් ජාත්‍යන්තර කමිටුව (IUFOST) මඟින් කරන ලද ප්‍රදානය
2. කැනඩාවේ නිව් ෆවුන්ඩ් ලන්තයේ මෙමෝරියල් විශ්වවිද්‍යාලය මඟින් ප්‍රදානය කරන ලද Barrowman Biochemistry Graduate Travel Award
3. ඇමරිකානු රසායන විද්‍යා සංගමය උසස්ම පරිගණක උපාධිධාරීන්ට හිමි වන විත්කෝම්බ් වැරලේම්බොස් ජීව තාක්‍ෂණ සංවර්ධන ත්‍යාගය
4. ඇමරිකානු තෙල් රසායනඥ සංගමයෙන් ප්‍රදානය කරන ලද ගෞරවනීය සම්මානය

***ආචාර්ය. සී. වී. එල්. ජයසිංහ මහත්මිය***

1. ජපන් ශිෂ්‍ය සේවා සංවිධානය මඟින් ප්‍රදානය කරන ලද පර්යේෂණ අධිශිෂ්‍යත්වය (JASSO)

**** * පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයට ලැබුණු අනෙකුත් ප්‍රදානයන්**

*ආචාර්ය. ඩබ්ලිව් එම් ටී බී වන්නිනායක මහතා - ශ්‍රී ලංකාවේ ඉස්සන් වගා කිරීමේ සංගමය*

# 18. ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**18.1 හැඳින්වීම**

විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින්ගේ ශාරීරික මානසික හා සාමාජීය ආකල්ප සංවර්ධනය කිරීම, ඔවුන්ගේ දක්ෂතාවයත්, හැකියාවත්, නිපුනතාවයත් වැඩි දියුණු කිරීම සඳහා ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් 2011 දී වැඩ සටහන් රාශියක් සංවිධානය කරන ලදී. ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා සිසුන්ගේ සහභාගීත්වය හා ජයග්‍රහණය ඉතා සාර්ථක විය.

**18.2 බාහිර උපදේශකවරු**

පහත දැක්වෙන ක්‍රීඩා ක්‍රියාකාරකම් සඳහා බාහිර උපදේශකවරුන්ගේ සේවාව ලබා ගන්නා ලදි.

| ක්‍රීඩාව | බාහිර උපදේශකවරයාගේ නම | අදාළ ක්‍රීඩාව සඳහා සුදුසුකම් |
|---|---|---|
| බේස්බෝල් | කේ.එන්. අනුරාධ මහතා | ශ්‍රී ලංකා ජාතික බේස්බෝල් කණ්ඩායමේ සාමාජිකත්වය |
| චෙස් | ජේ.එම්.සී.බී. රත්ගල්ල මහතා | විශ්වවිද්‍යාල කණ්ඩායමේ හිටපු ක්‍රීඩක සහ විශ්වවිද්‍යාලයේ වර්ණ ප්‍රදානයේ ජයග්‍රාහකයා |
| එල්ලේ | ජී. විමලසිරි මහතා | වයඹ පළාත් විශිෂ්ඨ ජාතික ක්‍රීඩකයා |
| රගර් | බී.එම්.බී.ඩී. බණ්ඩාර මහතා | සුදුසුකම්ලත් දෙවන තලයේ රග්බි පුහුණුකරු |
| පිහිනුම් | එන්.එම්.ජේ.කේ. නවරත්න මහතා | පිහිනුම් පුහුණුකරු – ශිල්ප ශාලිකා |
| මේස පන්දු | ටී.එම්.කේ.පී.බී. තෙන්නකෝන් මහතා | පාසල් පුහුණුකරු |
| බර එසවීම | එස්.එම්.ආර්.ගුණතිලක මහතා | දිස්ත්‍රික් පුහුණුකරු – කුරුණෑගල ජාතික පුහුණු සහකාර |
| මල්ලවපොර | ඩී.එම්.ඒ. ගුණවර්ධන මහතා | ශ්‍රී ලංකා මල්ලවපොර වර්ණ ප්‍රදානයේ ජයග්‍රාහකයා |

**18.3 වාර්ෂික වැඩසටහන්**

**18.3.1** ***ක්‍රීඩා වැඩසහන්***

❖ ***අන්තර් පීඨ නවක සිසුන්ගේ ශූරතාව – 2011***

අන්තර් පීඨ නවක සිසුන්ගේ ශූරතාව සඳහා පහත ක්‍රීඩා පවත්වන ලදි.

01. බැඩ්මින්ටන් (පිරිමි/කාන්තා)
02. පැසිපන්දු (පිරිමි/කාන්තා)
03. කැරම් (පිරිමි/කාන්තා)
04. චෙස්
05. ක්‍රිකට්
06. එල්ලේ (පිරිමි/කාන්තා)
07. පාපන්දු
08. දැල්පන්දු
09. මේසපන්දු (පිරිමි/කාන්තා)
10. අත්පන්දු (පිරිමි/කාන්තා)
11. බර එසවීම

| ස්ථානය | ලකුණු | පීඨය |
|---|---|---|
| ශූරතාවය | 82 | - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය |
| දෙවන ස්ථානය | 66 | - ව්‍යවහාරික විද්‍යා |
| තුන්වන ස්ථානය | 34 | - කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ |
| හතරවන ස්ථානය | 30 | - පශුසම්පත් ධීවර හා පෝෂණ |

### ❖ අන්තර් පීඨ ශූරතාව *-2011*

අන්තර් පීඨ ශූරතාව සඳහා පහත ක්‍රීඩා පවත්වන ලදි.

01. බැඩ්මින්ටන් (පිරිමි/කාන්තා)
02. පැසිපන්දු (පිරිමි/කාන්තා)
03. කැරම් (පිරිමි/කාන්තා)
04. චෙස්
05. ක්‍රිකට්
06. එල්ලේ (පිරිමි/කාන්තා)
07. පාපන්දු
08. හොකී(පිරිමි)
09. දැල්පන්දු
10. මාර්ග තරඟ
11. පිහිනුම් (පිරිමි/කාන්තා)
12. මේසපන්දු (පිරිමි/කාන්තා)
13. බර එසවීම
14. අත්පන්දු (පිරිමි/කාන්තා)
15. ධාවන හා පිටිය (පිරිමි/කාන්තා)

අන්තර් පීඨ ශූරතාවලිය සඳහා ශිෂ්‍ය සහභාගීත්වය - 2011

| **පීඨය** | **කෘෂිකර්ම** | **ව්‍යවහාරික** | **ව්‍යාපාර අධ්‍යයන** | **පශුසම්පත් පෝෂණ** | **එකතුව** | **ප්‍රතිශතය *** |
|---|---|---|---|---|---|---|
| පිරිමි | 43 | 96 | 85 | 56 | **280** | **31.2%** |
| කාන්තා | 38 | 61 | 56 | 49 | **204** | **16.0%** |
| **එකතුව** | **81** | **157** | **141** | **105** | **484** | **22.2%** |

* අන්තර් පීඨ සහභාගීත්වය (පිරිමි-280),(කාන්තා-204),(එකතුව-484)

අන්තර් පීඨ ශූරතාවලියේ අවසාන ප්‍රතිඵල - 2011

| **ස්ථානය** | **ලකුණු** | **පීඨය** |
|---|---|---|
| ශූරතාවය | 203 | - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය |
| දෙවන ස්ථානය | 179 | - පශුසම්පත් ධීවර හා පෝෂණ |
| තුන්වන ස්ථානය | 177 | - ව්‍යවහාරික විද්‍යා |
| හතරවන ස්ථානය | 15 | - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ |

### ❖ *අන්තර් විශ්වවිද්‍යාලයීය තරඟාවලිය -2011*

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය අනුබද්ධිත අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලිය ඒ ඒ විශ්වවිද්‍යාලවල 2011 ජූනි 03 සිට ජූලි 03 දක්වා පවත්වන ලදි. අන්තර් විශ්වවිද්‍යාල කැරම් පිරිමි සහ කාන්තා තරඟාවලිය 2011 ජූනි 25 සහ 26 යන දිනවල ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේදී පවත්වන ලද අතර විශ්වවිද්‍යාල 13ක තරඟකරුවන් සහභාගී වූහ.

අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාවය සඳහා ශිෂ්‍ය සහභාගීත්වය -2011

| **පීඨය** | **කෘෂිකර්ම** APM | **ව්‍යවහාරික** AS | **ව්‍යාපාර අධ්‍යයන** BSF | **පශුසම්පත් පෝෂණ** LFN | **එකතුව** | **ප්‍රතිශතය **** |
|---|---|---|---|---|---|---|
| පිරිමි | 25 | 71 | 48 | 23 | **167** | **18.6%** |
| කාන්තා | 19 | 25 | 29 | 14 | **87** | **6.8%** |
| **එකතුව** | **44** | **96** | **77** | **37** | **254** | **11.7%** |
| **ප්‍රතිශතය*** | **11.2%** | **25.3%** | **7.1%** | **11.5%** | - | - |

* අන්තර් විශ්වවිද්‍යාලයීය සහභාගීත්වය -2011
2011 එක් එක් පීඨයේ සිටි ශිෂ්‍යයන්

** අන්තර් විශ්වවිද්‍යාලයීය සහභාගීත්වය - 2011
2011 විශ්වවිද්‍යාලයේ සිටි ශිෂ්‍යයන්

### 18.4 අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාවලියෙන් ලද ජයග්‍රහණයන් – 2011

- දෙවන ස්ථානය - කැරම් (පිරිමි)
  මල්ලවපොර

- බර එසවීම - දෙවන ස්ථානය - ඩබ්ලිව් එස් බී දිසානායක - කි. ග්‍රෑ. 77 ගණය
  - දෙවන ස්ථානය - ඩී එම් එම් ඩබ්ලිව් සී බණ්ඩාරණායක – කි. ග්‍රෑ. 56 ගණය

- අවසන් වටය සඳහා සුදුසුකම් ලැබීම් - බැඩ්මින්ටන් (පිරිමි/කාන්තා)
  - පැසිපන්දු (කාන්තා)
  - පාපන්දු
  - අත්පන්දු (කාන්තා)

### 18.5 වර්ෂ ප්‍රදාන උත්සවය 2008, 2009 & 2010

2011 පෙබරවාරි 15 දින ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ දී පැවති වර්ණ ප්‍රදාන උත්සවයේදී 2008, 2009 සහ 2010 වසරවලදී සිසුන් 130 දෙනෙක් වර්ණ ලබා ගත්හ.

### 18.6 බාහිර ක්‍රීඩා තරඟ

මෙම වසර තුළදී පහත සඳහන් ක්‍රීඩා තරඟ සඳහා සිසුන් සහභාගී වූහ. සිසුන්ගේ හැකියාවන් හා පළපුරුද්ද වැඩි දියුණු කිරීම මෙහි පරමාර්ථය වේ.

- ශ්‍රී ලංකා කැරම් සංගමය විසින් සංවිධානය කරන ලද ආධුනික කැරම් තරඟාවලිය.
- ශ්‍රී ලංකා බේස්බෝල සංගමය මඟින් සංවිධානය කරන ලද විවෘත ජාතික බේස්බෝල ශූරතාවලිය.
- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද ආරාධිත බේස්බෝල තරඟාවලිය.
- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද “UMiSF” බැඩ්මින්ටන් තරඟාවලිය.
- කුරුණෑගල දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය විසින් සංවිධානය කරන ලද III කොට්ඨාශ ක්‍රිකට් තරඟාවලිය.
- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද “Mora Hokey Sevens” තරඟාවලිය.
- කැළණිය විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද “Kelani Sevens” රග්බි තරඟාවලිය.
- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද “Mora Soccer” තරඟාවලිය.
- ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය මඟින් සංවිධානය කරන ලද ආධුනික සහ මධ්‍යස්ථ බර ඉසිලීමේ ශූරතාවලිය.
- ශ්‍රී ලංකා මල්ලවපොර සංගමය මඟින් සංවිධානය කරන ලද ආධුනික මල්ලවපොර ශූරතාවලිය.

### 18.7 විශේෂ වැඩසටහන්

ක්‍රීඩා ඉසව් පිළිබඳ නව දැනුම ලබා ගැනීම හා හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා විශේෂ වැඩසටහන් සංවිධානය කරන ලදි.

### 18.7.1 නවාකරණ වැඩසටහන්

ප්‍රථම වසර සිසුන්ට පහත දැක්වෙන දැනුම ලබා දීම සඳහා විශේෂ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි.

- ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අරමුණ.
- ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධ විය හැක්කේ කෙසේද යන්න
- දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන්
- විනය පවත්වාගෙන යන්නේ කෙසේද යන්න
- අනාගත ප්‍රතිලාභ

### 18.8 ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා යෝජනා

1) ක්‍රීඩා පිටියේ ඉදිකිරීම් කටයුතු වේගවත් කිරීම හා ගෘහස්ථ ක්‍රීඩාගාරයක් ආරම්භ කිරීම.

2) එකම කාලයක් තුළ සියලුම අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම.

3) සිසුන් ප.ව. 4.30න් පසු අධ්‍යයන කටයුතුවලින් නිදහස් කිරීම.

4) අනෙකුත් කාර්යය මණ්ඩලයට ද සිසුන් ක්‍රීඩාව සඳහා දිරිගැන්වීමට හැකි නම් එය ක්‍රීඩා අංශයට මහගු සහයෝගයකි.

5) සිසුන් ක්‍රීඩා කටයුතු සඳහා විශ්වවිද්‍යාලය නියෝජනය කරන විට දී අධ්‍යයන කටයුතුවලට සහනයක් ලබා දීම.

# 19. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 2003 ජනවාරි 03 දින ස්ථාපිත කරන ලදි. විශ්වවිද්‍යාල සිසුන් හා රැකියා උත්පාදකයින් අතර සම්බන්ධය වඩා ශක්තිමත් කිරීම, සිසුන්ගේ නිපුනතා දියුණු කිරීම හා විශ්ව විද්‍යාල සිසුන්ගේ වෘත්තීයමය හැකියාවන්වල ගුණත්වය වැඩි දියුණු කිරීම මෙහි අරමුණවේ. මෙම ඒකකය සෘජුවම උපකුලපතිවරයාගේ අධීක්ෂණයට යටත් වන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් මෙම ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා පහසුකම් සපයනු ලැබේ.

වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මඟින් සිසුන්ට තම ඉලක්ක වෙතට අධ්‍යාපනය සාර්ථක ලෙස රැගෙන යාම සඳහා සහයෝගය දෙනු ලැබේ. මෙම ඒකකය මඟින් සෘජු සේවා, අධ්‍යාපනික වැඩ සටහන් සහ සම්පත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඉතා හොඳ සමබරතාවයක් පවත්වනු ලැබේ.

- ප්‍රයෝජනවත් රැකියාවක් ලබා ගැනීමේ හැකියාව
- සේවාවන් පුහුණුවීමට අස්ථාව ලබා ගැනීම
- සිසුන්ගේ ජීවන අරමුණු හා බද්ධ වූ අතිරේක දැනුමක් ලබා ගැනීම

පුද්ගල පෞර්ෂ සංවර්ධනය මඟින් ඔවුන්ට ජගත් තලයේ තම රදා පැවැත්ම තහවුරු වීමට අදාල ක්ෂේත්‍ර නිපුනතා සම්බන්ධයෙන් වැඩමුළු සහ සම්මන්ත්‍රණ, ව්‍යවසායකත්ව සහ වෙනත් අදාල ක්ෂේත්‍ර සම්බන්ධ වැඩ සටහන් සඳහා සිසුන් තෝරා සහභාගී කරගෙන ඇත. සමාගම් මෙම උපාධි අපේක්ෂකයින් තෝරාගෙන ඇත්තේ පෞද්ගලික සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

මෙම ඒකකය මඟින් 2011 වර්ෂය තුළ මෙහෙයවන ලද වැඩසටහන් 19.1 වගුවේ දක්වා ඇත.

### 19.1 2011 වසර තුළ මෙහෙයවන ලද පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන්

| වැඩසටහන් | අපේක්ෂිත කණ්ඩායම |
|---|---|
| ඔබේ දෙපයින් නැගී සිටින්න “සහතික පත්‍ර බෙදා දීමේ උත්සවය– (2010)” | කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයේ සහ පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ දෙවන වසර උපාධි අපේක්ෂකයින් |
| “සාර්ථකත්වයේ රහස්” වැඩමුළුව | ව්‍යවහාරික විද්‍යා පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| වෘත්තීය මාර්ගෝපදේශණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ව්‍යවහාරික විද්‍යා පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| “ඔබේ දෙපයින් නැගී සිටින්න” දැනුවත් කිරීමේ වැඩසටහන | සියලුම පීඨවල පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන | සියලුම පීඨවල පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| දියසායම් මඟින් චිත්‍ර ඇඳීමේ සහ පාට කිරීමේ වැඩමුළුව | කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයේ කලා කවයේ ශිෂ්‍ය සාමාජිකයින් |
| “ ජීවිතය දැකීම සඳහා අරමුණු පිහිටුවා ගැනීම” වැඩමුළුව | සියලුම පීඨවල පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| “ඔබගේ ජීවිතය කළමනාකරණය - කාල කළමනාකරණය” වැඩමුළුව | සියලුම පීඨවල පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| “ඵලදායී සන්නිවේදනය” විචක්ෂණ සන්නිවේදනයේ කලාව” වැඩමුළුව | සියලුම පීඨවල පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| “ව්‍යවසායකත්ව හැකියාව දියුණුකිරීම” වැඩමුළුව | සියලුම පීඨවල පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| “ස්වතන්ත්‍ර ප්‍රජාතන්ත්‍රවාදය” වැඩමුළුව | සියලුම පීඨවල පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| “JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන” | මාකඳුර පරිශ්‍රයේ පළමු, දෙවන සහ තුන්වන වසර උපාධි අපේක්ෂකයින් |
| “සීමාවලින් පිට පුහුණුව – ඓතිහාසික යාපහුව නැරඹීම” | කෘෂිකර්ම පීඨයේ සහ පශු සම්පත් පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| නව්‍යකරණ වැඩසටහන | ව්‍යවහාරික විද්‍යා පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| “සීමාවලින් පිට පුහුණුව – නායකත්ව සංවර්ධන කඳවුරු” | කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයේ, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ සහ ව්‍යවහාරික විද්‍යා පීඨයේ දෙවන වසර උපාධි අපේක්ෂකයින් |
| නව්‍යකරණ වැඩසටහන | පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| “ඔබේ දෙපයින් නැගී සිටින්න” සහතිකපත්‍ර බෙදාදීමේ උත්සවය (2011) | කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයේ, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ සහ ව්‍යවහාරික විද්‍යා පීඨයේ දෙවන වසර උපාධි අපේක්ෂකයින් |
| Youth Fest – 2011 | සියලුම පීඨවල දෙවන වසර සහ තුන්වන වසර උපාධි අපේක්ෂකයින් |

### 19.2 දුෂ්කරතාවයන්

ඒකකය මඟින් පවත්වන වැඩසටහන්වල කාර්යක්ෂමතාවය හා ඵලදායී බව වැඩිකිරීමට මූලික පහසුකම් කිහිපයක් අවශ්‍යය ඇත.

## 20. තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය

## කුලියාපිටිය පරිශ්‍රය

### 20.1 හැඳින්වීම

මෙම ඒකකය මගින් ව්‍යවහාරික විද්‍යා පීඨය සහ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය යන පීඨ දෙකෙහි සිසුන් සඳහා සේවා සැපයීම් කරනු ලැබේ. මෙහි විද්‍යාගාරය කොටස් දෙකකින් යුක්ත වන අතර එක කොටසක් අන්තර්ජාල පහසුකම් හා අනෙක් කොටස ප්‍රායෝගික කටයුතු සඳහා වෙන් කෙරේ. මෙම විද්‍යාගාරය අති නවීන තාක්ෂණික ගුණාංගවලින් සමන්විත වේ. අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල සඳහා වෙන වෙනම කොටස් දෙකක් ස්ථාපිත කර ඇත. සාමාන්‍යයෙන් මෙම විද්‍යාගාරය රාජකාරී කාලය තුළ විවෘතව තිබේ. සිසුන් සඳහා පස්වරු 10.00 දක්වා විවෘතය. ඊට අමතරව සති අන්තයේ දී සහ නිවාඩු දිනවලදී ද විවෘතව ඇත. වෙබ් අඩවි සහ ඉලෙක්ට්‍රොනික තැපැල් සේවාවලට අදාළ පද්ධති උපකරණ මෙම මධ්‍යස්ථානයේ සවිකර ඇති අතර ඒවා පාලනය කරනු ලබන්නේ ද මෙම කාර්යය මණ්ඩලය මගිනි. දැනටමත් මෙම ඒකකය මයික්‍රෝසොෆ්ට් සමාගම සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් මේ වන විට ලක්ෂ 30 ක පමණ වටිනා මෘදුකාංග අයකිරීමකින් තොරව ලැබී ඇත. මෙම ඒකකය පරිශ්‍රයේ සියළු දෙනාටම සේවා සපයනු ලැබේ. එමෙන්ම විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර දුරකථන ජාලය නිර්මාණය, පරිපාලනය පමණක් නොව ස්ථාපිත කිරීම ද මෙම ඒකකය මගින් සිදු කර ඇත. ඊට අමතරව පසුගිය කාලය ඇතුලත බාහිර ප්‍රජාව සහ අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් සඳහා නව පාඨමාලා කිහිපයක් හඳුන්වා දී තිබේ.

### 20.2 මෙහෙයවන ලද පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන්

- නවක සිසුන් සඳහා පරිගණක භාවිතය
- උපාධි අපේක්ෂකයින් සඳහා වන MS Office සහතික පත්‍ර පාඨමාලාව
- බාහිර පාර්ශවය සඳහා වන තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (ගාස්තු අයකෙරේ)
- අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා වන තොරතුරු තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන

### 20.3 අයවැය

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන | - | මිලියන 1.75 |
| පුනරාවර්තන | - | මිලියන 4.1 |

### 20.4 වසර තුළ ලැබූ ප්‍රගතිය

- පාඨමාලා පවත්වාගෙන යාමට හා පරීක්ෂණ කාර්යයන් සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය භාවිතා කිරීම
- උපාධි අපේක්ෂකයින් සඳහා MS Office සහතික පත්‍ර පාඨමාලාව ආරම්භ කිරීම (මෙය කෙරෙමින් පවතී)
- විද්‍යාගාරයේ පරිගණක ප්‍රතිස්ථාපනය කිරීම හා උසස් කිරීම
- රැහැන් රහිත ජාලය පුළුල් කිරීම

### 20.5 අනෙකුත් දුෂ්කරතාවයන්

- කාර්යය මණ්ඩලය සඳහා ලබා දෙන යටිතල පහසුකම් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණාත්මක නොවීම
- නව තාක්‍ෂණික ප්‍රවීනතා දැනුම යෙදවීම අඩුවීම
- ශිෂ්‍යය සංඛ්‍යාවේ වැඩිවීමේ ප්‍රමාණයට සරිලන ආකාරයට පරිගණක විද්‍යාගාර පහසුකම් වැඩිකිරීමට ඉඩකඩ ප්‍රමාණවත් නොවීම.
- පරිගණක අලුත් වැඩියාකිරීමට ස්ථානයක් නොමැති වීම සහ කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම
- කාර්යය මණ්ඩලයට ලබා දෙන පුහුණු පාඨමාලා ප්‍රමාණවත් නොවීම.

### 20.6 ඉදිරි සංවර්ධනය සඳහා යෝජනා

- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමාව දක්වා වැඩිදියුණු කිරීම.
- ඉගෙනීමේ කළමණාකරන පද්ධතිය (LMS) අධ්‍යයන කාර්යය මණ්ඩලයට හඳුන්වා දීම.
- බාහිර පුද්ගලයන්ට වැඩමුළු පැවැත්වීම.
- වැඩිවන ශිෂ්‍ය කණ්ඩායම්වලට ගැලපෙන ආකාරයට පරිගණක විද්‍යාගාර පහසුකම් වැඩි කිරීම.
- 
- රැහැන් රහිත ජාල පහසුකම් වැඩිකිරීම.
- "වෙබ් අඩවි සංවර්ධනය" නමින් ගාස්තු අයකරන පාඨමාලාවක් ආරම්භ කිරීම.
- කාර්ය මණ්ඩලය පුහුණු කිරීම

### 20.7 අනෙකුත් අදාල තොරතුරු

විශ්වවිද්‍යාලයට හා බාහිර ප්‍රජාවට බහු සේවා සපයන මධ්‍යස්ථානයක් බවට තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය දියුණු කිරීමට අවශ්‍යව ඇත.

# 21. තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය

## මාකඳුර පරිශ්‍රය

### 21.1 හැඳින්වීම

සිසුන්ගේ සීඝ්‍රයෙන් දියුණුවන විෂය ක්ෂේත්‍රවලට අදාල තොරතුරු තාක්ෂණ අභියෝගයන්ට මුහුණ දිය හැකි සේවාවක් සැපයීම සඳහා මාකඳුර තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවා ඇත. එමෙන්ම මේ නිසා ඔවුන්ට පරිගණක සාක්ෂරතාවය මෙන්ම ඉහළ වෘත්තීය කාර්යය සාධනයක් ලබා ගැනීමට පහසුකම් සැලසී ඇත.

මෙම ඒකකය මඟින් කෘෂිකර්ම හා වැව්ළි කළමනාකරණ පීඨය සඳහා තොරතුරු තාක්ෂණ හා උසස් පරිගණක භාවිතාව පිළිබඳ පාඨමාලා ප්‍රදානය කරන අතර පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය සඳහා පරිගණක තාක්ෂණ පාඨමාලාව ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම අධ්‍යයනාංශ මඟින් පවත්වන සංඛ්‍යානය ආශ්‍රිත පාඨමාලා විශේෂයෙන්ම ප්‍රායෝගික පාඨමාලාවලදී මෙම ඒකකය මඟින් සහයෝගය දෙනු ලැබේ. ඊට අමතරව විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන වැව්ළි කළමනාකරණ (බාහිර) උපාධියට අයත් සිසුන්ගේ පාඨමාලා දෙකක් වන පරිගණක තාක්ෂණය සහ විද්‍යුත් වාණිජ්‍ය හා තොරතුරු කළමනාකරණ පද්ධති යන පාඨමාලාවලට සහයෝගය දෙනු ලැබේ. එමෙන්ම වයඹ පළාතේ ප්‍රජාවට ප්‍රයෝජනවත්වන පරිදි පරිගණක තාක්ෂණයට සම්බන්ධ පාඨමාලා කීපයක්ම ප්‍රදානය කරමින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මඟින් කරනු ලබන සේවා පුළුල් කර ඇත.

මෙම පරිගණක තාක්ෂණ මධ්‍යස්ථානය සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 8.00 දක්වාත්, සෙනසුරාදා දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වාත්, විභාග කාලය තුලදී පෙරවරු 8.00 සිට පස්වරු 10.00 දක්වාත් විවෘත කර ඇත.

### 21.2 මෙහෙයවන ලද පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන්

- පරිගණක භාවිතය පිළිබඳ නිපුණතා සහතික පත්‍ර පාඨමාලාවේ දෙවන කණ්ඩායම පාඨමාලාව සම්පූර්ණ කරන ලදි - 2011 ජූලි මස 30 දින
- පරිගණක භාවිතය පිළිබඳ නිපුණතා සහතික පත්‍ර පාඨමාලාවේ තුන්වන කණ්ඩායම - 2011 සැප්තැම්බර් මස 08
- තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු කණ්ඩායම – 2011 සැප්තැම්බර් 09

### 21.3 වර්ෂය තුළ ලැබූ දියුණුව

පහත සඳහන් භාණ්ඩ මිලදී ගන්නා ලදි.

ලැප්ටොප් පරිගණක 01 (Lap Top)

තට්ටු දෙකේ පාලන ස්විච 12

බලය සැපයීමේ ඒකක 15

යතුරු පුවරු සහ මූසික 15 (Keyboard & Mouse)

USB Flash Drive 03

DVD Writers 03

RAM 50

### 21.4 අනෙකුත් දුෂ්කරතා

පරිගණක තොරතුරු අංශය සඳහා දැනට පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොමැත

### 21.5 යෝජනා

මධ්‍යස්ථානය දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන අත්‍යාවශ්‍ය වේ.

### 21.6 අනෙකුත් අදාල තොරතුරු

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනය මඟින් 2011 අගෝස්තු 22 සිට 27 දක්වා පවත්වන ලද 38 වන **"GIS and Applications"** නේවාසික කෙටි පාඨමාලාව සඳහා එච් ඒ සී කේ ජයතිලක මහතා සහභාගී වීය.

## 22. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය

කුලියාපිටිය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය මඟින් සිසුන්ට ඔවුන්ගේ අනාගතය හමුවේ ඇති අභියෝග ජයගැනීම සඳහා අවශ්‍ය භාෂා නිපුණතා ලබා ගැනීමට, ඔවුන්ගේ අවංකභාවය වැඩි කිරීම, අවස්ථාවෝචිත පරිදි අනුවර්තනයවීමේ හැකියාව සහ සක්‍රීය ඵලදායී පුරවැසියන් බිහිකිරීම අපේක්ෂා කරනු ලැබේ. ජාතියේ සංවර්ධනය සඳහා විශාල වශයෙන් දායක වීමට සහ සමාජය සමඟ අන්‍යෝන්‍ය ක්‍රියාත්මක වීම වර්ධනය කිරීම සඳහා මෙම පාඨමාලා, සහභාගීත්ව සහ ක්‍රියාකාරකම් පුරුකක් වශයෙන් ක්‍රියාත්මක වනු ඇත. මෙම පාඨමාලා UTEL (University Test of English Language) ප්‍රමිතීන්ට සමාන වන අතර 2011 වසරේදී සිසුන්ට තම ඉංග්‍රීසි භාෂාවේ නිපුණත්වය සහ විශ්වාසය තවදුරටත් වර්ධනය කිරීම සඳහා අවස්ථාව ලබා දී ඇත.

**22.1)** 2011 වසරේදී ප්‍රදානය කළ පාඨමාලා

1. **I) ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා**
   - නවක සිසුන් සඳහා මූලික ඉංග්‍රීසි පාඨමාලාව.
   - ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය පිළිබඳ පාඨමාලා පළමු මට්ටමේ සිසුන් සඳහා
   - ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය පිළිබඳ පාඨමාලා දෙවන මට්ටමේ සිසුන් සඳහා.
   - ව්‍යාපාර ඉංග්‍රීසි පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව තුන්වන මට්ටමේ සිසුන් සඳහා.
   - ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය පිළිබඳ උසස් පාඨමාලාව තුන්වන මට්ටමේ සිසුන් සඳහා.

   **II) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය.**
   - ප්‍රථම වසර සිසුන් සඳහා ව්‍යාකරණ පදනම ඉංග්‍රීසි පාඨමාලාව (ELTU 1110)
   - ප්‍රථම වසර සිසුන් සඳහා රචනා හැකියාව දියුණු කිරීම පාඨමාලාව (ELTU 1210)
   - දෙවන වසර සිසුන් සඳහා ව්‍යාපාර සන්නිවේදන I පාඨමාලාව (BSF 2131)
   - දෙවන වසර සිසුන් සඳහා ව්‍යාපාර සන්නිවේදන II පාඨමාලාව (BSF 2251)

ඉංග්‍රීසි භාෂා මධ්‍යස්ථානය සඳහා ඇමරිකානු එක්සත් ජනපදයෙන් පැමිණි ජ්‍යෙෂ්ඨ මට්ටමේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සාමාජිකයෙකු විසින් 2011 වසරේදී අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සාමාජිකයින්ට ඉගැන්වීම් ක්‍රම පිළිබඳ පුහුණු වැඩ සටහන් කීපයක් පවත්වන ලද අතර ඉංග්‍රීසි භාෂා මධ්‍යස්ථානයේ පුස්තකාලය සඳහා වටිනා පොත් සහ වීඩියෝ කැමරා, ඩිජිටල් කැමරා, වර්ණ ඡායාපිටපත් යන්ත්‍රයක් ඇතුළු ඉගැන්වීම සඳහා ආධාර කරගත හැකි වටිනා උපකරණ රාශියක් ලබා දී ඇත. ඊට අමතරව ඇය විසින් ඉංග්‍රීසි භාෂා මධ්‍යස්ථානයේ ස්ථිර සහ තාවකාලික කාර්යය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහනක් ද, පීඨවල අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා IELTS පාඨමාලාවක් ද, පරිපාලන කාර්යය මණ්ඩලය සඳහා ඉංග්‍රීසි නිපුණත්වය වර්ධනය කරගැනීමට පාඨමාලාවක් ද පවත්වා ඇත. එමෙන්ම 2011 ජූනි මස 16-18 දක්වා ඉන්දියාවේදී පැවැත්වූ 6වැනි ජාත්‍යන්තර සහ ඉංග්‍රීසි ගුරුවරුන්ගේ 42වන වාර්ෂික සම්මේලනය සඳහා කථිකාචාර්යවරුන් දෙදෙනෙකුට සහභාගීවීමට අවස්ථාව ලබා දී ඇත.

උපාධි අපේක්ෂකයින්ගේ ඉංග්‍රීසි නිපුනත්වය සඳහා විශ්වවිද්‍යාලය තුළ පවත්වන ලද පාඨමාලාවලට අමතරව බාහිර ප්‍රජාව සඳහා ද විවිධ බාහිර පාඨමාලාවන් හා වැඩමුළු සංවිධානය කර ඇත. පාසල් සිසුන් සඳහා අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස (උ.පෙළ) විභාග සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු පවත්වා ඇත. එක් අවුරුදු ඉංග්‍රීසි ඩිප්ලෝමා 5වන කණ්ඩායම 2011 දී බඳවා ගත් අතර සිසුන් 160දෙනෙකු පමණ සාර්ථකව පාඨමාලාව නිම කර ඇත. විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා දෙමළ භාෂා පාඨමාලාවක් ආරම්භ කර ඇති අතර ඒ සඳහා මූල්‍යාධාර ඉංග්‍රීසි මධ්‍යස්ථානය මඟින් ලබා දී ඇත. මෙම දෙමළ භාෂා පාඨමාලාව නිසා විශ්විද්‍යාලයේ කාර්යය මණ්ඩලයට භාෂා දෙකකින් රාජකාරී කිරීමේ හැකියාව ලැබී ඇත.

විශ්වවිද්‍යාලයට පරිබාහිර විවිධ ආයතනවල ප්‍රවීනයන් මඟින් තුන්වන වසරේ උපාධි අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණවලට මුහුණ දීම පිළිබඳ නිපුණතා වර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ඒවා ශිෂ්‍යයන්ට ඉතාමත් ඵලදායී වී ඇත.

**22.2 පර්යේෂණ ක්‍රියාකාරකම්**

2011 වර්ෂයේදී ඉංග්‍රීසි භාෂා මධ්‍යස්ථානයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පර්යේෂණ ක්‍රියාකාරකම්වල නිරත වී ඇත.

| | |
|---|---|
| ඊ එම් එච් ජේ එදිරිසිංහ මහතා | 'What kind of writing activities should EFL/ESL teachers use with post, beginners- A study of 1st year students at the Wayamba University of Sri Lanka.' |
| එම් කේ එස් එම් සමරනායක මහතා | 'Article usage by undergraduates' |
| ඩබ්ලිව් එස් ඒ ප්‍රනාන්දු මිය | 'Why do students fail to acquire basic sentence structure of English at the O/L standard? –A case study.' |

**22.3 අනාගත සැලසුම්**

UDG ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත. එම ක්‍රියාකාරකම්වලින් උපාධි අපේක්ෂයන්ට ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය සහ විශ්වාසය වැඩි දියුණු කරනු ලැබේ.

අ. ඉංග්‍රීසි භාෂා විෂය මාලාව නැවත සංශෝධනය

ආ. ඉංග්‍රීසි භාෂා මධ්‍යස්ථානයේ පහසුකම් තව දුරටත් සංවර්ධනය කිරීම

ඇ. විෂය මාලාව ට E-Learning ඇතුලත් කිරීම

ඈ. අධ්‍යයන කාර්යය මණ්ඩල පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම

ඉ. භාෂා කඳවුරු සංවිධානය කිරීම

ඊ. ඉංග්‍රීසි දිනය ආශ්‍රිත තරග සංවිධානය

උ. උපාධි අපේක්ෂකයන් බිත්ති පුවත්පත්/සඟරා/වාර සඟරා යනාදිය නිර්මාණය කිරීමට යොමු කිරීම

**22.4 දුෂ්කරතා**

සෑම වසරකම පීඨ සඳහා බඳවා ගන්නා ශිෂ්‍ය ප්‍රමාණය වැඩිකරනු ලැබුවද කාර්ය මණ්ඩල ප්‍රතිපාදන 2005 වසරේ සිටම ලබා දී නැත. එසේ තිබියදී කථිකාචාර්යයවරුන් හතර දෙනෙකු මෙම පීඨ සඳහා තම උපරිම ශක්ති ප්‍රමාණයෙන් සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම දියුණු කිරීම සඳහා කැපවී සිටිති. එබැවින් තවදුරටත් කථිකාචාර්යවරු අවශ්‍යවන අතර ඒ පිළිබඳව HETC ව්‍යාපෘතියේ විමර්ශන කණ්ඩායම ද විශ්වවිද්‍යාලයේ අවධානයට යොමු කොට ඇත. නව කථිකාචාර්යවරුන් ලබා දෙන්නේ නම් වඩාත් හොඳ සේවාවක් ලබා දිය හැකි අතර ආචාර්ය තනතුරු හිඟය නිසා ඇතිවන ගැටළු එවිට අවම වනු ඇත. එමෙන්ම මධ්‍යස්ථානය නිසි පරිදි ක්‍රියාත්මක වීම සඳහා කථිකාචාර්යයවරුන්ගේ සේවය ද අත්‍යාවශ්‍යව ඇත.

භාෂා විද්‍යාගාරයේ පවත්වන වැඩසටහන් නිසියාකාරව සිදුකිරීම සඳහා කාර්මික නිලධාරීවරයෙකු නොමැතිකම විශාල ගැටළුවකි. එම නිසා භාෂා විද්‍යාගාරය සඳහා කාර්මික නිලධාරීවරයෙකු පත් කිරීම පිළිබඳ ඉක්මනින් අවධානය යොමු කළ යුතුව ඇත.

# 23. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය

### 23.1 හැඳින්වීම

මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙකක 1, 2 සහ 3 වසර සිසුන් සඳහා ඉංග්‍රීසි පාඨමාලා පවත්වනු ලැබේ. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ 1 වසර සිසුන් සඳහා "පදනම් ඉංග්‍රීසි" පාඨමාලාවද, පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ 1 වසර සිසුන්ට "විද්‍යාව සඳහා ඉංග්‍රීසි" පාඨමාලාව ද පවත් වනු ලැබේ. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ 2 වසර සිසුන් සඳහා "ශාස්ත්‍රීය ලිවීම" පාඨමාලාව ද, පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ 2 වසර සිසුන් සඳහා "ශාස්ත්‍රීය ඉංග්‍රීසි" පාඨමාලාව ද පවත්වනු ලැබේ. පීඨ දෙකේම 3 වසර 2 වන සමාසිකය සඳහා "ව්‍යාපාර ඉංග්‍රීසි" පාඨමාලාව පවත්වනු ලැබේ. මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙකේම නවක සිසුන් සඳහා මූලික ඉංග්‍රීසි පාඨමාලාව ද පවත්වා ඇත. මෙම වර්ෂයේදී එම මූලික ඉංග්‍රීසි පාඨමාලාව පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ සිසුන් සඳහා මාසයක් ද, කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සිසුන් සඳහා සති 03ක් ද පවත්වා ඇත.

### 23.2 පවත්වන ලද පුහුණුවීම් හා දැනුවත්වීම් වැඩ සටහන්

ඇමරිකානු තානාපති කාර්යාලය මඟින් ඉංග්‍රීසි ඒකකය සඳහා අනුයුක්ත කරන ලද Fellow විසින් වීඩියෝ කැමරා, ඩිජිටල් කැමරා, වර්ණ මුද්‍රණ යන්ත්‍ර ඇතුළු වටිනා උපකරණ රාශියක් ඒකාබද්ධව ලබා දී ඇත. මෙම වසරේ මෙම ඒකකය මඟින් පවත්වන ලද පුහුණුවීම් වැඩමුළු නම් මූලික ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා යොදා ගන්නා ලද තාවකාලික ඉංග්‍රීසි ඉගැන්වීමේ කාර්යය මණ්ඩලය පුහුණු කිරීම, සමුළුවකදී ඉදිරිපත් කිරීමට පර්යේෂණ පත්‍රිකාවකට මාතෘකාවක් තෝරා ගැනීම හා එම පත්‍රිකාව ලිවීමේ ක්‍රමය පිළිබඳ උපදේශන ලබා දීම. තානාපති කාර්යාලය මඟින් අනුයුක්ත කරන ලද නිලධාරිනිය 2010 සැප්තැම්බර් මස සිට 2011 ජූනි මස දක්වා මාස 10ක සේවයෙන් පසු ආපසු පිටත්ව ගියහ. මෙම නිලධාරිනියගේ උපදෙස් අනුව ඉංග්‍රීසි අංශයේ කථිකාචාර්යවරුන්වන ප්‍රනාන්දු මිය සහ රාමනායක මිය යන අය විසින් මූලික ඉංග්‍රීසි ඉගැන්වීම් සඳහා යොදා ගන්නා තාවකාලික උපදේශකයින් පුහුණු කරන ලදි. ඊට අමතරව මාකඳුර පරිශ්‍රයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා සතියකට දින 02 බැගින් මාස 03ක පාඨමාලාවක් පවත්වන ලදි. ඩබ්ලිව් එම් සී ප්‍රනාන්දු මිය සහ ආර් එම් එස් රාමනායක මිය විසින් මෙම පාඨමාලාව පවත්වන ලදි.

### 23.3 කාර්යය මණ්ඩල තත්ත්වය

මෙම ඒකකය සඳහා එක් ස්ථිර ඉංග්‍රීසි උපදේශකවරයෙකු ද, තාවකාලික ඉංග්‍රීසි උපදේශකවරු තිදෙනෙක් සහ බාහිර ඉංග්‍රීසි උපදේශකවරයෙක් ද සිටිති. ඊට අමතරව පරිගණක යෙදුම් සහකාරවරයෙකු සහ කම්කරු ශ්‍රේණියේ සේවකයෙකු අනුයුක්ත කොට ඇත.

### 23.4 වසරේ දියුණුව

මාකඳුර ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය හා කුලියාපිටිය ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය මඟින් 20වන සියවස සඳහා විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රදානයන් ලබා ගෙන ඇත. මාකඳුර ඉංග්‍රීසි ඒකකයේ සම්බන්ධීකාරක මෙම ව්‍යාපෘතියේ සෑම රැස්වීමකටම සහ වැඩමුළුවකටම සහභාගී වී ව්‍යාපෘතියේ සම්බන්ධීකාරකවරයාට සහාය වී එම ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම සඳහා සහාය වී ඇත. එමෙන්ම 2011 ජූනි මස ඉන්දියාවේදී පැවැත්වුනු ඉංග්‍රීසි ගුරුවරුන්ගේ වාර්ෂික සම්මේලනය සඳහා ඩබ්ලිව් එම් සී

ප්‍රනාන්දු මහත්මිය ඇතුළු තවත් ඉංග්‍රීසි උපදේශකවරුන් දෙදෙනෙකු සහභාගී වී ඇත. මෙහිදී ප්‍රනාන්දු මහත්මිය විසින් "ශ්‍රී ලංකාවේ බහු භාෂාමය සහ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම්" යන මැයෙන් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර එය එම සංගමයේ වාර්ෂික සඟරාවේ ප්‍රකාශයට පත් කොට ඇත.

### 23.5 දුෂ්කරතා

මෙම ඒකකය මඟින් "English through e Learning" සහතික පත්‍ර පාඨමාලාව ඉගැන්වීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇති අතර සනාතන සභාවේ අනුමැතිය ලැබෙන තෙක් ආරම්භ කිරීම ප්‍රමාද වී ඇත. මෙම පාඨමාලාව 2009 වසරේ දී මාස 03ක් සඳහා පැවැත් වූ අතර මුදල් ගෙවා ඉගෙන ගැනීම සඳහා එය සකස් කර ඇති අතර ඩබ්ලිව් එම් සී ප්‍රනාන්දු මහත්මිය විසින් පාඨමාලාව සකස් කොට ඇත.

### 23.6 යෝජනා

විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ආරම්භ කරන ලද සංවර්ධන වැඩ කටයුතු ඉක්මනින්ම කළ යුතුව ඇත. මෙම ඒකකයේ ඉදිරි පස කොටස දැනටමත් අළුත්වැඩියා කොට ඇත. සිසුන්ගේ ලිවීමේ නිපුනතාව සංවර්ධනය සඳහා වැඩමුළු කීපයක් පැවැත්වීමට යෝජිතව ඇත. එමෙන්ම ඒකකය සඳහා ස්ථිර කාර්යය මණ්ඩලයක් බඳවා ගත යුතුව ඇත.

# 24. වෛද්‍ය මධ්‍යස්ථානය

වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථාන දෙකක් කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍රවල ස්ථාපිත කර ඇති අතර එම මධ්‍යස්ථානය මඟින් 2010 වසරේදී මෙන් 2011 වසරේදී ද සෞඛ්‍ය ප්‍රවර්ධනය සම්බන්ධයෙන් ඉතා කැපී පෙනෙන භූමිකාවක් ඉටු කර ඇත.

කුලියාපිටිය වෛද්‍ය ඒකකය 2010 වසරේදී නව ගොඩනැගිල්ලකට ස්ථාපිත කර ඇති අතර දැනට ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

මාකඳුර පරිශ්‍රයේ වෛද්‍ය මධ්‍යස්ථානය 2011 වසරේදී පරිපාලන ගොඩනැගිල්ලේ පවත්වාගෙන ගිය අතර මීළඟ වසරේදී නව ගොඩනැගිල්ල ඉදිකර එම ස්ථානයට ගෙන යාමට නියමිතය. (2012 වසරේදී නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇත)

කුලියාපිටිය පරිශ්‍රයේ කාර්යය මණ්ඩලය 2010 වසරේදී පරිදි හෙද නිලධාරියෙක්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක්, ඖෂධවේදියෙක්, යතුරු ලේඛිකාවක්, සාත්තුසේවකයෙක් සහ කම්කරුවෙකු යන සේවක මණ්ඩලයකින් සමන්විතය වේ. මාකඳුර පරිශ්‍රයේ ද යතුරු ලේඛිකාවක් හැර මෙවැනිම කාර්යය මණ්ඩලයක් සේවය කරති.

වෛද්‍ය මධ්‍යස්ථානය මඟින් 2011/2012 වසරේදී ලියාපදිංචි වූ නවක සිසුන් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කල අතර එහිදී ඇතැම් සිසුන්ගේ හඳුනාගත් වෛද්‍ය ගැටළු සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ සඳහා අදාල විශේෂඥ වෛද්‍යවරුන් වෙත යොමු කරන ලදි.

එමෙන්ම මෙම නවක සිසුන්ගේ සෞඛ්‍ය සම්බන්ධ ගැටළුවලට වැඩි අවධානයක් යොමු කල අතර ඒ සඳහා නිවැරදි විසඳුම් ලබා දෙන ලදි.

කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍රවල නවක සිසුන්ට සාමාන්‍ය සෞඛ්‍ය සහ බෙහෙත් සම්බන්ධයෙන් දේශන ඔවුන්ගේ පාඨමාලා ආරම්භයේදීම ලබා දෙන ලදි.

එමෙන්ම වෛද්‍ය මධ්‍යස්ථානය මඟින් නවක කාර්යය මණ්ඩල සාමාජිකයන්ගේ සහ සේවා දීර්ඝ කිරීම සඳහා අයදුම්කරන කාර්යය මණ්ඩලයේ වෛද්‍ය පරීක්ෂණ වාර්තා ලබා දෙන ලදි.

විශ්වවිද්‍යාලයේ සියලුම කාර්යය මණ්ඩල, සිසුන් සඳහා අවශ්‍ය සාමාන්‍ය ප්‍රතිකාර මෙම මධ්‍යස්ථානයෙන් ලබා දී ඇති අතර විශේෂ ප්‍රතිකාර අවශ්‍ය වූවන් කුලියාපිටිය මූලික රෝහල වෙත යොමුකර ඇත.

<u>2011 වසරේදී කරන ලද සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩ සටහන් පහත දැක්වේ.</u>

1. තැලසීමියා රෝගය සම්බන්ධයෙන් දැනුවත් කිරීම, පරීක්ෂා කිරීම
2. Leptospirosis සඳහා කරන ලද අධ්‍යාපන වැඩසටහන හා රෝගී නිවාරණය
3. බෝනොවන රෝග සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ සුවනාරී සායනයක් පැවැත්වීම
4. දඩාවතේ යන සුනඛයින් වන්ධ්‍යකරණය කිරීම
5. මදුරු නාශක වැඩ සටහන්

2011 වසරේදී වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය කණ්ඩායමක් ලෙස වැඩ කිරීමෙන් සීමිත ප්‍රතිපාදන යටතේ සමස්ථ විශ්වවිද්‍යාලයට ප්‍රජාවටම සේවය කිරීමට හැකිවිය.

## 25.පුනරාවර්තන වියදම් විස්තර

| විෂය | 2010<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| අ. පුද්ගල වැටුප් හා වේතන | 215,950,573 | 268,105,027 |
| ආ. ගමන් වියදම් | 630,630 | 1,006,540 |
| ඇ. සැපයුම් | 19,779,501 | 22,634,745 |
| ඈ. නඩත්තු | 6,210,143 | 7,613,077 |
| ඉ. ගිවිසුම් ගත සේවා | 61,797,148 | 80,740,847 |
| ඊ. අනෙකුත් | 6,832,695 | 9,590,867 |
| **එකතුව** | **311,200,690** | **389,691,103** |

## 26. මූලධන වියදම් විස්තර

| විෂය | 2010<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| අ. ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ අත්පත්කර ගැනීම් | 21,328,125 | 35,815,148 |
| ආ. යන්ත්‍ර අත්පත්කර ගැනීම් | - | - |
| ඇ. ගොඩනැගිලි සහ සවිකිරීම් අත්පත්කර ගැනීම් | - | - |
| ඈ. අනෙකුත් (පොත් සහ අනෙකුත් භාණ්ඩ) | 6,158,061 | 10,559,440 |
| **එකතුව** | **27,486,186** | **46,374,588** |

## 27. මූල්‍ය ප්‍රගතියේ විස්තර (වියදම්)

| විෂය | 2011 සඳහා ප්‍රතිපාදන<br>රු. | 2011 වර්ෂය තුළ වියදම් කිරීම්<br>රු. | ඉතිරිකිරීම් /අතිරික්තය<br>රු. |
|---|---|---|---|
| අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන | 379,463,000 | 389,691,103 | (10,228,103) |
| ආ. ව්‍යාපෘති හැර මූලධන | - | - | - |
| ඇ. ව්‍යාපෘති – දේශීය අරමුදල් | 148,741,000 | 148,020,487 | 720,513 |
| ඈ. ව්‍යාපෘති - විදේශීය අරමුදල් | - | - | - |
| **එකතුව** | **528,204,000** | **537,711,590** | **(9,507,590)** |

## 28. මූල්‍ය ප්‍රගතියේ විස්තර (උපයන ලද ආදායම්)

| ආදායම් ප්‍රභවය | 2011 සඳහා ප්‍රතිපාදන රු. | 2011 වර්ෂයේ රැස්කිරීම් රු. | ඌනතාවය/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. උපාධිඅපේක්ෂක අධ්‍යයන | - | 4,201,396 | - |
| ආ. පශ්චාත් උපාධි අධ්‍යයන | - | 11,610,421 | - |
| ඇ. උපදේශන | - | 938,450 | - |
| ඈ. අනෙකුත් | - | 25,727,684 | - |
| **එකතුව** | **-** | **42,477,951** | **-** |

## 29. මූල්‍ය ප්‍රගති සමාලෝචනය – 2011

| විෂය | සමීකරණය | එක් ශිෂ්‍යයෙකු සඳහා වියදම රු. |
|---|---|---|
| අ. ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම් | ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම් / ශිෂ්‍ය සංඛ්‍යාව | 178,921.53 |
| ආ. ඒක ශිෂ්‍ය මූලධන වියදම් | ඒක ශිෂ්‍ය මූලධන වියදම් / ශිෂ්‍ය සංඛ්‍යාව | 21,292.28 |
| **එකතුව** | | **200,213.81** |

# 30. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය අරමුදල්)

| නම සහ විස්තරය | ණය/ප්‍රතිපාදන | අරමුදල් ප්‍රභවය | මුළු පිරිවැයේ එකතුව රු. | RFA රු. | DF රු. |
|---|---|---|---|---|---|
| දේශන ශාලා – ව්‍යවහාරික විද්‍යා පීඨය (දෙවන අදියර පළමු කොටස සහ දෙවන අදියර දෙවන කොටස) , කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 118,200,000 | - | - |
| දේශන ශාලා – පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය (දෙවන අදියර පළමු කොටස සහ දෙවන අදියර දෙවන කොටස) , මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 97,000,000 | - | - |
| පරිපාලන ගොඩනැගිල්ල - කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 85,100,000 | - | - |
| දේශන ශාලා – කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨය, මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 100,000,000 | - | - |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය දෙවන අදියර - කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 17,500,000 | - | - |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය පළමු අදියර - මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 7,500,000 | - | - |
| දේශන ශාලා පළමු අදියර – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය, කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 165,000,000 | - | - |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා තනිකඩ නේවාසිකාගාර, මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 49,000,000 | - | - |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා තනිකඩ නේවාසිකාගාර, කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 49,000,000 | - | - |
| දේශන ශාලා දෙවන අදියර - කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය, මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 125,000,000 | - | - |
| නේවාසිකාගාර හතරවන අදියර- කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 69,000,000 | - | - |
| නේවාසිකාගාර පස්වන අදියර - මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 69,000,000 | - | - |
| නේවාසිකාගාර හයවන අදියර - මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 69,000,000 | - | - |

## 31. ව්‍යාපෘතිවල වියදම් පිළිබඳ විස්තර (දේශීය අරමුදල්)

| නම | මුළු පිරිවැයේ එකතුව රු. | 2010 වර්ෂයේ වියදම රු. | 2011 වර්ෂයේ වියදම රු. | 31.12.2011 වර්ෂය වන විට මුළු වියදම | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| නේවාසිකාගාර ව්‍යාපෘතිය III අදියර | | 8,680,013 | - | 30,769,541 | 100% |
| දේශන ශාලා – ව්‍යවහාරික විද්‍යා පීඨය (දෙවන අදියර ) | 118,200,000 | 20,629,117 | 7,813,605 | 84,629,355 | 100% |
| දේශන ශාලා – පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය (දෙවන අදියර) | 97,000,000 | 20,605,949 | 10,172,422 | 60,638,696 | 100% |
| පරිපාලන ගොඩනැගිල්ල | 85,100,000 | - | 10,032,083 | 84,441,378 | 100% |
| දේශන ශාලා – කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය (පළමු අදියර) | 100,000,000 | 25,740,870 | - | 77,466,900 | 100% |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය දෙවන අදිය- කුලියාපිටිය | 17,500,000 | 2,773,261 | 2,164,444 | 8,313,980 | 20% |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය පළමු අදියර - මාකඳුර | 7,500,000 | 1,623,576 | 1,496,007 | 3,119,583 | 100% |
| පීඨ ගොඩනැගිල්ල – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 165,000,000 | - | 30,709,216 | 30,709,216 | 60% |
| කාර්යය මණ්ඩල නේවාසිකාගාර - කුලියාපිටිය | 49,000,000 | - | 5,745,813 | 5,745,813 | 20% |
| කාර්යය මණ්ඩල නේවාසිකාගාර - මාකඳුර | 49,000,000 | - | 5,840,071 | 5,840,071 | 20% |
| ප්‍රවේශ මාර්ගය - මාකඳුර | | - | 292,500 | 292,500 | |
| **එකතුව** | | **80,052,786** | **74,266,161** | **391,967,033** | |

## 32. 2011 වර්ෂයේදී යටිතල පහසුකම් ලැබීම් පිළිබඳ විස්තර

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | වියදම රු. | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| පීඨ ගොඩනැගිල්ල - පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය II අදියර (I කොටස) | 10,172,422 | 100% |
| පීඨ ගොඩනැගිල්ල - පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය II අදියර (II කොටස) | | |
| පීඨ ගොඩනැගිල්ල - ව්‍යවහාරික විද්‍යා පීඨය II අදියර (I කොටස) | 7,813,605 | 100% |
| පීඨ ගොඩනැගිල්ල - ව්‍යවහාරික විද්‍යා පීඨය II අදියර (II කොටස) | | |
| පීඨ ගොඩනැගිල්ල - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය I අදියර | - | 100% |
| පරිපාලන ගොඩනැගිල්ල | 10,032,083 | 100% |
| පීඨ ගොඩනැගිල්ල - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය I අදියර | 30,709,216 | 60% |
| වෛද්‍ය මධ්‍යස්ථානය I අදියර - මාකඳුර | 1,496,007 | 100% |
| වෛද්‍ය මධ්‍යස්ථානය II අදියර – කුලියාපිටිය | 2,164,444 | 20% |
| අධ්‍යයන කාර්යය මණ්ඩල තනිකඩ නේවාසිකාගාර, මාකඳුර | 5,840,071 | 20% |
| අධ්‍යයන කාර්යය මණ්ඩල තනිකඩ නේවාසිකාගාර, කුලියාපිටිය | 5,745,813 | 20% |

**1971 අංක 38 දරණ මුදල් පනතේ 13(6) ඡේදයේ ප්‍රකාර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන පිළිබඳ ව්‍යවස්ථාපිත වාර්තාව**

1. මෙම මූල්‍ය ප්‍රකාශය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106(1) සහ 107(බී) ඡේදයන්ට හා කලින් කල නීතිගත කරන ලද සංශෝධනවලට හා 1971 අංක 38 දරණ මුදල් පනතට අනුව පිළියෙල කොට ඉදිරිපත් කරනු ලැබේ.

   (i) ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා අර්ථ නිරූපනය කිරීම සංගතතාවයක් පවත්වා ගනිමින් හා රාජ්‍ය අංශයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී සාමාන්‍යයෙන් පිළිපදිනු ලබන පොදුවේ පිළිගත් පිරිවයන්ට අනුකූලව මෙම ගිණුම් අර්ථ නිරූපනය හා ඉදිරිපත් කිරීම සිදු කොට ඇත.

අ **මූල්‍ය හෙළිදරව්ව**

(1) **රජයේ ප්‍රතිපාදන**

| | | | |
|---|---|---|---|
| | රු. | **2011** | **2010** |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. | 379,462,613.00 | 301,331,000.00 |
| මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. | 14,860,550.00 | 15,252,100.00 |
| ශිෂ්‍යාධාර ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. | 10,738,100.00 | 10,202,600.00 |
| මූලධන101 පුනරුත්තාපන වැඩසටහන | රු. | 25,200,000.00 | 18,500,000.00 |
| මූලධන 102 උපකරණ පොත් හා වාර සඟරා | රු. | 34,541,000.00 | 39,000,000.00 |
| මූලධන 103 ස්ථිර ඉදිකිරීම් | රු. | 89,000,000.00 | 64,000,000.00 |
| තොරතුරු තාක්ෂණය සඳහා විශේෂ මූලධන ප්‍රතිපාදන | රු. | - | 1,000,000.00 |
| **එකතුව** | රු. | **553,802,263.00** | **449,285,700.00** |

| | | | |
|---|---|---|---|
| **පශ්චාත් උපාධි පාඨමාලා** | | **2011** | **2010** |
| ව්‍යාපාර පරිපාලනපති පාඨමාලාව – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | රු. | 4,933,225.00 | 2,218,500.00 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | රු. | 6,677,196.44 | 4,955,767.11 |
| **බාහිර උපාධි පාඨමාලා** | | | |
| කෘෂිකර්ම කළමනාකරණ පාඨමාලාව – මාකඳුර | රු. | 4,201,396.50 | 3,049,658.00 |
| **ඩිප්ලෝමා පාඨමාලා** | | | |
| ඉංග්‍රීසි ඩිප්ලෝමාව | රු. | 4,787,600.00 | 7,970,300.00 |
| රක්ෂණ ඩිප්ලෝමාව – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | රු. | 3,517,302.80 | 2,215,250.00 |
| **සහතික පත්‍ර පාඨමාලා** | | | |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර – කුලියාපිටිය | රු. | 814,500.00 | 1,057,700.00 |
| බාහිර පරිගණක පාඨමාලා – මාකඳුර | රු. | 1,950,087.21 | 1,056,417.00 |
| English through e Learning – මාකඳුර | රු. | - | 343,279.00 |
| Bio-Informatics | රු. | - | 161,773.00 |
| CBA – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | රු. | - | 7,000.00 |
| **පර්යේෂණ ප්‍රතිපාදන** | | | |
| SANDEE ව්‍යාපෘතිය | රු. | - | 483,185.00 |
| NSF ප්‍රතිපාදන | රු. | 4,307,174.00 | 558,939.00 |
| IUCN ප්‍රතිපාදන | රු. | 127,550.00 | - |
| **අනෙකුත් ප්‍රතිපාදන** | | | |
| FLICT | රු. | - | 1,690,000.00 |
| IDRC | රු. | 10,223,469.72 | |
| බාහිර කටයුතු මධ්‍යස්ථානය - මාකඳුර | රු. | 938,450.00 | 1,079,058.00 |
| **එකතුව** | රු. | **42,477,951.67** | **26,846,826.11** |

(2) 2010 වර්ෂයේදී ආදායම ඉක්මවා ගිය වියදම වූ රු. (91,494,571.70) 2011 වර්ෂයේදී රු. (100,267,068.55). මෙය ප්‍රධාන වශයෙන්ම This is mainly due to the accounting treatment of Depreciation.

(3) පසුගිය වසරේ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා ගෙවූ ණය හා අත්තිකාරම් මුදලින් අයකර ගත යුතු වූ රු. 24,617,556.14 මුදල මෙම වසරේදී රු. 25,889,537.55.

(4) 2010 වසරේදී රු. 6,765,535.06 වූ විශ්වවිද්‍යාලය මඟින් රැස් කරන ලද අරමුදල ආයෝජනයෙහි වටිනාකම ශේෂ පත්‍ර දිනය වන විට රු. 12,275,144.46 ක් විය.

(5) අභ්‍යන්තර ආදායම් ප්‍රභවය

| **2010 රු.** | **2011 රු.** | **වෙනස රු.** | **වෙනස ප්‍රතිශතයක් ලෙස %** |
|---|---|---|---|
| 5,888,174.34 | 7,614,628.45 | 1,726,454.11 | 29.32% |

## 2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

| **මෙහෙයුම් ආදායම** | **මෙම වර්ෂය 2011 (රුපියල් '000)** | **පසුගිය වර්ෂය 2010 (රුපියල් '000)** |
|---|---:|---:|
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන | 379,463 | 301,331 |
| ශිෂ්‍යාධාර සඳහා රජයේ ප්‍රතිපාදන | 10,746 | 10,224 |
| මහපොළ ශිෂ්‍යත්ව සඳහා රජයේ ප්‍රතිපාදන | 14,861 | 15,252 |
| පුනරාවර්තන ප්‍රතිපාදන (පුනරුත්තාපන ස්වභාවයේ) | 1,214 | 728 |
| ආයෝජන පොලිය | 12 | 12 |
| කාර්ය මණ්ඩල ණය පොලිය | 1,003 | 863 |
| දේපල කුලිය | 509 | 333 |
| පැරණි භාණ්ඩ අලෙවිය | 125 | 13 |
| එලදා විකිණීම | 411 | 603 |
| විවිධ ලැබීම් | 4,728 | 3,428 |
| ලියාපදිංචි ගාස්තු (උපාධි අපේක්ෂකයින්) | 729 | 576 |
| විභාග ගාස්තු (උපාධි අපේක්ෂකයින්) | 43 | 37 |
| පුස්තකාලයීය දඩ | 54 | 23 |
| **මෙහෙයුම් ආදායම් එකතුව** | **413,898** | **333,423** |
| **මෙහෙයුම් වියදම (ක්ෂයවීම් ඇතුළුව)** | | |
| පුද්ගල වැටුප් හා වේතන (සටහන 01) | 268,105 | 215,950 |
| ගමන් වියදම් | 1,007 | 631 |
| සැපයුම් හා පාරිභෝජන | 22,635 | 19,780 |
| නඩත්තු | 7,613 | 6,210 |
| ගිවිසුම්ගත සේවා | 80,741 | 61,797 |
| ක්ෂයවීම් | 97,919 | 87,513 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 9,591 | 6,833 |
| මහපොළ හා ශිෂ්‍යාධාර ගෙවීම් | 25,606 | 25,476 |
| පුනරුත්තාපන වියදම් (පුනරාවර්තන ස්වභාවයේ) | 1,214 | 728 |
| **සමස්ත මෙහෙයුම් වියදම** | **514,431** | **424,918** |
| **මෙහෙයුම් කාර්යයන්හි අතිරික්තය/හිඟය** | (100,**533**) | (**91,495**) |

| මෙහෙයුම් ආදායම | මෙම වර්ෂය 2011<br>(රුපියල් '000) | පසුගිය වර්ෂය 2010<br>(රුපියල් '000) |
|---|---|---|
| මූල්‍ය පිරිවැය | - | - |
| වත්කම් යන්ත්‍ර උපකරණ විකිණීමෙන් ලැබීම් | - | - |
| සමස්ත මෙහෙයුම් නොවන ආදායම (වියදම) | - | - |
| ශුද්ධ අතිරික්තය (ඌනතාව) - අතිවිශේෂ අයිතමයන් ගැලපීමට පෙර | (100,533) | (91,495) |
| අතිවිශේෂ අයිතම | - | - |
| **ශුද්ධ අතිරික්තය (ඌනතාව) ගත වූ කාලය තුළ** | **(100,533)** | **(91,495)** |

| | | |
|---|---|---|
| ඉදිරියට ගෙනා පෙර වර්ෂ ශේෂය | (487,049) | (356,536) |
| වර්ෂයේ ඌනතාව | (100,533) | (91,495) |
| එකතු කිරීම් - පෙර වර්ෂයේ ආදායම් | | |
| වෙනත් ගැලපීම් | 554 | 99 |
| අඩු කිරීම් - පෙර වර්ෂයේ වියදම් | | |
| වෙනත් ගැලපීම් | (286) | (39,117) |
| **ඉ/ගෙ පොදු සංචිතය** | **(587,314)** | **(487,049)** |

| සටහන 01 | | |
|---|---|---|
| වැටුප් හා වේතන | 138,281 | 131,301 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 8,282 | 6,891 |
| වෙනත් දීමනා | 75,182 | 45,246 |
| විශ්‍රාම ප්‍රතිලාභ (වි.වි.අ.අ., සේ.නි.භා.අ., විශ්‍රාම වැටුප්, පාරිතෝෂික) | 46,360 | 32,512 |
| **සමස්ත පුද්ගල ගෙවීම්** | **268,105** | **215,950** |

| .................................. | .................................... | .................................... |
|---|---|---|
| (මහාචාර්ය එස් ජේ බී ඒ ජයසේකර) | (ඊ එම් ජී ඒකනායක මයා) | (ඩී ඒ යූ ධර්මදාස මයා) |
| උපකුලපති | ලේඛකාධිකාරී | මූල්‍යාධිකාරී |

# 2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය

රු ' 000

| | සටහන | 2011 දෙසැම්බර් 31 දිනට | | 2010 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල, පිරියත සහ උපකරණ | **1** | 850,157 | | 714,194 | |
| නොනිමි වැඩ | **2** | 31,448 | | 73,241 | |
| දිගුකාලීන ආයෝජන | **3** | 6,766 | | 7,055 | |
| කාර්යය මණ්ඩල ණය | **4** | 23,970 | 912,341 | 21,309 | 815,799 |
| **ජංගම වත්කම්** | | | | | |
| වට්ටෝරුගත/ගබඩාගත | **5** | 15,529 | | 13,228 | |
| වෙළඳ හා වෙනත් ලැබීම් | **6** | 179 | | 136 | |
| කාර්යය මණ්ඩල අත්තිකාරම් | **7** | 647 | | 611 | |
| මූලධන අත්තිකාරම් | **8** | 20,455 | | 18,970 | |
| සේවා සහ සැපයුම් සඳහා අත්තිකාරම් | **9** | 1,728 | | 1,751 | |
| ඉදිරියට කළ ගෙවීම් | | 556 | | 887 | |
| අනෙකුත් ජංගම වත්කම් | **10** | 3,691 | | 6,976 | |
| ඉතිරිකිරීම් තැන්පත් | **11** | 297 | | 285 | |
| බැංකු ගිණුම් ශේෂය | **12** | 19,726 | 62,808 | 13,478 | 56,322 |
| **වත්කම්වල එකතුව** | | | **975,149** | | **872,121** |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| විවිධ ණය හිමියෝ | **13** | 14,078 | | 8,301 | |
| තැන්පත් | **14** | 3,223 | | 3,282 | |
| වීයදම් ණය හිමියෝ | **15** | 11,285 | | 10,224 | |
| වෙනත් | **16** | 39,147 | 67,733 | 39,572 | 61,379 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| මූලධන - වැයවූ මූලධන ප්‍රතිපාදන | | 1,152,631 | | 987,556 | |

| | | 2010 දෙසැම්බර් 31 දිනට | | 2009 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|
| මූලධන - වැයවූ ප්‍රතිපාදන / නොනිමි වැඩ | | 31,448 | | 73,241 | |
| වැය නොවූ මූලධන ප්‍රතිපාදන | **17** | 115 | | 734 | |
| විශේෂ ප්‍රතිපාදන | | 130,675 | 1,314,869 | 33,007 | 1,094,538 |
| පරිත්‍යාග අරමුදල් | **18** | 385 | | 377 | |
| ශිෂ්‍ය සුභසාධන අරමුදල් | | 1,194 | | 1,194 | |
| විශේෂ අරමුදල් | **19** | 1,904 | | 1,420 | |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 41,897 | 45,380 | 35,533 | 38,524 |
| **වගකීම්වල එකතුව** | | | **1,427,982** | | **1,194,441** |
| **ශුද්ධ වත්කම්වල එකතුව** | | | **(452,833)** | | **(322,320)** |
| **ශුද්ධ වත්කම් / කොටස්** | | | | | |
| ඒකාබද්ධ අරමුදල | | (487,049) | | (356,536) | |
| සංචිත | | 34,216 | (452,833) | 34,216 | (322,320) |
| **ශුද්ධ වත්කම්/කොටස්වල එකතුව** | | | **(452,833)** | | **(322,320)** |

................................ ................................ ....................................

(මහාචාර්ය ඒ එන් එෆ් පෙරේරා) (ඊ එම් ජී ඒකනායක මයා) (ඩී ඒ යූ ධර්මදාස මයා)

## 2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2011 දෙසැම්බර් 31 දිනට රු ' 000 | 2010 දෙසැම්බර් 31 දිනට රු ' 000 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | | |
| අතිරික්තය/(ඌනතාවය) සාමාන්‍ය ක්‍රියාකාරීත්වය | (91,495) | (70,801) |
| **එකතු කිරීම්: සංචලනය නොවන මුදල්** | | |
| ක්ෂය | 87,513 | 58,693 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 7,240 | 4,093 |
| පාරිතෝෂික ගෙවීම් | (876) | (560) |
| පෙර වර්ෂයේ ගැලපීම් - පෙර වර්ෂය වෙනුවෙන් ලද ආදායම් | | |
| පෙර වර්ෂයේ ගැලපීම් - පෙර වර්ෂය වෙනුවෙන් කළ ගෙවීම් | | |
| තොගයේ වැඩිවීම්/අඩුවීම් | (2,301) | (389) |
| ණයගැතියෝ වැඩිවීම්/අඩුවීම් | (43) | 72 |
| කාර්යය මණ්ඩල ණය වැඩිවීම්/අඩුවීම් | (2,661) | (952) |
| කාර්යය මණ්ඩල අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම් | (36) | (238) |
| සැපයුම් සහ සේවා අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම් | 119 | (289) |
| ඉදිරියට කළ ගෙවීම් වැඩිවීම්/අඩුවීම් | 331 | (254) |
| අනෙකුත් ජංගම වත්කම් වැඩිවීම්/අඩුවීම් | 3,273 | 4 |
| විවිධ ණයහිමියෝ වැඩිවීම්/අඩුවීම් | (988) | 1,534 |
| තැම්පත් වැඩිවීම්/අඩුවීම් | (59) | (491) |
| වියදම් ණයහිමියෝ වැඩිවීම්/අඩුවීම් | 1,061 | 3,554 |
| අනෙකුත් ජංගම වගකීම් වැඩිවීම්/අඩුවීම් | 5,008 | 6,772 |
| **ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | 6,086 | 748 |
| **ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | 6,086 | 748 |
| **ආයෝජන ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | | |
| පිරියත හා උපකරණ මිලදී ගැනීම් | (123,822) | (134,017) |
| සීමිත අරමුදල් ආයෝජන | 289 | 882 |
| පරිත්‍යාග අරමුදල් | 8 | 11 |
| **ශුද්ධ ආයෝජන ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | (123,525) | (133,124) |

| මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය | 2011 දෙසැම්බර් 31 දිනට රු ' 000 | 2010 දෙසැම්බර් 31 දිනට රු ' 000 |
|---|---|---|
| මූලධන ප්‍රතිපාදන - පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම් | 15,000 | 21,250 |
| මූලධන ප්‍රතිපාදන - වත්කම් අත්පත්කර ගැනීම් | 39,000 | 37,000 |
| මූලධන ප්‍රතිපාදන - ස්ථිර ඉදිකිරීම් | 64,000 | 70,250 |
| විශේෂ ප්‍රතිපාදන | 5,203 | 2,855 |
| විශේෂ ලැබීම් | 484 | 366 |
| CARP අරමුදල | - | - |
| **ශුද්ධ මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | **123,687** | **131,721** |
| **ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)** | **6,248** | **(655)** |
| | **13,478** | **14,133** |
| | **19,726** | **13,478** |

| **මුදල් සහ මුදල් සමාන දෑ පිළිබඳ විශ්ලේෂණය** | 2011 දෙසැම්බර් 31 දිනට | 2010 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| මහජන බැංකුව කුලියාපිටිය - ගි. අ. 028100151586123 | 7,309 | 4,432 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100120000171 | 4,788 | 2,948 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100140000165 | 259 | 207 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0002874770 | 3,841 | 3,740 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 00001473507 | 1,074 | 292 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0001473508 | 259 | 70 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0001473388 | 29 | 637 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100120000963 | 297 | 10 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100130041538 | 1,870 | 1,142 |
| එකතුව | 19,726 | 13,478 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / தனது இல / My No: එස්ඩබ්/පීඊ/බී/1-2/ව.වි.වි/2011 අවසන් ගිණුම්/2012/28

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2012 ඔක්තෝබර් 31 දින.

උපකුලපති,

ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය.

ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ-மெயில் / E-mail: oaggov@sltnet.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතතාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳව ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.
මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

02. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18 ප්‍රකාරට වටිනාකම රු.15,847,454 ක් වූ ශේෂ පත්‍ර අගය ශූන්‍ය ලෙස පෙන්වා තිබූ වත්කම් විෂයයන් 07 කට අදාලව විශ්ව විද්‍යාලයේ මෙහෙයුම් කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් අවස්ථාවන් නිරීක්ෂණය විය.

(අ) පොලී ආදායම් මුදල් පදනම මත ගිණුම්ගත කළයුතු වුවද, විශ්ව විද්‍යාලයට විවිධ අරමුදල්වලින් ලැබී තිබූ රු.1,457,411 ක පොලී මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනයේ 2.4 හි සඳහන් ප්‍රතිපත්තියට අනුව තොග නිකුත් කිරීම ප්‍රථම ලැබීම්, ප්‍රථමයෙන් නිකුත් කළයුතු වුවත්, ඉන් බැහැරවූ අවස්ථා කිහිපයක්ද, 2.5 හි සඳහන් ප්‍රතිපත්තියට අනුව නොනිමි කොන්ත්‍රාත් වැඩ මුදල් පදනම මත ගිණුම් තැබීම වෙනුවට උපචිත පදනම මත ගිණුම් තැබූ අවස්ථා දෙකක්ද නිරීක්ෂණය විය.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී සේවක සංවර්ධන කටයුතු සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබාදුන් රු.4,500,000 ක් සහ පර්යේෂණ කටයුතු වෙනුවෙන් ජාත්‍යන්තර සංගමයක් සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ලබාදුන් රු.967,750 ක් වූ ප්‍රදානයන් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) විශ්ව විද්‍යාලය විසින් පවත්වන ලද එහෙත් නිමකරන ලද විවිධ පාඨමාලාවල ලාභයෙන් 10% ක් උපකුලපති අරමුදලට බැරකළ යුතු බව අදාල ඇස්තමේන්තුවේ සහ උපලේඛනවල දක්වා තිබුණත්, පාඨමාලා 02 කට අදාලව එහි අදියර 04 කින් රු.352,620 ක් බැර කර නොතිබූ අතර, තවත් පාඨමාලා 04 කට අදාල අදියර 10 කින් බැරකළ යුතු ප්‍රමාණයවත් දක්වා නොතිබුණි.

(ඇ) පශ්චාත් උපාධි පාඨමාලාව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන කුලියාපිටිය ලංකා බැංකු ජංගම ගිණුමේ 2011 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා හඳුනා නොගත් තැන්පතු ලෙස තිබූ රු.435,750 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 1999 වර්ෂයේ සිට පැවත එන වටිනාකම රු.121,342 ක්වූ ණයගැති ශේෂ 15 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ කීපයක සිට පැවත එන වැටුප් අත්තිකාරම් ශේෂය තුළ ඇතුළත් වී තිබූ 2010 දෙසැම්බර් 31 දක්වා නිරවුල් නොකරන ලද වැටුප් අත්තිකාරම් ශේෂය රු.50,300 ක් විය.

(ඇ) 2007 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 05 කදී ලබාදෙන ලද කොන්ත්‍රාත් අත්තිකාරම් රු.5,550,981 ක්ද, 1996 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා සැපයුම් අත්තිකාරම් වශයෙන් අවස්ථා 31 කදී ලබාදෙන ලද රු.1,142,790 ක් සහ 2003 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 21 කදී ලබාදෙන ලද රු.203,530 ක සේවා අත්තිකාරම්ද 2012 මාර්තු 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

වටිනාකම රු.121,054,602 ක් වූ ඉඩම්වලට අදාල සින්නක්කර ඔප්පු, වටිනාකම රු.737,866,826 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 04 කට අදාල උපලේඛන හා ස්ථාවර වත්කම් ලේඛනය සහ වටිනාකම රු.6,607,263 ක් වූ ජල සැපයුම් යෝජනා ක්‍රමයේ වත්කම්වලට අදාල උපලේඛනද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2.6 නීති, රීති රෙගුලාසිවලට අනුකුල නොවීම

පහත සඳහන් අනුකුල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසිවලට යොමුව | අනුකුල නොවීම |
| --- | --- |
| (අ) පනත් | |
| 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ XIII පරිච්ඡේදයේ 99 (ඇ) වගන්තිය | කවර හෝ ප්‍රභවයකින් හෝ උපයා ගනු ලබන සියලුම ආදායම් විශ්ව විද්‍යාල අරමුදලට බැරවිය යුතු වුවත්, එම නියමයෙන් බැහැරව පාඨමාලා 04 ක් සහ ව්‍යාපෘති 6 ක් යටතේ ලද රු.19,127,924 ක් විශ්ව විද්‍යාල අරමුදලට බැරකර නොතිබුණ අතර, ඒවා මූල්‍ය ප්‍රකාශනවල වෙනත් වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. |

(ආ) විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහය
---
xxvii පරිච්ඡේදයේ 2.1.1 වගන්තිය

විශ්ව විද්‍යාලය සතු සියලුම වාහන ලේඛකාධිකාර්වරයාගේ නමින් ලියාපදිංචි කළ යුතු වුවද, වයඹ විශ්ව විද්‍යාලය සතු වාහන 06 ක් එසේ ලියාපදිංචි කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය
---
xix පරිච්ඡේදයේ 5.5 වගන්තිය

විශ්ව විද්‍යාලයට අයත් නිලනිවාස හා බදු පදනම මත ලබාගෙන ඇති නිවාසවල පදිංචිව සිටින නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කුලී අයකිරීම වෙනුවට විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල නේවාසික කමිටුව විසින් තීරණය කරන ලද ක්‍රමයකට කුලී ගණනය කර අයකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර අයකළ යුතු කුලියට වඩා රු.714,446 ක නිවාස කුලී අඩුවෙන් අයකරගෙන තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
---
(i) මු.රෙ.371 (2) (ආ) වගන්තිය

අතුරු අග්‍රිමයක් වශයෙන් එක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම මුදල රු. 20,000 ක් වුවද, එම සීමාව ඉක්මවා අවස්ථා 05 කදී රු.173,300 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි.

(ii) මු.රෙ.396 (ඇ)

නිකුත් කරන ලද දින සිට මාස 06 ක කාලයක් ඉක්මවා තිබූ වටිනාකම රු.57,800 ක් වූ චෙක්පත් 28 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(iii)මු.රෙ.571(2) වගන්තිය

තැන්පත් කළ දින සිට වර්ෂ දෙකක් ඉක්මවන ලද රු.3,897,713 ක් වටිනා විවිධ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(iv)මු.රෙ.835 (1) | ගොඩනැගිලි බද්දට ලබාගැනීම සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, ඒ සඳහා අනුමැතිය ලබානොගෙන ගොඩනැගිලි බද්දට ලබාගෙන ඒ සඳහා බදු මුදල් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.93,869,000 ක් ගෙවා තිබුණි. දැනට අදාල අනුමැතිය ලබාගැනීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකර ඇති බව උපකුලපතිවරයාගේ පිළිතුරේ දක්වා තිබුණි.

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

11/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළදී උපකුලපතිවරයාට හිමි ඉන්ධන සීමාව ඉක්මවා රු.91,244 ක් වටිනා අමතර ඉන්ධන ලබාගෙන තිබුණු අතර, මේ සඳහා 2012 අගෝස්තු 23 දින පාලක සභා අනුමැතිය ලබාගෙන තිබුණි.

2.2.7 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

2011 වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයට ආරක්ෂක සේවාව ලබාගැනීම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2011 ජුනි 01 සිට 2012 ජනවාරි 31 දක්වා කාලයකට ගිවිසුම් අත්සන් කර, එම ගිවිසුමේ වලංගු කාලය ඉදිරියට තිබියදීත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක.HE/AD/Security හා 2011 සැප්තැම්බර් 22 දිනැති ලිපියේ උපදෙස් මත කටයුතු කර වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුගෙන් ආරක්ෂක සේවාව ලබාගැනීම හේතුවෙන් මාස 2 1/2 ක කාලයක් වෙනුවෙන් විශ්ව විද්‍යාල අරමුදලට රු.4,768,340 ක පාඩුවක් සිදුවී තිබුණි.

03. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන, ගණන් ගැනීමට පෙර රු.506,817,000 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.419,030,000 ක් විය. විශ්ව විද්‍යාලය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණ රු.406,284,000 ක ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.100,533,000 දක්වා අඩු වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණ රු.327,535,000 ක ප්‍රදාන ගැලපීමෙන් පසුව එම වර්ෂය සඳහා වූ ඌණතාවය රු.91,495,000 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු.9,038,000 ක පිරිහීමක් සිදුවී තිබුණි.

මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීමට පර්යේෂණ දීමනා රු.11,250,000 කින් වැඩිවීම, අනෙකුත් දීමනා රු.5,833,000 කින් වැඩිවීම හා පාර්තෝෂිත දීමනා රු.8,833,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

2011 වර්ෂයේ එක් එක් පීඨයන් සඳහා දරා ඇති වියදම, ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒක ශිෂ්‍ය පිරිවැය පිළිබඳ වූ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය |
|---|---|---|---|---|---|
| 2011 වර්ෂයේ වියදම | රු. | 44,648,076 | 50,288,773 | 59,222,043 | 59,739,834 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | | 1,079 | 358 | 396 | 323 |
| ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | 41,379 | 140,471 | 149,550 | 184,953 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2011 වර්ෂය තුළ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය හා ව්‍යවහාරික විද්‍යා පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය අනෙකුත් පීඨවලට සාපේක්ෂව ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) විශ්ව විද්‍යාලයේ පීඨ තුනක් සඳහා තෝරාගත් ශිෂ්‍යයන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් වෙනත් විශ්ව විද්‍යාලවලට මාරු වී ගොස් තිබුණි. මෙය පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් බව නිරීක්ෂණය විය. මේ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | වයඹ විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | වෙනත් විශ්ව විද්‍යාලවලට මාරු වී ගිය ශිෂ්‍ය සංඛ්‍යාව | වෙනත් විශ්ව විද්‍යාලවලට මාරුවී ගිය සංඛ්‍යාව ලියාපදිංචි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|---|
| (i). | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 344 | 17 | 5 |
| (ii). | ව්‍යවහාරික විද්‍යා පීඨය | 146 | 98 | 67 |
| (iii). | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 115 | 45 | 39 |
| (iv). | පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය | 110 | 45 | 41 |

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) වයඹ විශ්ව විද්‍යාලයේ සේවයේ නියුතුව සිටි අචාර්යවරුන් 08 දෙනෙකු විදේශගත වීමේදී, විශ්ව විද්‍යාලය සමඟ එකඟ වූ ගිවිසුම් ප්‍රකාර නියමිත දින යලි සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් ගිවිසුම් කඩකර තිබුණ අතර, ඒ අනුව ඔවුන්ගෙන් විශ්ව විද්‍යාලයට අයවිය යුතු මුදල් ප්‍රමාණයේ හිඟ මුදල වූ රු.10,524,210 ක් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේදී ප්‍රසම්පාදන පරපාටියෙන් බැහැරව පුද්ගලික ආයතනයකින් රු.4,130,770 ක් වටිනා පුස්තකාල පොත් ණයට ලබාගෙන තිබූ අතර, මූල්‍ය ප්‍රකාශනවල එම වගකීම හෙළිදරව් කර නොතිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

විශ්ව විද්‍යාලයේ පවිත්‍රතා කටයුතුවලට අදාල කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අදාල ගිවිසුම ප්‍රකාරව දිනපතා සේවයේ යෙදවිය යුතු සේවක සංඛ්‍යාව 42 ක් වුවද, යෙදවූ සේවක සංඛ්‍යාව අඩුවීමේ හේතුවෙන් 2011 නොවැම්බර් මස වැඩකරන දින 22 ක් තුළ වැඩ කළයුතු මිනිස් දින 307 ක් අඩුවෙන් වැඩකර තිබියදී ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් කර තිබුණි.

4.4 අරමුදල් ඌණ උපයෝජනය

---

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) තොරතුරු තාක්ෂණ අරමුදල සඳහා 2010 වර්ෂයේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබී තිබුණ රු.1,000,000 ක මුදල 2011 වර්ෂයේදීද කිසිදු කාර්යයකට යොදවා නොතිබුණි.

(ආ) වසර 2000 සිට 2010 දක්වා මහපොළ අරමුදලේ හා ශිෂ්‍යාධාර අරමුදලේ නොගෙවා ඉතිරි මුදල් පිළිවෙලින් රු.633,200 ක් හා රු.560,400 ක් වූ අතර, එම මුදල්වල 2011 ජනවාරි 01 දිනට ශේෂය වූ රු.1,193,600 ක මුදල ඉහත අරමුදල්වලට බැර නොකර ශිෂ්‍ය සුභසාධක අරමුදලට බැර කර වසර ගණනාවක් තිස්සේ නිශ්කාර්යව තිබී 2011 දෙසැම්බර් 31 දින විශ්ව විද්‍යාල අරමුදලට ගෙන තිබුණි.

4.5 ආර්ථික නොවූ ගණුදෙනු

---

කුලියාපිටිය පරිශ්‍රයේ ශිෂ්‍ය නේවාසිකාගාර 03 ක් බදු ගැනීමේදී පාලක සභාවේ අනුමැතිය මත, තක්සේරු වටිනාකම ඉක්මවා රු.421,000 ක් ගෙවීම් කර තිබුණි.

4.6 හඳුනාගන්නා ලද පාඩු

නේචර් බයෝටෙක්නොලොජි (Nature Biotechnology) නමැති සඟරාව මිළදී ගැනීම සඳහා වර්ෂ 2003-2011 දක්වා කාලපරාසය තුළ ගෙවන ලද රු.1,803,968 අත්තිකාරම්වලට අදාල රු.631,413 ක් වටිනා සඟරාද, 2007 වර්ෂයේදී විදේශීය පෞද්ගලික ආයතනයකට සඟරා මිළදී ගැනීම සඳහා ගෙවන ලද රු.363,152ක අත්තිකාරම්වලට අදාල රු.135,690 ක් වටිනා සඟරාද 2012 මාර්තු 31 දින වනවිටත් පුස්තකාලයට ලැබී නොතිබුණි.

4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත කරුණු අනාවරණය විය.

(අ) පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨයේ රථගාල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ අවම ලංසුව ඉංජිනේරු ඇස්තමේන්තුවේ වටිනාකම වූ රු.857,525 ට වඩා 5.28% ක වැඩිවීමක් වුවද, එහි ඇතුළත් රු.37,000 ක වැඩ කොටස් ඉටුනොකර තිබූ අතර, රු.138,796 ක අමතර වැඩ සහ වැඩියෙන් කරන ලද වැඩ වටිනාකම්ද සමඟ විධිමත් අනුමැතියකින් තොරව රු.993,087 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) පරිපාලන ගොඩනැගිල්ල ඇලුමිනියම්වලින් පාර්ටිෂන් කිරීම කොන්ත්‍රාත්තුවේ අවම ලංසුව වූ රු.413,175 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර, එය ඉටුනොකිරීම හේතුවෙන් දෙවන අවම ලංසුවට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර, පළමු කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධන සුරක්ෂණයෙන් අයකරගත යුතුව තිබූ රු.41,317 ක් අයකරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තු පිළියෙල නොකර රු.1,756,147 ක සෘජු ශ්‍රම පදනම මත ඉදිකිරීම් කර තිබුණි. ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී කාලය අපතේ යැවීමක් සිදුවන බැවින්, ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව ඉදිකිරීම් කළ බව උපකුලපතිවරයා දන්වා ඇත.

(ඈ) පරීක්ෂා කරන ලද ව්‍යාපෘති 05 කදී කොන්ත්‍රාත් වටිනාකමින් 14% - 27% දක්වා ප්‍රමාණයක් වැඩ කොටස් අත්හැර දමා තිබූ අතර, අමතර වැඩ හා වෙනස්වීම් 15% - 26% දක්වා ප්‍රමාණයක් විය. මේ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඉ) විශ්ව විද්‍යාලයේ අනුමත ප්‍රධාන ගොඩනැගිලි සැලැස්මෙහි ඇතුළත් නොවූ වටිනාකම රු.2,025,962 ක් වූ විවිධ ඉදිකිරීම් සමාලෝචිත වර්ෂය තුළදී පාලක සභා අනුමැතියෙන් තොරව සිදුකර තිබුණි.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

4.8.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2011 දෙසැම්බර් 31 දිනට වයඹ විශ්ව විද්‍යාලයේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| | අනුමත | | තථ්‍ය | | පුරප්පාඩු/(අතිරික්ත) | |
|---|---|---|---|---|---|---|
| | අධ්‍යයන | අනධ්‍යයන | අධ්‍යයන | අනධ්‍යයන | අධ්‍යයන | අනධ්‍යයන |
| විධායක | 162 | 31 | 118 | 25 | 44 | 06 |
| ද්විතියික | 83 | 152 | 88 | 141 | (05) | 11 |
| ප්‍රාථමික | - | 138 | - | 119 | - | 19 |
| වෙනත් | - | - | 13 | 29 | 13 | (29) |
| | 245 | 321 | 219 | 314 | 52 | 07 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශිෂ්‍යයින්ගේ අධ්‍යාපනයට සෘජුවම බලපෑමක් ඇතිකරන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මහාචාර්යවරුන් , ආචාර්යවරුන්, දේශකයන් හා දේශක (පරිවාස) යන කාණ්ඩවල පුරප්පාඩු 44 ක් පැවතුනි.

(ආ) අධ්‍යයන අංශයේ තාවකාලික නිදර්ශකයන් හා නිබන්ධකයින්ගේ අනුමත සංඛ්‍යාව වූ 58 ඉක්මවා 22 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී බාහිර දේශකයින් 13 දෙනෙකු බඳවාගෙන තිබූ අතර, ඒ සඳහා රු.1,202,715 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ඈ) අනුමත සේවක සංඛ්‍යාවෙහි කම්කරු පුරප්පාඩු 19 ක් තිබියදී ඒ සඳහා බඳවාගැනීමෙන් තොරව බාහිර ශ්‍රම සේවා සපයන ආයතනයකින් කම්කරුවන් 29 දෙනෙකු බඳවාගෙන රු.4,766,716 ක මුදලක් ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය

5.1 සංයුක්ත සැලැස්ම

විශ්ව විද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂයද ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි.

5.2 ක්‍රියාකාර් සැලැස්ම

---------------------

ක්‍රියාකාර් සැලැස්මට අනුව, රු.28,189,988 ක ප්‍රතිපාදන වලින් ඉදිකිරීමට නියමිතව තිබූ ගොඩනැගිලි හා රු.12,459,101 ක ප්‍රතිපාදන වලින් මිලදී ගැනීමට නියමිතව තිබූ පුස්තකාල පොත් වලට අදාලව, සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙළින් රු.27,079,735 ක් හා රු.9,186,780 ක් වියදම් දරා තිබූ අතර, 2011 දෙසැම්බර් 31 දිනට පිළිවෙළින් එම වැය විෂයයන් දෙකෙහි ඉතිරිය රු.1,110,252 ක් හා රු.3,272,321 ක් විය.

5.3 විගණන හා කළමනාකරණ කමිටු

------------------------------------

විශ්ව විද්‍යාලය විසින් විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළදී එහි රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

5.4 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) විශ්ව විද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂයන් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. මේ හේතුවෙන් පොත් හා ප්‍රකාශන මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණ රුපියල් මිලියන 7.5 කින් රු. මිලියන 3.2 ක් වැනි විශාල මුදලක් ඉතිරි වී තිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මකට අනුකූලව වර්ෂයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මාස 03 ක් තුළ අවස්ථා 10 කදී රු.2,360,800 ක් වටිනා පරිගණක විවිධ මිල ගණන් යටතේ මිලදීගෙන තිබුණි.

5.5 අයවැය පාලනය

-------------------

අයවැය ලේඛනය පිළියෙල කිරීමේදී වැය විෂයයන් 25 කට අදාලව අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබූ අතර, වැය විෂයයන් 22 කට අදාල ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීමද, වැය විෂයයක මුළු ප්‍රතිපාදිත මුදලම ඉතිරි කිරීමද, ශිෂ්‍ය මූල්‍යාධාර වෙනුවෙන් අයවැයට ඇතුළත් නොකර රු.25,606,250 ක වියදම් දැරීමද සිදුකර තිබූ අතර, අයවැය ලේඛනය මූල්‍ය කළමනාකරණ කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

----------------------------------

අංක.PED/2 හා 2003 ජුනි 2 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තියට හා 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තියට අනුව, ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත යුතුව තිබූ, 2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2012 සැප්තැම්බර් 25 දින වන විටත් සභාගත කළ බවට සාක්ෂි නොවීය.

5.7 සමාජ හා පාරිසරික වගකීම් ඉටුකිරීම

---------------------------------------

බඳවා ගැනීමේ පරිපාටිය අනුව, විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ දේශක තනතුරු සඳහා වූ මූලික සුදුසුකම විශේෂ උපාධියක් විය යුතු අතර, එම පීඨය විසින් පිරිනමන උපාධිය විශේෂ උපාධියක් නොවීමේ හේතුවෙන් වර්ෂ 2007 සිට මේ වන තෙක් මෙම පීඨයෙන් සාමාන්‍ය උපාධියක් ලබා පිටවූ උපාධිධාරීන් 31 දෙනෙකුට එම පීඨයේ හෝ වෙනත් විශ්ව විද්‍යාලවලද රැකියා අවස්ථා අහිමි වී තිබුණි.

6. පද්ධති හා පාලනයන්

------------------------

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුව ඇත.

(අ) පුස්තකාල පොත් මිළදී ගැනීම
(ආ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තු
(ඇ) අත්තිකාරම් ලබාදීම හා පියවීම
(ඈ) බාහිර පාඨමාලා
(ඉ) තොග පාලනය
(ඊ) කාර්ය මණ්ඩල
(උ) අයවැය
(ඌ) ප්‍රසම්පාදන

එච්.ඒ.එස්.සමරවීර,
විගණකාධිපති.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18 ප්‍රකාරට වටිනාකම රු.15,847,454 ක් වූ ශේෂ පත්‍ර අගය ශුන්‍ය ලෙස පෙන්වා තිබූ වත්කම් වියෙයන් 07 කට අදාලව විශ්ව විද්‍යාලයේ මෙහෙයුම් කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීමේ කටයුතු සඳහා රජය විසින් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට බඳවා ගන්නා ලද නවක උපාධිධාරීන් දස දෙනෙකුගේ සේවය ලබා ගැනීමට උත්සාහ දරණ ලද මුත් ඒ සඳහා අවැසි හැකියාව හෝ දැනුම ඔවුන් සතුව නොමැති බව නිරීක්ෂණය කරන ලදී. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් මෙය කරවා ගැනීමට උත්සාහ කල මුත් එය ද සාර්ථක නොවීය. මේ නිසා විධිමත් ස්ථාවර වත්කම් ලේඛණයක් පිළියෙල කිරීමේ කටයුතු සුදුසුකම් ලත් බාහිර ආයතනයක් හෝ පුද්ගලයෙකු වෙත පැවරීම සුදුසු බව 39 වන විගණන හා කළමණාකරන කමිටු රැස්වීමේදී තීරණය කරණ ලද අතර එය පාලක සභාව වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමට ද තීරණය විය.**

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් අවස්ථාවන් නිරීක්ෂණය විය.

(අ) පොලී ආදායම් මුදල් පදනම මත ගිණුම්ගත කළයුතු වුවද, විශ්ව විද්‍යාලයට විවිධ අරමුදල්වලින් ලැබී තිබූ රු.1,457,411 ක පොලී මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**පොලී ආදායම් ලෙස දක්වා ඇත්තේ ස්ථාවර තැන්පත් වලින් ලද පොලිය වන අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 8.1(b) අනුව පොලිය උපලබ්ධි වූ පසු මුදල් පදනමින් ආදායම් ලෙස ගිණුම්ගත කර ඇත.**

**මෙහි දක්වා ඇති පොලී මුදල විශේෂිත කාර්යයන් වෙනුවෙන් වූ අරමුදල් ආයෝජන මඟින් ලද පොලී වන බැවින් ආයෝජන හා අරමුදල් ගිණුම් යටතේ ගිණුම්ගත කර ඇත.**

(ආ) මූල්‍ය ප්‍රකාශනයේ 2.4 හි සඳහන් ප්‍රතිපත්තියට අනුව තොග නිකුත් කිරීම ප්‍රථම ලැබීම්, ප්‍රථමයෙන් නිකුත් කළයුතු වුවත්, ඉන් බැහැරවූ අවස්ථා කිහිපයක්ද, 2.5 හි සඳහන් ප්‍රතිපත්තියට අනුව නොනිමි කොන්ත්‍රාත් වැඩ මුදල් පදනම මත ගිණුම් තැබීම වෙනුවට උපචිත පදනම මත ගිණුම් තැබූ අවස්ථා දෙකක්ද නිරීක්ෂණය විය.

ගබඩාවෙන් තොග නිකුත් කිරීම සඳහා පළමු ලැබීම් පළමු නිකුත් කිරීමේ ක්‍රමය අනුගමනය කරනු ලැබේ.

නොනිමි කොන්ත්‍රාත් වැඩ ගිණුම් තැබීම

නොනිමි වැඩ උපචිත පදනම මත ගිණුම් තැබීම සාමාන්‍යයෙන් සිදු කරනු ලැබේ. නමුත් කොන්ත්‍රාත් කාර්යයකට අදාල වටිනාකම උපචිත පදනම මත ගිණුම් තැබීම මඟ හැරී ගොස් ඇති අතර එය 2012 වර්ෂයේදී අදාල පරිදි ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී සේවක සංවර්ධන කටයුතු සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබාදුන් රු.4,500,000 ක් සහ පර්යේෂණ කටයුතු වෙනුවෙන් ජාත්‍යන්තර සංගමයක් සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ලබාදුන් රු.967,750 ක් වූ ප්‍රදානයන් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

මෙම මුදල් විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කටයුතු වලින් පරිබාහිර විශේෂිත ව්‍යාපෘති වෙනුවෙන්ම ලබා දී ඇති බැවින් වෙන වෙනම ගිණුම්ගත කර ඇති අතර මෙම සියළුම ලැබීම් හා ගෙවීම් පිළිබඳ විස්තර උපලේඛණවල සඳහන් කර ඇත.

**135030** - සේවක සංවර්ධන කටයුතු වෙනුවෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් මෙම මුදල ලබා දී ඇත.

**133011** - පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක ලෙස කටයුතු කරනු ලබන ආචාර්ය **JADSS** ජයකොඩි මහත්මිය විසින් සිදු කරනු ලබන පර්යේෂණ කටයුතු වෙනුවෙන් මෙම මුදල් ලබා දී ඇත.

**133103** - මෙම මුදල කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් පර්යේෂණ කටයුතු වෙනුවෙන් අත්තිකාරම් මුදලක් ලෙස ලබා දී ඇත.

(ආ) විශ්ව විද්‍යාලය විසින් පවත්වන ලද එහෙත් නිමකරන ලද විවිධ පාඨමාලාවල ලාභයෙන් 10% ක් උපකුලපති අරමුදලට බැරකළ යුතු බව අදාල ඇස්තමේන්තුවේ සහ උපලේඛනවල දක්වා තිබුණත්, පාඨමාලා 02 කට අදාලව එහි අදියර 04 කින් රු.352,620 ක් බැර කර නොතිබූ අතර, තවත් පාඨමාලා 04 කට අදාල අදියර 10 කින් බැරකළ යුතු ප්‍රමාණයවත් දක්වා නොතිබුණි.

විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන නිම කරන ලද ලෙසට හඳුනා ගනු ලැබූ පාඨමාලාවල ලාභයෙන් 10% ක් පමණක් **2011.12.31** දින වන විට උපකුලපති අරමුදලට

බැර කර ඇති අතර අනෙකුත් පාඨමාලා නිම කල බව හඳුනා ගැනීමෙන් පසු අදාල පරිදි ගිණුම් වලට බැර කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පශ්චාත් උපාධි පාඨමාලාට වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන කුලියාපිටිය ලංකා බැංකු ජංගම ගිණුමේ 2011 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා හඳුනා නොගත් තැන්පතු ලෙස තිබූ රු.435,750 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

මෙම හඳුනා නොගත් තැන්පතු වලින් රු. **323,250/-** ප්‍රමාණයක් මේ වන විට හඳුනාගෙන ඇති අතර එම හඳුනා නොගත් ලැබීම් නිසි පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. මේ සඳහා 2013 වර්ෂයේ සිට රක්ෂණ ඩිප්ලෝමා හා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවන් ආදී පාඨමාලාවන්ට මුදල් ගෙවීම් වයඹ විශ්වවිද්‍යාලයේ සරප් කවුලුවෙන්ම සිදුකල යුතු බව සිසුන්ට දැනුම් දී ඇති අතර **MBA** පාඨමාලාවේ සිසුන්ට පමණක් දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවීම් කිරීමේ පහසුව සළසා ඇත.
මේ පිළිබඳව මෙහෙයුම් කලමණාකරු, ලංකා බැංකුව වයඹ පළාත් ප්‍රාදේශීය කාර්යාලයන්ට දැනුම් දී ඇති අතර ඒ අනුව 2013 වර්ෂයේ සිට බැංකු ප්‍රකාශනයේ අදාල නම, ලියාපදිංචි අංකය හෝ අයඳුම්පත් අංකය සඳහන් කර එවන මෙන් බැංකුවට උපදෙස් ලබා දී ඇත.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 1999 වර්ෂයේ සිට පැවත එන වටිනාකම රු.121,342 ක්වූ ණයගැති ශේෂ 15 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2012 වර්ෂයේදී මෙම ණයගැති ශේෂයන්ගෙන් රු: **49,030.39** ක් නිරවුල් කර ඇති අතර රු: **54380.00** ක මුදලක් නිරවුල් කරන ලෙස **2012.10.08** හා **2012.12.19** දිනැති ලිපිවලින් අදාල පාර්ශ්වයන් දැනුවත් කර ඇත.

(ආ) වර්ෂ කිපයක සිට පැවත එන වැටුප් අත්තිකාරම් ශේෂය තුළ ඇතුළත් වී තිබූ 2010 දෙසැම්බර් 31 දක්වා නිරවුල් නොකරන ලද වැටුප් අත්තිකාරම් ශේෂය රු.50,300 ක් විය.

මෙම ශේෂයන්ගෙන් බොහොමයක් ශේෂයන් 1999 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයන් වන අතර මේවා වෙනත් විශ්වවිද්‍යාල වෙත ස්ථාන මාරු වී යන ලද සේවක භවතුන් හට අදාල වන අතර ඒවා නිරවුල් කරන ලෙස අදාල විශ්වවිද්‍යාල වෙත දැනුම් දී ඇත. අනෙකුත් වැටුප් අත්තිකාරම් නිරවුල් කරන ලෙස අදාල පාර්ශ්වයන් වෙත දැනුම් දී ඇත.

(ඇ) 2007 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 05 කදී ලබාදෙන ලද කොන්ත්‍රාත් අත්තිකාරම් රු.5,550,981 ක්ද, 1996 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා සැපයුම් අත්තිකාරම් වශයෙන් අවස්ථා 31 කදී ලබාදෙන ලද රු.1,142,790 ක් සහ 2003 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 21 කදී ලබාදෙන ලද රු.203,530 ක සේවා අත්තිකාරම්ද 2012 මාර්තු 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

<u>කොන්ත්‍රාත් අත්තිකාරම්</u>

වැඩ නිම වූ කොන්ත්‍රාත් කාර්යයන්ට අදාලව රු: **1,878,406.55** ක මුදලක් මේ වන විට පියවා ඇති අතර අනෙකුත් කොන්ත්‍රාත් කාර්යයන්හි අයකර ගැනීමට හැකි වූ ප්‍රමාණයන් 2012 අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී පියවීමට කටයුතු කරනු ලැබේ.

<u>සැපයුම් අත්තිකාරම්</u>

ඉහත අත්තිකාරම් ලබා දී ඇත්තේ මාකඳුර හා කුලියාපිටිය පුස්තකාල සඳහා පොත් සහ සඟරා මිලදී ගැනීම සඳහාය. එක් එක් සඟරාවන් සඳහා ලැබිය යුතු කලාප ප්‍රමාණය සම්පූර්ණයෙන්ම නොලැබීම නිසා අදාළ අත්තිකාරම් පියවා නොමැත. ලැබී නොමැති සඟරා කලාප සඳහා පුස්තකාලය විසින් සිහිකැඳවීම් යවා ඇත.

<u>සේවා අත්තිකාරම්</u>

ඉහත සේවා අත්තිකාරම් පියවීම සඳහා අවශ්‍ය ලිපි ලේඛණ අදාල අංශ වලින් ලැබුණු පසු පියවීමට කටයුතු කරනු ලැබේ.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

වටිනාකම රු.121,054,602 ක් වූ ඉඩම්වලට අදාල සින්නක්කර ඔප්පු, වටිනාකම රු.737,866,826 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 04 කට අදාල උපලේඛන හා ස්ථාවර වත්කම් ලේඛනය සහ වටිනාකම රු.6,607,263 ක් වූ ජල සැපයුම් යෝජනා ක්‍රමයේ වත්කම්වලට අදාල උපලේඛනද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(i) <u>සින්නක්කර ඔප්පු, පැවරුම් නියෝග</u>

විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය පරිශ්‍රය සඳහා අත්පත් කරගෙන ඇති ඉඩම් සඳහා වන්දි මුදල් හා පොළී මේ වන විට ගෙවා අවසන් කර ඇතත් අදාල ඉඩම්වල පැවරුම් නියෝග තවම විශ්වවිද්‍යාල වෙත ලැබී නැත. අත්පත් කර ගන්නා ලද ඉඩම් විශ්වවිද්‍යාලයට පවරා දීමට අදාල ඉදිරි කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බවත්, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලද විට එම කටයුතු හැකි ඉක්මණින් අවසන් කරන බවත් කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශිය ලේකම් විසින් ලිඛිතව දන්වා ඇත. මෙම ඉඩම් සඳහා සියළු ගෙවීම් කටයුතු විශ්වවිද්‍යාලය විසින් සිදුකර අවසන් බව ඉඩම් අමාත්‍යංශයට දන්වා ඇති මුත් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය තවම ලැබී නොමැති බව **2012.11.21** දින දුරකථනයෙන් විමසූ විට ප්‍රා. ලේ විසින් දැනුම් දෙන ලදී.

බිම් සවිය වැඩසටහන යටතේ මිණුම් කටයුතු සිදුකර විශ්වවිද්‍යාලයට පවරා දීමට නියමිත මාකඳුර පරිශ්‍රයේ ඉඩමෙහි සිතියම ලද වහාම එය ගැසට් පත්‍රයේ පල කොට පවරා දීමට කටයුතු කරනු ලබන බව ප්‍රාදේශිය ලේකම් විසින් ලිඛිතව දන්වා ඇත. (ඇමුණුම **01**) මේ පිළිබඳව **2012.11.21** දින දුරකථනයෙන් විමසූ අවස්ථාවේ ඇය කියා සිටියේ ඉඩම තවමත් ගැසට් පත්‍රයේ පල කොට නොමැති බවයි.

<u>තක්සේරු වාර්තා, ස්ථාවර වත්කම් ලේඛණය</u>

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙළ කිරීමේ කටයුතු සුදුසුකම් ලත් බාහිර ආයතනයක් හෝ පුද්ගලයෙකු වෙත පැවරීම සුදුසු බව 39 වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී තීරණය කරන ලද අතර, එය පාලක සභාව වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමට ද තීරණය විය.

<u>උපලේඛණ</u>

ස්ථාවර වත්කම් ලේඛනය සකස් කල පසු මෙම අවශ්‍යතාව ඉටු වනු ඇත.

2.2.6 නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) පනත් | |
| 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ XIII පරිච්ඡේදයේ 99 (ඇ) වගන්තිය | කවර හෝ ප්‍රභවයකින් හෝ උපයා ගනු ලබන සියලුම ආදායම් විශ්ව විද්‍යාල අරමුදලට බැරවිය යුතු වුවත්, එම නියමයෙන් බැහැරව පාඨමාලා 04 ක් සහ ව්‍යාපෘති 6 ක් යටතේ ලද රු.19,127,924 ක් විශ්ව විද්‍යාල අරමුදලට බැරකර නොතිබූණ අතර, ඒවා මූල්‍ය ප්‍රකාශනවල වෙනත් වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. |

විශේෂිත අරමුණු වෙනුවෙන් රැස් කරන අරමුදල් වෙනම ගිණුමක තබා ගැනීමට හැකි බව **1978** අංක **16** දරණ විශ්වවිද්‍යාල පනතේ **101** වගන්තියේ දක්වා ඇති අතර ඒ අනුව කටයුතු කර ඇත. පාඨමාලා සඳහා ලද ආදායම් වෙන් වෙන්ව අවසන් ගිණුම් ප්‍රකාශනයේ දක්වා ඇත. වෙන වෙනම ගිණුම් පවත්වා ගත්ත ද, සමස්ථයක් වශයෙන් ගත්කල එම මුළද විශ්වවිද්‍යාල අරමුදල්වල ඇතුලත් වේ.

| | |
|---|---|
| (ආ) විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහය<br>------------------------------<br>xxvii පරිච්ඡේදයේ 2.1.1 වගන්තිය | විශ්ව විද්‍යාලය සතු සියලුම වාහන ලේඛකාධිකාරීවරයාගේ නමින් ලියාපදිංචි කළ යුතු වුවද, වයඹ විශ්ව විද්‍යාලය සතු වාහන 06 ක් එසේ ලියාපදිංචි කර නොතිබුණි. |

**KP -1785** අංකය දරණ මෝටර් රථය කල්බදු ක්‍රමය යටතේ මහා භාණ්ඩාගාරය විසින් මිලට ගෙන විශ්වවිද්‍යාලය වෙත ලබා දෙන ලද වාහනයකි. මෙය ලියාපදිංචි කිරීම ද, මහා භාණ්ඩාගාරය විසින් සිදු කර ඇති අතර, එහිදී එය සිදුකර ඇත්තේ උපකුලපතිවරයාගේ නමිනි. මෙහිදී මහා භාණ්ඩාගාරය, විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ උපදෙස් වෙනුවට රජයේ ආයතන සංග්‍රහයේ උපදෙස් අනුව කටයුතු කර ඇති බව පෙනේ.

වාර්තාවේ නිරීක්ෂණයට අදාල අනෙකුත් වාහන ලේඛකාධිකාරී නමින් ලියාපදිංචි කර නැතත් විශ්වවිද්‍යාලය නමින් ලියාපදිංචි කර ඇත. විශ්වවිද්‍යාලයේ දේපල හා ලේඛන භාරකරු ලේඛකාධිකාරී වන බැවින් වාහන විශ්වවිද්‍යාලය නමින් ලියාපදිංචි කිරීම ඒවා ලේඛකාධිකාරී නමින් ලියාපදිංචි කිරීමට සමාන සේ සැලකිය හැකිය. කෙසේවෙතත් විශ්වවිද්‍යාලය සතු වාහන ලේඛකාධිකාරී නමින් ලියාපදිංචි කරන මෙන් ඉල්ලා මහා භාණ්ඩාගාරය වෙත ලිපියක් ද මේ වන විට යොමු කර ඇත. **(ඇමුණුම 02)**

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>------------------------------<br>xix පරිච්ඡේදයේ 5.5 වගන්තිය | විශ්ව විද්‍යාලයට අයත් නිලනිවාස හා බදු පදනම මත ලබාගෙන ඇති නිවාසවල පදිංචිව සිටින නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කුලී අයකිරීම වෙනුවට විශ්ව විද්‍යාල භාරය මණ්ඩල නේවාසික කමිටුව විසින් තීරණය කරන ලද ක්‍රමයකට කුලී ගණනය කර අයකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර අයකළ යුතු කුලියට වඩා රු.714,446 ක නිවාස කුලී අඩුවෙන් අයකරගෙන තිබුණි. |

මෙම ගැටළුව නිරාකණය කර ගැනීම සඳහා නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගැනීම පිණිස **2012.09.11** වන දින ලිපියක් නීතිපතිවරයා වෙත යොමු කරන ලදී. ඒ අනුව කරුණු විමසීම සඳහා **2012.11.08** වන දින සහකාර ලේඛකාධිකාරී (සාමාන්‍ය පාලන) රාජ්‍ය කොන්සල්වරයා වන **(State Consul)** හස්ලි රයීක් මහතා වෙත කැඳවන ලදී. එහිදී ඇති වූ සාකච්ඡාවෙහිදී තීරණය වූයේ මෙම කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ කාරක සභාවේ තීරණය ද සැලකිල්ලට ගෙන අවසන් විසඳුමකට එළඹීම සුදුසු බවය. ඒ අනුව එම උපදෙස්වල පිටපතක් සහ විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ මේ පිළිබඳ යම්

ප්‍රතිපාදනයක් තිබේනම් එහි පිටපතක් ද සහිතව කොන්සල්වරයා වෙත යළි ලිපියක් යොමු කරන ලෙස දැනුම් දෙන ලදී.

තවද, කාර්ය මණ්ඩලයට නේවාසිකාගාර පහසුකම් සැපයීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පනතෙහි **(29:n** සහ **45:1,2 – iii,ix,x,xi)** පමණක් නොව විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයෙහි ද ප්‍රතිපාදන සලසා ඇති බව දන්වනු කැමැත්තෙමි. **(Chapter I,7:3C)**

රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ කාරක සභාවේ සටහන් ලද වහාම එම සියලු තොරතුරු අවසන් විසඳුමකට එළැඹීම සඳහා කොන්සල්වරයා වෙත යොමු කරනු ලබන බව ද දන්වමි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) මු.රෙ.371 (2) (ආ) වගන්තිය | අතුරු අග්‍රිමයක් වශයෙන් එක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම මුදල රු. 20,000 ක් වුවද, එම සීමාව ඉක්මවා අවස්ථා 05 කදී රු.173,300 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි. |

කාර්ය අවශ්‍යතාවය මත හා විශ්වවිද්‍යාලයේ කටයුතු ප්‍රමාදයකින් තොරව පවත්වාගෙන යාම් සඳහා මිළ ඇස්තමේන්තු හා අයවැය ලේඛණ වලට යටත්ව ගෙවීම් සිදු කර ඇත. කෙසේ වුවද මේ වන විට සියළුම අත්තිකාරම් ගෙවීම රු. **20,000.00** ට සීමා කර ඇත.

| | |
|---|---|
| (ii) මු.රෙ.396 (ඇ) | නිකුත් කරන ලද දින සිට මාස 06 ක කාලයක් ඉක්මවා තිබූ වටිනාකම රු.57,800 ක් වූ චෙක්පත් 28 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

**2011.12.31** දින වන විට නිකුත් කරන ලද දින සිට මාස **06** ක කාලයක් ඉක්ම වූ චෙක්පත් සියල්ලම අවලංගු කර ඇති අතර නිකුත් කරන ලද දින සිට මාස **06** ක කාලයක් ඉක්ම වූ චෙක්පත් කිසිවක් බැංකු සැසඳුම්වල දක්නට නොලැබේ.

| | |
|---|---|
| (iii)මු.රෙ.571(2) වගන්තිය | තැන්පත් කළ දින සිට වර්ෂ දෙකක් ඉක්මවන ලද රු.3,897,713 ක් වටිනා විවිධ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

මෙම තැන්පතු නිදහස් කරගන්නා ලෙස අදාල පාර්ශ්වයන් දැනුවත් කර ඇති අතර ඉන් පසු ලැබුණු ඉල්ලීම් මත රු: 8,500.00 ක් මේ වන විට නිදහස් කර ඇත. ඉදිරියේදී ලැබෙන ඉල්ලීම් පදනම් කරගෙන අනෙකුත් තැන්පතු නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

| | |
|---|---|
| (iv)මු.රෙ.835 (1) | ගොඩනැගිලි බද්දට ලබාගැනීම සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, ඒ සඳහා අනුමැතිය ලබානොගෙන ගොඩනැගිලි බද්දට ලබාගෙන ඒ සඳහා බදු මුදල් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.93,869,000 ක් ගෙවා තිබුණි. දැනට අදාල අනුමැතිය ලබාගැනීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකර ඇති බව උපකුලපතිවරයාගේ පිළිතුරේ දක්වා තිබුණි. |

මේ වන විට අදාල අමාත්‍යංශ අනුමැතිය ලැබී ඇත. (ඇමුණුම **03-1, 03-2**)

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | |
|---|---|
| 11/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළදී උපකුලපතිවරයාට හිමි ඉන්ධන සීමාව ඉක්මවා රු.91,244 ක් වටිනා අමතර ඉන්ධන ලබාගෙන තිබුණු අතර, මේ සඳහා 2012 අගෝස්තු 23 දින පාලක සභා අනුමැතිය ලබාගෙන තිබුණි. |

උපකුලපති නිල රථය නියමිත ඉන්ධන සීමාව ඉක්මවා ධාවනය කර ඇත්තේ අප්‍රේල්, මැයි, ජූලි, අගෝස්තු, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාසයන්හි පමණි. එසේම මෙම කාල සීමාව තුල අවස්ථා 03 කදී ඉන්ධන මිල වැඩිවීමක් සිදු වී ඇත.

මෙසේ මාසික අනුමත ඉන්ධන සීමාව ඉක්මවා ධාවනයේ යෙදීම සඳහා පහත කරුණු හේතුපාදක වී ඇත.

I. මාකඳුර පරිශ්‍රයේ පැවති විවිධ උත්සව අවස්ථා වෙනුවෙන් වැඩි වාර ගණනක් ධාවනය කිරීමට සිදු වීම. (පරිශ්‍ර දෙක එකිනෙකට කිලෝමීටර් 22 ක් පමණ දුරින් පිහිටා ඇත)

II. නිරන්තරයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ යෙදුන රැස්වීම් සඳහා සහභාගී වීම.

III. විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්ගේ හා අධ්‍යක්ෂකවරුන්ගේ රැස්වීම් (CVCD Meeting) දිවයින පුරා සියලු විශ්වවිද්‍යාලවල මාසිකව පැවැත්වීම හේතුවෙන් වැඩිපුර ප්‍රමාණයක් ධාවනය කිරීමට සිදු වීම.

එම නිසා නිරීක්ෂණයේ සඳහන් ඉන්ධන සීමාව ඉක්ම වූ වටිනාකම වූ රු. 91,244.17 සඳහා පාලක සභා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී.

2.2.7 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

2011 වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයට ආරක්ෂක සේවාව ලබාගැනීම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2011 ජූනි 01 සිට 2012 ජනවාරි 31 දක්වා කාලයකට ගිවිසුම් අත්සන් කර, එම ගිවිසුමේ වලංගු කාලය ඉදිරියට තිබියදීත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක.HE/AD/Security හා 2011 සැප්තැම්බර් 22 දිනැති ලිපියේ උපදෙස් මත කටයුතු කර වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුගෙන් ආරක්ෂක සේවාව ලබාගැනීම හේතුවෙන් මාස 2 1/2 ක කාලයක් වෙනුවෙන් විශ්ව විද්‍යාල අරමුදලට රු.4,768,340 ක පාඩුවක් සිදුවී තිබුණි.

වයඹ විශ්වවිද්‍යාලයේ ආරක්ෂක කටයුතු සඳහා පෞද්ගලික ආරක්ෂක සේවා ලබා ගැනීමේදී **2011.10.13** දින දක්වා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව කටයුතු කල අතර රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක **445** සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ ලිපි වලට අනුව විශ්වවිද්‍යාලයේ ආරක්ෂක කටයුතු සී/ස රක්නා ආරක්ෂක ලංකා ආයතනයට පවරන ලදී. මෙම සමාගමට ආරක්ෂක කටයුතු පැවරීම සම්බන්ධයෙන් අවශ්‍ය අමතර ප්‍රතිපාදන ප්‍රමාණයන් **2011.09.14** දිනැති ලිපිය මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා යැවීමට කටයුතු කරන ලදී. ඒ අනුව ඇස්තමේන්තුගත සීමාව ඉක්ම වූ ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කර ඇත.

03. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන, ගණන් ගැනීමට පෙර රු.506,817,000 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.419,030,000 ක් විය. විශ්ව විද්‍යාලය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණ රු.406,284,000 ක ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.100,533,000 දක්වා අඩු වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණ රු.327,535,000 ක ප්‍රදාන ගැලපීමෙන් පසුව එම වර්ෂය සඳහා වූ ඌණතාවය රු.91,495,000 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු.9,038,000 ක පිරිහීමක් සිදුවී තිබුණි.

මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිගිමට පර්යේෂණ දීමනා රු.11,250,000 කින් වැඩිවීම, අනෙකුත් දීමනා රු.5,833,000 කින් වැඩිවීම හා පාරිතෝෂිත දීමනා රු.8,833,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

2011 වර්ෂයේ එක් එක් පීඨයන් සඳහා දරා ඇති වියදම්, ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒක ශිෂ්‍ය පිරිවැය පිළිබඳ වූ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය |
|---|---|---|---|---|---|
| 2011 වර්ෂයේ වියදම | රු. | 44,648,076 | 50,288,773 | 59,222,043 | 59,739,834 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | | 1,079 | 358 | 396 | 323 |
| ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | 41,379 | 140,471 | 149,550 | 184,953 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2011 වර්ෂය තුළ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය හා කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය අනෙකුත් පීඨවලට සාපේක්ෂව ඉහළ අගයක් ගෙන තිබුණි.

➢ **පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

- **නව පාඨමාලා විෂය සංකලනයන් අන්තර්ගතව පීඨය තුල පාඨමාලා දෙකක් ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා වැඩි වශයෙන් බාහිර කථිකාචාර්යවරුන්ගේ සහාය ලබා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට සිදු වීම.**
- **පීඨය තුල අංග සම්පූර්ණ සත්ව ගොවිපලක් (පශු සම්පත්/කරදිය හා මිරිදිය මත්ස්‍ය) නොමැති වීම නිසා ඉතා විශාල වශයෙන් ක්ෂේත්‍ර චාරිකා හා ක්ෂේත්‍ර ඉගැන්වීම් කටයුතු සිදුකල යුතු වීම හා එවැනි ක්ෂේත්‍ර චාරිකා ඉතා ඈත ප්‍රදේශවල දී සිදු කිරීමට ඇති බැවින් ඒ සඳහා වන ප්‍රවාහන පහසුකම් හා අනෙකුත් සියළු අවශ්‍යතාවයන් සඳහා අවස්ථානුකූලව මූල්‍ය ප්‍රතිපාදන විශාල වශයෙන් වෙන් කරවීමට සිදු වීම.**
- **රසායනාගාර මට්ටමේ ප්‍රායෝගික පුහුණුව සඳහා වන අධ්‍යයන කටයුතු වලට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය මිල අධික බැවින් ඒ සඳහා මූලික ප්‍රතිපාදන යෙදවීම.**

- අනෙකුත් පීඨවල මෙන් නොව මෙම පීඨයේ උපාධි පාඨමාලා දෙකෙහිම සියළුම විභාගයන්හි ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා වන ප්‍රශ්නපත්‍ර මුද්‍රණය සම්පූර්ණයෙන්ම පීඨය තුල වන අතර, ඒ සඳහා අවශ්‍ය වන ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ තීන්ත හා අනෙකුත් උපකරණ සහ නඩත්තු කටයුතු සඳහා සැලකිය යුතු පිරිවැයක් වෙන් කිරීමට සිදු වීම.

➢ කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය

විද්‍යාවේදී කෘෂිකර්ම උපාධි පාඨමාලාව දේශන, විද්‍යාගාර පරීක්ෂණ, ව්‍යාපෘති, ක්ෂේත්‍ර පරීක්ෂණ, ක්ෂේත්‍ර චාරිකා, පර්යේෂණ ව්‍යාපෘති හා සේවාස්ථ පුහුණුව යන අංශවලින් සමන්විත වන පාඨමාවකි. මේ නිසා සමස්ථ ශිෂ්‍ය පිරිවැය සාපේක්ෂව ඉහළ අගයක් ගනී. මෙය සියළුම කෘෂිකර්ම පීඨවල පොදු කරුණකි. එමෙන්ම 2011 වසර තුළ නව කාර්යමණ්ඩලය බඳවා ගැනීම ද විද්‍යාගාර රසායන ද්‍රව්‍ය හා උපකරණ ඇතුළු සමස්ථ වියදම් සීඝ්‍ර ලෙස ඉහලයාම නිසා ද පීඨයේ සමස්ථ පිරිවැය ඉහළයාම තුළින් ඒකක ශිෂ්‍ය පිරිවැය වැඩි වීම සිදු වී ඇත.

(ආ) විශ්ව විද්‍යාලයේ පීඨ තුනක් සඳහා තෝරාගත් ශිෂ්‍යයන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් වෙනත් විශ්ව විද්‍යාලවලට මාරු වී ගොස් තිබුණි. මෙය පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් බව නිරීක්ෂණය විය. මේ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | වයඹ විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | වෙනත් විශ්ව විද්‍යාලවලට මාරු වී ගිය ශිෂ්‍ය සංඛ්‍යාව | වෙනත් විශ්ව විද්‍යාලවලට මාරුවී ගිය සංඛ්‍යාව ලියාපදිංචි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | | | | % |
| (i). | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 344 | 17 | 5 |
| (ii). | ව්‍යවහාරික විද්‍යා පීඨය | 146 | 98 | 67 |
| (iii). | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 115 | 45 | 39 |
| (iv). | පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය | 110 | 45 | 41 |

➢ ව්‍යවහාරික විද්‍යා පීඨය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2010.04.06 දින යොමු කරන ලද ලිපියට අනුව 2010/2011 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 150 දෙනෙකු බඳවා ගැනීමට 78 වන පීඨමණ්ඩල රැස්වීම තීරණය කරන ලදී.

ඒ අනුව ශිෂ්‍යයන් බඳවා ගැනීම පහත පරිදි සිදුකරන ලදී.

| බඳවා ගැනීම | ශිෂ්‍ය සංඛ්‍යාව | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව සඳහන් කර එවන ලද ලිපියේ දිනය |
|---|---|---|---|
| මුල්ම ලියාපදිංචිය | 148 | 80 | 2011.07.20 |
| පළමු අදියර | 139 | 82 | 2011.09.05 |
| දෙවන අදියර | 108 | 54 | 2011.09.26 |
| තෙවන අදියර | 30 | 11 | 2011.10.25 |
| සිව්වන අදියර | 17 | 09 | 2011.11.11 |
| අභ්‍යන්තර ස්ථාන මාරුවීම් | 06 | 04 | 2011.11.11 |

මේ අනුව 2010/2011 අධ්‍යයන වර්ෂය සඳහා ඉහත අදියරයන් යටතේ ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා ශිෂ්‍යයන් 240 ක් පමණ ලියාපදිංචි වුවද, ඒ සෑම අදියරයක් යටතේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉහළ ප්‍රතිඵල මත පදනම්ව උසස් පාඨමාලා හැදෑරීම සඳහා වෙනත් විශ්වවිද්‍යාල වෙත ශිෂ්‍යයන් මාරු කර යවන ලද අතර ශිෂ්‍යයන්ගේ ස්ව කැමැත්තෙන්, විවිධ හේතු සාධක මත පදනම්ව ශිෂ්‍ය ලියාපදිංචිය අහෝසි කර ගන්නා ලද අවස්ථා ද පෙන්වා දිය හැක.

තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ශිෂ්‍ය අත්පොතට අනුව වෙනත් විශ්වවිද්‍යාල සඳහා පාඨමාලාව උසස් කර යැවීමේදී ශිෂ්‍යයා විසින් එය අනිවාර්යයෙන්ම බාර ගත යුතු බව සඳහන් වේ. මේ අනුව සමස්තයක් ලෙස 99 ක පමණ ශිෂ්‍ය ප්‍රමාණයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් උසස් පාඨමාලා සඳහා මාරු කර යැවීම හා ශිෂ්‍යයන් විසින් සිය කැමැත්තෙන් ශිෂ්‍ය ලියාපදිංචිය අහෝසි කරගෙන ඇති බව වැඩිදුරටත් පෙන්වා දිය හැක.

එමෙන්ම විද්‍යා පීඨ හා ව්‍යවහාරිකවිද්‍යා පීඨවල ශිෂ්‍ය පුරප්පාඩු පිරවීමේ ගැටළු වලට නිරන්තරයෙන් මුහුණ දීමට සිදුවන බව විද්‍යා පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර කමිටු රැස්වීම් වලදී (Standing Committee on Sciences) පීඨාධිපතිවරු අවධාරණය කරති. මෙමගින් උද්ගතවන ගැටළු වඩාත් කාර්යක්ෂම ලෙස විසඳිය හැක්කේ නවක සිසුන් සඳහා අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට පෙර නියමිත ප්‍රමාණයට බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමෙන් පසුවය.

එමෙන්ම නවක සිසුන් සඳහා වූ 2010/2011 අධ්‍යයන වර්ෂය ආරම්භ කරනු ලැබුවේ 2011.11.14 දින වන අතර අප පීඨයේ අධ්‍යයන කටයුතු සිදුකරනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් වන අතරම අධ්‍යයන කටයුතු වලට පූර්ව ගාමීව (අනිවාර්ය) කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව (මාස 02 ක) නිම කරනු ලබන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පුරප්පාඩු පිරවීම සඳහා ශිෂ්‍ය නාම ලේඛණ ලැබීමට සති 03 ක් හෝ 04 ක් ගතවන බැවින් ද, අධ්‍යයන කටයුතු ආරම්භ වීමත් සමඟම අඛණ්ඩ ඇගයීම් (Continuous Assessments) සිදුකිරීමට සිසුන්ට සිදුවන බැවින් ද නියමිත දිනට පසුව ලැබෙන ලේඛණ අනුව ශිෂ්‍ය බඳවා ගැනීම් සිදු කල නොහැකි වේ.

තවද, පීඨය සඳහා වරින්වර සිසුන් බඳවා ගැනීමේදී අධ්‍යයන කටයුතු පමා කිරීමට සිදුවන අතර එහිදී අනෙකුත් ශිෂ්‍යයන්ගේ අධ්‍යයන කටයුතු කාල සීමාවට බලපාන හෙයින් පීඨමණ්ඩලය මඟින් සිසුන් බඳවා ගැනීම **2011.11.14** දින සිට නතර කිරීමට තීරණය කරන ලදී.

එහෙත් කැළණිය, රුහුණු, සබරගමුව, යාපනය සහ ඌව වෙල්ලස්ස යන විශ්වවිද්‍යාල වලට උසස් කරන ලද සිසුන් 31 දෙනෙකු පමණ ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ අධ්‍යයන කටයුතු සිදු කිරීමට කැමැත්ත ප්‍රකාශ කිරීම සුවිශේෂී සිදු වීමක් ලෙස දැක්විය හැක. මේ අනුව **2010/2011** අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව **2012.06.30** වන විට **141** ක් වේ.

- පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

ශිෂ්‍යයන් ලියාපදිංචිය අහෝසි කර වෙනත් විශ්වවිද්‍යාලවලට යන්නේ හුදෙක්ම උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය පමණක්ම සලකා නොවන අතර වසර ගණනාවක සිට වෛද්‍ය, දන්ත වෛද්‍ය, සම සෞඛ්‍ය විද්‍යා සහ කෘෂි තාක්ෂණ කළමනාකරණය ආදී උපාධි පාඨමාලාවලට වැඩි ඉල්ලුමක් පවතින හෙයිනි. ඒ අනුව ආරම්භයේදී අපගේ උපාධි පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ සිසුන් හට, පසුව ඉහත දැක්වූ උපාධි පාඨමාලාවට ඇතුළුවීමට අවස්ථාව ලබාදීමත්, ඒ බව සෘජුවම සිසුන් වෙත දැනුම් දීමත් ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ.

ඉහත කී කරුණට අමතරව ස්ථිර වාසස්ථානයට ඇති දුර ද පේරාදෙණිය, කොළඹ, කැළණිය වැනි ස්ථාපිත විශ්වවිද්‍යාල සඳහා ඇති ජනප්‍රියතාවය ද බලපාන තවත් කරුණු බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

- කෘෂි කර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

වෛද්‍ය, දන්ත වෛද්‍ය ඇතුළු උපාධි පාඨමාලා සාමාන්‍යයෙන් වැඩි ඉල්ලුමක් පවතින ක්ෂේත්‍රයන් වේ. එබඳු පාඨමාලාවලට තේරුණ විට මෙම පීඨයේ ලියාපදිංචි වී සිටිය ද එය අතහැර ඉහත පාඨමාලා සඳහා යාම සාමාන්‍ය පිළිවෙතයි. එසේ වුවද මෙම පීඨයට **2011** වර්ෂයට බඳවා ගැනීමට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව **110** කි. නමුත් මේ වන විට සිසුන් **114** දෙනෙකු අධ්‍යයනය ලබන අතර පුරප්පාඩු කිසිවක් නැත. අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව අභිබවා අදාළ වසර තුළ සිසුන් අධ්‍යයනය ලබයි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) වයඹ විශ්ව විද්‍යාලයේ සේවයේ නියුතුව සිටි අචාර්යවරුන් 08 දෙනෙකු විදේශගත වීමේදී, විශ්ව විද්‍යාලය සමඟ එකඟ වූ ගිවිසුම් ප්‍රකාර නියමිත දින යලි සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් ගිවිසුම් කඩකර තිබුණ අතර, ඒ අනුව ඔවුන්ගෙන් විශ්ව විද්‍යාලයට අයවිය යුතු මුදල් ප්‍රමාණයේ හිඟ මුදල වූ රු.10,524,210 ක් අයකර ගැනීමට පියවීමක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

I. HPV රූපසිංහ මහතා - කථිකාචාර්ය

රූපසිංහ මහතාගෙන් විශ්වවිද්‍යාලයට අය වීමට ඇති හිඟ මුදල රු:1,742,770.50 කි. එම මුදලින් ඔහුට හිමි අර්ථසාධක අරමුදල් ශේෂය වන රු:939,324.63 ක මුදල අය කර ගැනීම සඳහා ඔහුගේ අර්ථසාධක අරමුදල නිදහස් කිරීමේ පත්‍රිකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇත. ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.

II. WMEP වික්‍රමසිංහ මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

මොහුගෙන් අය විය යුතු මුදල රු. 2,386,193.22 කි. අර්ථසාධක අරමුදල් ශේෂය පාරිතෝෂිතය සමඟ රු. 1,812,179.83 කි. ගෙවිය යුතු මුදලින් අර්ථසාධක අරමුදල් ශේෂය හිලවු කිරීමට කැමැත්ත ප්‍රකාශ කර ඉතිරි මුදල වූ රු. 574,013.39 ඔහු විසින් විශ්වවිද්‍යාලයට ගෙවා ඇත.

අර්ථසාධක අරමුදල් ශේෂය හා පාරිතෝෂිතය මුදලින් රු. 1,812,179.83 ක මුදල අය කර ගැනීමට කටයුතු කර ඇත.

III. NGSC රත්නසිරි මිය - කථිකාචාර්ය

රත්නසිරි මිය විසින් දැනට ගෙවා ඇති මුදල රු. 1,162,000.00 කි. ගෙවිය යුතු මුදලින් අර්ථසාධක අරමුදල් ශේෂය පාරිතෝෂිතය සමඟ හිලවු කිරීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති නිසා, අර්ථසාධක අරමුදල් ශේෂය, පාරිතෝෂිතය සහ දැනට ගෙවා ඇති මුදල අඩු කල විට ඇය විසින් ගෙවිය යුතු මුදල වන්නේ (රු. 4,025,398.00 - 955,018.78 - 1,162,000.00) රු. 1,908,379.22 කි. එම මුදල ගෙවන මෙන් ඇය වෙත සිහිකැඳවීම් ලිපි යොමු කර ඇති අතර ඇයගේ ඇපකරුවන් ද දැනුවත් කර ඇත. ඇයගේ ඇපකරුවන්ට නැවත ලිපි යවා ඇති අතර ඇයගේ අර්ථසාධක අරමුදල හා පාරිතෝෂිතය විශ්වවිද්‍යාලයට අයකර ගැනීමට කටයුතු කර ඇත.

IV. PWMLHK මාරඹේ මිය - කථිකාචාර්ය

ඇයගෙන් අය විය යුතු මුදල රු. 1,686,602.83 කි. අර්ථසාධක අරමුදල් ශේෂය රු. 665,724.92 කි. ගෙවිය යුතු මුදලින් අර්ථසාධක අරමුදල් ශේෂය හිලවු කිරීමට කැමැත්ත ප්‍රකාශ කර ඉතිරි මුදල වූ රු. 1,020,877.91 ඇය විසින් විශ්වවිද්‍යාලයට ගෙවා ඇත.

අර්ථසාධක අරමුදල් ශේෂයෙන් රු. 665,724.92 ක මුදල අයකර ගැනීමට කටයුතු කර ඇත.

V. RMWS රත්නායක මහතා - කථිකාචාර්ය

රත්නායක මහතාගෙන් විශ්වවිද්‍යාලයට අයවීමට ඇති මුළු මුදල රු. 946,634.38 ක් වන අතර ඔහුට හිමි අර්ථසාධක අරමුදල් ශේෂය රු.707,367.01 කි. එම මුදල අයකර ගැනීම සඳහා ඔහුගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පත්‍රිකා ඔහු වෙත යවා ඇත. ඉතිරි මුදල ගෙවීමට කටයුතු කරන ලෙස ඔහුට දන්වා ඇත. ඇපකරුවන් ද මේ පිළිබඳව දැනුවත් කර ඇත.

VI. Dr.UTK හේරත් මිය - කථිකාචාර්ය

2010.09.08 දින සේවයෙන් ඉල්ලා අස් වී ඇත. ඇය විසින් විශ්වවිද්‍යාලයට ගෙවීමට ඇති අයවීම් පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| 1 | ඇප බැඳුම්කරයේ වටිනාකම | රු. | 1,430,535.50 |
| 2 | ඉල්ලා අස්වීම කල් නොදීම වෙනුවෙන් තුන් මසක වැටුප | රු. | 87,720.10 |
| 3 | ගිණුම් අංශය වෙත ඇති අයවීම් | රු. | 58,140.55 |
| 4 | ගෙවිය යුතු මුළු මුදල | රු. | 1,576,396.15 |

අර්ථසාධක අරමුදල් ශේෂය රු. 550,824.35 කි. අර්ථසාධක අරමුදල් ශේෂයෙන් මෙම අයවීම් පියවා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් එම මුදල අඩු කල විට ඇය විසින් ගෙවිය යුතු ඉතිරි මුදල වන්නේ, (රු.1,576,396.05 - රු. 550,824.35) රු. 1,025,571.80 කි. එම මුදල 2012.09.18 දින ගෙවා ඇත. ඇයට හිමි අර්ථසාධක අරමුදලින් රු:550,824.35 ක මුදල අඩුකර ගැනීමට කටයුතු කර ඇත.

VII. JADRN අප්පුහාමි මහතා - කථිකාචාර්ය

මොහු 2008.10.13 දින සේවයෙන් ඉවත් කර ඇත. ඔහු විසින් විශ්වවිද්‍යාලයට ගෙවීමට ඇති අයවීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| 1 | ඇප බැඳුම්කරයේ වටිනාකම | රු. | 1,998,009.68 |
| 2 | සේවයෙන් ඉවත් කිරීමේදී අයකල යුතු 03න් මසක වැටුප | රු. | 89,475.00 |
| 3 | මුදල් අංශයට අයවීමට ඇති මුදල | රු. | 74,079.88 |
| | | රු. | 2,161,564.56 |

අර්ථසාධක අරමුදල් ශේෂය රු. 699,781.45 කි. අර්ථසාධක අරමුදල් ශේෂයෙන් මෙම අයවීම් පියවා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් එම මුදල අඩු කල විට ඔහු විසින් ගෙවිය යුතු ඉතිරි මුදල වන්නේ (රු. 2,161,564.56 - රු. 699,781.45) රු. 1,461,783.11 කි. ඔහු විසින් 2012.12.11 දින රු. 1,461,783.11 ක මුදල විශ්වවිද්‍යාලයට ගෙවා ඇත. අර්ථසාධක අරමුදලින් රු: 699,781.45 ක මුදලද අඩු කර ගැනීමට කටයුතු කර ඇත.

VIII. KL රොද්‍රිගු මහතා - කථිකාචාර්ය

රොද්‍රිගු මහතා 2008.04.01 දින සේවයෙන් ඉවත් කරන ලදී. ඔහු විසින් විශ්වවිද්‍යාලයට ගෙවීමට ඇති අයවීම් රු. 1,069,158.87 කි. ඔහුගේ අර්ථසාධක අරමුදලින් හා පාරිතෝෂිතයෙන් රු. 926,474.46 ක් පියවා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත.

ඉතිරි මුදල වන රු. 142,684.41 ක මුදල 2012.10.03 දින ගෙවා ඇත. අර්ථසාධක අරමුදලින් හා පාරිතෝෂිත මුදලින් රු: 926,474.46 ක මුදල අඩු කර ගැනීමට කටයුතු කර ඇත.

(ආ) 2008 වර්ෂයේදී ප්‍රසම්පාදන පර්පාටියෙන් බැහැරව පුද්ගලික ආයතනයකින් රු.4,130,770 ක් වටිනා පුස්තකාල පොත් ණයට ලබාගෙන තිබූ අතර, මූල්‍ය ප්‍රකාශනවල එම වගකීම හෙළිදරව් කර නොතිබුණි.

පුස්තකාලයට පොත් ප්‍රතිග්‍රහණය කිරීමේ දී මෙතෙක් පැවති ක්‍රමය වූයේ පුස්තකාල ප්‍රතිග්‍රහණ කමිටුව (පොත් මිලදී ගැනීම සම්බන්ධ තීරණ ගැනීමේ කමිටුව – **Library Acquisition Committee)** විශ්වවිද්‍යාල පොත් මිලදී ගැනීමේ ටෙන්ඩර් මණ්ඩලය **(Tender Board)** ලෙස කටයුතු කිරීමයි. **2003** ජූලි **29** වැනි දින පවත්වන ලද **31** වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේදී මෙම ක්‍රමය (ඇමුණුම **04**) අනුමත කර ඇති අතර **2010** අග භාගය වන තෙක් ක්‍රියාත්මක වූ ක්‍රමය මෙයයි. ඒ අනුව ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව පුස්තකාල පොත් ණයට ලබා ගැනීමක් සිදු වී නොතිබුණි.

ක්වෙන්සි **(Quency)** ආයතනයෙන් ලබා ගත් පුස්තකාල පොත් සඳහා ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් තිබූ ගැටළු නිසා පාලක සභාවේ නිර්දේශය මත දැනට කමිටුවක් පත් කර ඇති අතර එම කමිටු නිර්දේශය අනුව ඉදිරියේදී ක්‍රියාකරනු ලැබේ.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

විශ්ව විද්‍යාලයේ පවිත්‍රතා කටයුතුවලට අදාල කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අදාල ගිවිසුම් ප්‍රකාරව දිනපතා සේවයේ යෙදවිය යුතු සේවක සංඛ්‍යාව 42 ක් වුවද, යෙදවූ සේවක සංඛ්‍යාව අඩුවීමේ හේතුවෙන් 2011 නොවැම්බර් මස වැඩකරන දින 22 ක් තුළ වැඩ කළයුතු මිනිස් දින 307 ක් අඩුවෙන් වැඩකර තිබියදී ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් කර තිබුණි.

**2010.11.16** වන දින **CN** ක්‍රියේෂන්ස් ආයතනය සමඟ එළඹෙන ලද ගිවිසුම් ප්‍රකාරව ඒ ඒ පරිශ්‍රයට අදාල වැඩ හා සේවාවන් ප්‍රධාන කොට ගෙන වැඩ පත්‍රය **(BOQ)** සකසා ඒ අනුව පිරිවැය විශ්ලේෂණය කොට ඇති අතර, සේවක සංඛ්‍යාව අඩු දින වලදී පවා අමතර සහායකයින් හා අමතර උපකරණ යොදා ගනිමින් අදාල වැඩ පත්‍රයෙහි සේවාවන් කිසිදු පැමිණිල්ලකින් තොරව පවත්වාගෙන යාමට **CN** ක්‍රියේෂන්ස් ආයතනය සමත් විය.

කෙසේ වුවත් ඉදිරියේදී අදාල සේවක සංඛ්‍යාව පිළිබඳ විශ්ලේෂණයක් ද සහිතව ටෙන්ඩර් වටිනාකම තීරණය කිරීමට හා සේවක සංඛ්‍යාවේ පැමිණීම සමඟ සසඳා ගෙවීම් කටයුතු කිරීමට ද පියවර ගනු ලබන බව දන්වා සිටිමි.

ඒ අනුව **2013/2014** වර්ෂය සඳහා පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍රිකාවේ සේවක පැමිණීම හා ඉටුකරන ලද කාර්ය යන අංශ දෙකම පදනම් කරගෙන ගෙවීම් සිදු කිරීමට කටයුතු සම්පාදනය කර ඇති බැව් කාරුණිකව දන්වා සිටිමි.

4.4 අරමුදල් ඌණ උපයෝජනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) තොරතුරු තාක්ෂණ අරමුදල සඳහා 2010 වර්ෂයේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබී තිබුණ රු.1,000,000 ක මුදල 2011 වර්ෂයේදීද කිසිදු කාර්යයකට යොදවා නොතිබුණි.

**2010 වර්ෂයේ ලැබුන රු. 1,000,000.00 ක මුදල සඳහා 2011 වසර තුල ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරන ලද අතර ඒ සඳහා 2012 ආරම්භයේදී රු. 812,000.00 ක මුදලක් ගෙවා ඇත .**

(ආ) වසර 2000 සිට 2010 දක්වා මහපොළ අරමුදලේ හා ශිෂ්‍යාධාර අරමුදලේ-නොගෙවා ඉතිරි මුදල් පිළිවෙලින් රු.633,200 ක් හා රු.560,400 ක් වූ අතර, එම මුදල්වල 2011 ජනවාරි 01 දිනට ශේෂය වූ රු.1,193,600 ක මුදල ඉහත අරමුදල්වලට බැර නොකර ශිෂ්‍ය සුභසාධක අරමුදලට බැර කර වසර ගණනාවක් තිස්සේ නිෂ්කාර්යව තිබී 2011 දෙසැම්බර් 31 දින විශ්ව විද්‍යාල අරමුදලට ගෙන තිබුණි.

**මෙම ශිෂ්‍ය සුභසාධන අරමුදල නොගෙවූ ශිෂ්‍යාධාර හා නොගෙවූ මහපොළ ගිණුමේ වූ ශේෂයන් මඟින් ආරම්භ කරන ලද අරමුදලක් වේ. නොගෙවූ ශිෂ්‍යාධාර හා නොගෙවූ මහපොළ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විමසන ලදුව ඒ සඳහා පිළිතුරක් නොලද බැවින් 52.06 මුදල් කමිටු තීරණය පරිදි හා 2011 වර්ෂයට අදාල ගැලපීම් සිදු කිරීමෙන් අනතුරුව ආදායමට ගිණුම්ගත කරන ලදී.**

4.5 ආර්ථික නොවූ ගනුදෙනු

කුලියාපිටිය පරිශ්‍රයේ ශිෂ්‍ය නේවාසිකාගාර 03 ක් බදු ගැනීමේදී පාලක සභාවේ අනුමැතිය මත, තක්සේරු වටිනාකම ඉක්මවා රු.421,000 ක් ගෙවීම් කර තිබුණි.

**තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් අදාළ නිවාස/ගොඩනැගිලි සඳහා ලබා ගත් තක්සේරු වාර්තා වලට අනුකූල වන සේ ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් කර තිබූ මිල ගණන් අඩු කර ගැනීමට උත්සාහ ගත් අතර ඉදිරිපත් කර තිබූ ටෙන්ඩර් වටිනාකමින් යම් ප්‍රමාණයක් අඩු කර ගැනීමට ටෙන්ඩර් කමිටුව සමත් වූ නමුත් අනුමත තක්සේරු වටිනාකම දක්වා මිළ අඩු කිරීමට අදාළ පාර්ශව විසින් එකඟ නොවූ බැවින් ඒ සඳහා පාලක සභාවේ අනුමැතිය ඇතිව ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත වටිනාකම ගෙවීමට කටයුතු කර ඇත.**

4.6 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

නේචර් බයෝටෙක්නොලොජ් (Nature Biotechnology) නමැති සඟරාව මිළදී ගැනීම සඳහා වර්ෂ 2003-2011 දක්වා කාලපරාසය තුළ ගෙවන ලද රු.1,803,968 අත්තිකාරම්වලට අදාල රු.631,413 ක් වටිනා සඟරාද, 2007 වර්ෂයේදී විදේශීය පෞද්ගලික ආයතනයකට සඟරා මිළදී ගැනීම සඳහා ගෙවන ලද රු.363,152ක අත්තිකාරම්වලට අදාල රු.135,690 ක් වටිනා සඟරාද 2012 මාර්තු 31 දින වනවිටත් පුස්තකාලයට ලැබී නොතිබුණි.

**Nature Biotechnology**

**Nature Biotechnology** නැමති සඟරාව මිලදී ගැනීම සඳහා වර්ෂ **2003–2011** දක්වා කාල පරාසය තුළ ගෙවන ලද අත්තිකාරම් වටිනාකම ලෙස රු. **1,803,968/-** ක් ලෙස විගණනය විසින් පෙන්වා දී තිබුණ ද එහි වටිනාකම එකතු කළ විට රු. **1,436,808/-** ක් බව අනාවරණය විය.

විගණන විමසුමට අනුව අත්තිකාරම් වලට අදාලව නොලැබී ගිය සඟරාවල වටිනාකම එම විමසුමෙහි රු. **631,413.00** ක් වශයෙන් සඳහන් වුවත් මේ වන විට එම මුදල රු. **176,818.70** ක් වේ.

මෙම මුදල ගණනය කර ඇති ආකාරය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| **01. 2003/2004** වර්ෂයේ ලබා ගත් අත්තිකාරම් මුදල (සඟරා කලාප **11** ක් සඳහා **2004.07.26** දින ජ'නල් අංක **C – 076** න් අත්තිකාරම් පියවා ඇත.) | රු. **98,830.00** | |
| **02. 2005/2006** වර්ෂයේ ලබා ගත් අත්තිකාරම් මුදල (සියලු සඟරා කලාප ලැබී ඇති බැවින් **2006.09.05** දින ඉන්වෙන්ට්‍රි සේවා සහතික අංක **2753** න් අත්තිකාරම් පියවා ඇත.) | රු. **174,018.00** | |
| **03. 2006/2007** වර්ෂයේ ලබා ගත් අත්තිකාරම් මුදල (සියලු සඟරා කලාප ලැබී ඇති බැවින් **2007.09.14** දින ඉන්වෙන්ට්‍රි සේවා සහතික අංක **3185** න් අත්තිකාරම් පියවා ඇත.) | රු. **214,191.00** | |
| **04. 2008/2009** වර්ෂයේ ලබා ගත් අත්තිකාරම් මුදල | රු. **303,116.00** | |
| (එක් සඟරා කලාපයක වටිනාකම (රු. **25,259.66**) ලැබී ඇති සඟරා කලාපවල (**5**) වටිනාකම) | රු. **126,298.30** | |
| හිඟ මුදල | | රු. **176,818.70** |

05. 2009/2010 වර්ෂය සඳහා 2009.06.12 දින රු. 275,886.00 ක අත්තිකාරම් මුදල් ඉල්ලා ඇතත් ලැබී නොමැත.

(එම අත්තිකාරම් මුදල ලැබී ඇත්තේ 2010 වර්ෂයේ දී බැවින් 2010 සැප්තැම්බර් සිට 2011 අගෝස්තු දක්වා කලාප මෙයට අයත් වේ. සියළු සඟරා ලැබී ඇති බැවින් මෙම අත්තිකාරම් මුදල 2012.03.16 ඉන්වෙන්ට්‍රි සේවා සහතික අංක 6196 න් පියවා ඇත. නොලැබී ගිය සඟරා ලෙස විමසුමේ සඳහන් කර ඇති 2009 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කලාප මෙහිදී අදාල නොවේ.)

| | | |
|---|---|---|
| 06. 2010/2011 වර්ෂයේ ලබා ගත් අත්තිකාරම් මුදල (සියළු සඟරා කලාප ලැබී ඇති බැවින් 2012.09.17 දින ඉන්වෙන්ට්‍රි සේවා සහතික අංක 7452 න් අත්තිකාරම් පියවා ඇත.) | රු. 370,767.00 | |
| | රු.1,436,808.00 | රු. 176,818.70 |

<u>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි - මාකඳුර රු. 363,152.23</u>

ඉහත අත්තිකාරම් මුදල ලබාගෙන ඇත්තේ සඟරා තුනක් සඳහා **Cambridge University Press** ආයතනයෙනි.

| | | |
|---|---|---|
| a) | British Journal of Nutrition | Rs. 146,834.00 |
| b) | Public Health Nutrition | Rs. 126,731.90 |
| c) | Proceedings of the Nutrition | Rs. 89,586.33 |

